ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

ඉදිරි දැක්ම

"ශ්‍රී ලාංකීය ගොවිජන සමාජයේ හා
සියලු කෘෂිකාර්මික ඉඩම්වල තිරසර
සංවර්ධනය"

මෙහෙවර

"ශ්‍රී ලාංකීය ගොවිජන සමාජයේ තිරසර සංවර්ධනය
හා
සියලු කෘෂිකාර්මික ඉඩම්වලින්
ප්‍රශස්ත ඵලදායීතාවයක් ලබා ගත හැකි වන පරිදි
ආයතනික, සහායක, නෛතික හා කළමනාකරණ
සේවාවන් සැකසීම හා කාලානුරූපව
පවත්වා ගෙනයාම"

හැඳින්වීම

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

ශ්‍රී ලාංකීය ගොවි ජනතාවට අවශ්‍ය පහසුකම් සැපයීමේ අරමුණින් 1957 ඔක්තෝබර් 01 වන දින ගොවිජන සේවා දෙපාර්තමේන්තුව ආරම්භ කරන ලද්දේ එතෙක් පැවති ආහාර දෙපාර්තමේන්තුව අහෝසි කරමිනි. 1958 අංක 01 දරණ කුඹුරු ඉඩම් පනතින් බල ගන්වන ලද මෙම දෙපාර්තමේන්තුව මේ වන විට 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත හා එහි සංශෝධනයන් අනුව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව නමින් ක්‍රියාත්මක වේ.

අරමුණු හා ප්‍රධාන කාර්යයන්

01. රජයේ කෘෂිකාර්මික ප්‍රතිපත්තිවලට අනුකූලව කෘෂිකාර්මික ඉඩම් යෙදවීමට අදාළ විධි විධාන සැලැස්වීම.

02. කෘෂිකාර්මික ඉඩම් හිමියන්, කෘෂිකාර්මික ඉඩම් හිමි ගොවීන් සහ භුක්තිකරුවන්/අද ගොවීන්ගේ වගා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වන විධි විධාන ක්‍රියාත්මක කිරීම.

03. ගොවි සංවිධාන ලියාපදිංචි කිරීම සහ පවත්වාගෙන යාම සම්බන්ධ නියෝග සෑදීම සහ එම විධි විධාන ක්‍රියාත්මක වීම තහවුරු කිරීම.

04. ගොවිජන සංවර්ධන සභා ස්ථාපිත කිරීම සහ ඒවායේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා මඟ පෙන්වීම සහ අධීක්ෂණය.

05. දිවයින පුරා පවත්නා සෑම ගොවිජන සංවර්ධන සභා බල ප්‍රදේශයකටම අදාළව කෘෂිකාර්මික ඉඩම් පිළිබඳ තොරතුරු ඇතුළත් කෘෂිකාර්මික ඉඩම් නාම ලේඛන පිළියෙල කර සංශෝධනය හා ප්‍රතිශෝධනය කර පවත්වාගෙන යාම.

06. කෘෂිකාර්මික ඉඩම්වලට අදාළ අඳ ගොවි ගැටලු සහ වෙනත් ගොවි ආරවුල් විසඳීම සඳහා කටයුතු කිරීම.

07. සුළු වාරි කර්මාන්ත සහ ජල ප්‍රභවයන්ගේ ඵලදායීතාවය, ආරක්ෂාව, සංරක්ෂණය සහ කළමනාකරණයට අදාළ වන විධි විධාන ක්‍රියාත්මක කිරීම.

08. ගොවිජන සංවර්ධන පනත හා රජයේ කෘෂිකාර්මික ප්‍රතිපත්ති උල්ලංඝනය කරමින් ක්‍රියාත්මක වන පාර්ශවයන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීම.

09. රජයේ කෘෂිකාර්මික හා කාලීන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේදී වෙනත් ආයතන වෙත අවශ්‍ය වන්නා වූ ආයතනික, නෛතික, සහායක හා කළමනාකරණ සේවාවන් සැලසීම.

ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගෙන්.....

වර්ෂ 1957 ඔක්තෝබර් මස 01 දින ආරම්භ කරන ලද ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, හැට දෙවසරක සාඩම්බර ඉතිහාසයකට උරුමකම් කියනු ලබයි. "ශ්‍රී ලාංකීය ගොවිජන සමාජයේ සහ කෘෂිකාර්මික ඉඩම්වල තිරසර සංවර්ධනය" දැක්ම කරගනිමින් විවිධ කාර්යයන් හා සේවාවන් ඉටුකරමින් සුපෝෂිත ගොවි ජනතාව ඔස්සේ සශ්‍රීක දැයක් නිර්මාණයට මහත් ශ්‍රමයක් දරමින් කටයුතු කරනු ලබයි.

මානව ජන සමාජයේ ප්‍රභවයත් සමඟ ඇරඹී කෘෂිකර්මාන්තය, විවිධ විපර්යාසයන්ට ලක්වෙමින් දේශීය ආහාර අවශ්‍යතාව සපුරා ගැනීමේ පසුබිමක ප්‍රවර්ධනය විය. ඒ අනුව වර්තමාන රජය නව කෘෂිකර්ම ප්‍රතිපත්තිය වඩා ඵලදායී අන්දමින් ක්‍රියාවට නැංවීම මූලික කරගනිමින් විවිධ වූ සංකල්ප හා ක්‍රියාකාරකම් රාශියක් වර්තමානය වන විට ක්‍රියාවට නංවා ඇත.

එකී අභිමතාර්ථයන් සාක්ෂාත් කරගැනීම සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, මෙරට කෘෂිකර්මාන්තයට අදාළ රාජ්‍ය ප්‍රතිපත්තිය හා ගොවිජන නීතිය ක්‍රියාවට නැංවීම, සියලුම කෘෂිකාර්මික ඉඩම් කළමනාකරණය කිරීම, ගොවීන් සඳහා වන ආයතනික ව්‍යුහය සැකසීම හා ශක්තිමත් කිරීම මෙන්ම වාරිමාර්ග හා ජල කළමනාකරණය යන ප්‍රධාන ප්‍රවේශ මාර්ග හතරක් විෂය පථයට ඇතුළත් කරගනිමින් ක්‍රියාත්මක වේ. එමෙන්ම එකී අභිමතාර්ථයන් යථාර්ථයක් බවට පත්කිරීමේ දැවැන්ත අභියෝගයට අද අපි ප්‍රවේශ වී සිටිමු.

2018 වසරේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සිය ඉලක්කයන් වෙත පිය නැඟීමේ පියවරයන් සවිස්තරාත්මකව ඉදිරිපත් කරමින් 2018 කාර්යය සාධන වාර්තාව මෙලෙසින් එළි දක්වයි. මෙම කාර්යය සාර්ථක කර ගැනීමට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය උපදෙස් හා නායකත්වය නොඅඩුව ලබා දුන් ගරු අමාත්‍යතුමන්, නියෝජ්‍ය අමාත්‍යතුමන් හා අමාත්‍යාංශ ලේකම්තුමන් ඉතා ගෞරවයෙන් සිහිපත් කරමි.

එමෙන්ම, 2018 පාලන වාර්තාව එළි දැක්වීමට නන් අයුරින් උපදෙස් හා සහය ලබාදුන් සියල්ලන්ට මාගේ ස්තූතිය පුදකර සිටිමි.

ඩබ්.එම්.එම්.බී.වීරසේකර.
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්.

පටුන

- ❖ පරිපාලන හා මානව සම්පත් සංවර්ධන අංශය. 01
- ❖ සංවර්ධන හා ප්‍රගති පාලන අංශය. 14
- ❖ ඉංජිනේරු අංශය. 21
- ❖ ආයතනික සංවර්ධන අංශය. 25
- ❖ ප්‍රවාහන අංශය. 38
- ❖ නීති අංශය. 41
- ❖ ගිණුම් අංශය. 45
- ❖ අභ්‍යන්තර විගණන අංශය. 48
- ❖ ඵලදා වර්ධන හා අලෙවි අංශය. 50
- ❖ ගොවිජන බැංකු (නියමු) ව්‍යාපෘතිය. 51
- ❖ ජල කළමනාකරණ අංශය. 66
- ❖ මෙහෙයුම් හා ඇගයුම් අංශය. 75
- ❖ තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම 77

සඳහා සමාලෝචිත වර්ෂය තුළ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ඉටුකළ කර්තව්‍යයන්

ඇමුණුම්

- ඇමුණුම 01 83
- ඇමුණුම 02 85
- ඇමුණුම 03 87
- ඇමුණුම 04 89
- ඇමුණුම 05 90
- ඇමුණුම 06 91
- ඇමුණුම 07 99
- ඇමුණුම 08 101
- ඇමුණුම 09 102
- ඇමුණුම 10 104
- ඇමුණුම 11 105
- ඇමුණුම 12 106
- ඇමුණුම 13 108
- ඇමුණුම 14 116
- ඇමුණුම 15 117
- ඇමුණුම 16 118
- ඇමුණුම 17 122
- ඇමුණුම 18 123
- ඇමුණුම 19 125
- ඇමුණුම 20 126
- ඇමුණුම 21 128
- ඇමුණුම 22 129

01. පරිපාලන හා මානව සම්පත් සංවර්ධන අංශය

ශ්‍රී ලාංකීය ගොවිජන සමාජයේ හා සියලු කෘෂිකාර්මික ඉඩම්වල තිරසර සංවර්ධනය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඉදිරි දැක්මයි. එය ඉටු කිරීම සඳහා ශ්‍රී ලාංකීය ගොවිජන සමාජයේ තිරසර සංවර්ධනය හා සියලුම කෘෂිකාර්මික ඉඩම්වලින් ප්‍රශස්ත ඵලදායිතාවයක් ලබා ගත හැකි වන පරිදි ආයතනික, සහායක, නෛතික කළමනාකරණ සේවාවන් සැකසීම හා කාලානුරූපව පවත්වාගෙන යාම අවශ්‍ය වී ඇත.

1.1 ආයතන අංශය

1.1.1 ආයතන අංශයේ කාර්යභාරය

දෙපාර්තමේන්තුමය තනතුරුවලට බඳවා ගැනීම්, අන්තර්ග්‍රහණය කිරීම, අනුයුක්ත කිරීම්, කාර්යක්ෂමතා කඩඉම්, උසස් වීම්, ස්ථාන මාරු, ඉදිරි වැඩසටහන්, අතිකාල හා දින වැටුප්, සමාලෝචන මණ්ඩල පත්කිරීම්, වෘත්තීය සමිති, භාෂා දීමනා හා වැඩ බැලීමේ දීමනා, කාර්ය මණ්ඩල දත්ත පද්ධතිය, නිවාඩු, පෞද්ගලික ලිපිගොනු හා දෙපාර්තමේන්තුවේ සියලුම සේවාවන්ට අදාළව පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම.

1.1.2 දෙපාර්තමේන්තුවේ සේවක සංඛ්‍යාව

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා අනුමත දීප ව්‍යාප්ත, ඒකාබද්ධ හා දෙපාර්තමේන්තුගත තනතුරු ඇතුළුව අනුමත මුළු සේවක සංඛ්‍යාව 18405 කි. 2018 වර්ෂය අවසානය වන විට සේවයේ නිරත වූ සංඛ්‍යාව 14616 කි. පුරප්පාඩු වූ සංඛ්‍යාව 3933 කි.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ හා මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්, අතිරේක ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්, කොමසාරිස් තනතුරු 03 ක් හා දිස්ත්‍රික් කාර්යාලවලට අනුයුක්තව නියෝජ්‍ය කොමසාරිස්/ සහකාර කොමසාරිස් තනතුරු 29 කින් ද සමන්විතව ඇත.

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ 1 වන පන්තියේ තනතුරු 01 ක් හා ඉංජිනේරු සේවයේ තනතුරු 10 ක් ද, ශ්‍රී ලංකා ගණකාධිකාරි 1 වන පන්තියේ තනතුරු 01 ක් හා ගණකාධිකාරි තනතුරු 11 ක් ද ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුරු 01 ක් ද ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ තනතුරු 01 ක් ද දෙපාර්තමේන්තුගත සහකාර කොමසාරිස් තනතුරු 10 ක් ද සහකාර කොමසාරිස් (යාන්ත්‍රික) තනතුරු 2 කින් ද සමන්විත වේ.

තෘතීය මට්ටමේ තනතුරු 643 ක් අනුමත වී ඇති අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විට පුරප්පාඩු සංඛ්‍යාව 129 ක් විය.

ද්විතීය මට්ටමේ තනතුරු 16065 ක් අනුමත වී ඇති අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විට පුරප්පාඩු සංඛ්‍යාව 3083 ක් විය.

ප්‍රාථමික මට්ටමේ තනතුරු 1572 ක් අනුමත වී ඇති අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විට පුරප්පාඩු සංඛ්‍යාව 697 ක් විය.

1.1.3 කාර්ය මණ්ඩල සංවිධාන ව්‍යුහය

අනුමත සේවක කාර්ය මණ්ඩලය තුළ පුරප්පාඩු සම්පූර්ණ කර සේවා නියුක්තිය වැඩි කර ගැනීමටත්, ඒ තුළින් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය, ඵලදායීතාවය හා කාර්යක්ෂමතාවය ඉහළ නංවමින් සම්පත් දායකත්වය වැඩි කර ගැනීමටත්, මෙම වර්ෂය තුළ කටයුතු කර ඇත. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධානී ලෙස ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්, දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය කාර්යසාධන මට්ටම ප්‍රශස්ථ මට්ටමින් පවත්වා ගැනීමට වගකියන අතරම, වගකීම් ශක්තිමත් කිරීම සඳහා තමන් යටතේ සේවය කරන විවිධ මට්ටම්වල නිලධාරීන් හට වගකීම් පවරා ඇත.

දෙපාර්තමේන්තුවේ අරමුණු හා අභිමතාර්ථ වර්ධනය කර ගැනීම සඳහා කැප වූ සමාලෝචිත වර්ෂය අවසානය වන විට සේවයේ නිරත වී සිටි දෙපාර්තමේන්තුවට අනුමත විවිධ තනතුරුවල සේවක සංඛ්‍යාව එක් එක් තනතුරු ආශ්‍රිතව පහත සඳහන් පරිදි වර්ගීකරණය කළ හැකිය.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
සේවක සංඛ්‍යා තොරතුරු 2018.12.31 දිනට

අනු අංකය	තනතුර	සේවාව/ශ්‍රේණිය	අනුමත සංඛ්‍යාව	සිටින සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම					
1	ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්	ශ්‍රී.ලං.ප.සේ.(විශේෂ)	1	1	0
2	ගොවිජන සංවර්ධන අතිරේක කොමසාරිස් ජනරාල්	ශ්‍රී.ලං.ප.සේ.(විශේෂ)	1	1	0
3	ගොවිජන සංවර්ධන කොමසාරිස්	ශ්‍රී.ලං.ප.සේ. –I	3	3	0
4	ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්	ශ්‍රී.ලං.ප.සේ. –II	43	2	14
5	ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්	ශ්‍රී.ලං.ප.සේ.- III		27	
6	අධ්‍යක්ෂ (ඉංජිනේරු)	ශ්‍රී.ලං.ඉ.සේ I	1	1	0
7	ඉංජිනේරු	ශ්‍රී.ලං.ඉ.සේ -III,II	12	10	2
8	ඉංජිනේරු (යාන්ත්‍රික)	ශ්‍රී.ලං.ඉ.සේ -III,II	1	0	1
9	ප්‍රධාන ගණකාධිකාරී	ශ්‍රී.ලං.ග.සේ -I	1	1	0
10	ගණකාධිකාරී	ශ්‍රී.ලං.ග.සේ -III,II	29	12	17
11	අභ්‍යන්තර විගණක	ශ්‍රී.ලං.ග.සේ -I	1	1	0
12	සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)	ශ්‍රී.ලං.ක්‍ර.සම්.සේ- III,II	1	1	0
13	නියෝජ්‍ය/සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තු)	දෙපාර්තමේන්තු- III,II	28	10	18
14	නීති නිලධාරී	දෙපාර්තමේන්තු -III,II	1	0	1
15	සහකාර කොමසාරිස් (යාන්ත්‍රික)	දෙපාර්තමේන්තු-විශේෂ	2	2	0
එකතුව			**125**	**72**	**53**

අනු අංකය	තනතුර	සේවාව/ශ්‍රේණිය	අනුමත සංඛ්‍යාව	සිටින සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
තෘතීය මට්ටම					
16	ගොවිජන සංවර්ධන නිලධාරී (විශේෂ)	දෙපාර්තමේන්තු-අධි	30	0	30
17	පරිපාලන නිලධාරි	රා.ක.ස.සේ-අධි	31	9	22
18	තාක්ෂණ නිලධාරී (විශේෂ)	ශ්‍රී.ලං.තා.සේ -විශේෂ	22	4	18
19	ගොවිජන සංවර්ධන නිලධාරී - I/II	දෙපාර්තමේන්තු- III,II,I	557	500	57
20	තොරතුරු හා සංනිවේදන තාක්ෂණ නිලධාරී	ශ්‍රී.ලං.තො.තා.සේ.	1	0	1
21	භාෂා පරිවර්තක	භාෂා පරිවර්තක සේවය- II,I	2	1	1
එකතුව			643	514	129
ද්විතීය මට්ටම					
22	නීති සහකාර	සං.නි.සේ-දෙපාර්තමේන්තු- III,II,I	247	13	53
23	ගොවිජන බැංකු ව්‍යාපෘති සහකාර	සං.නි.සේ-දෙපාර්තමේන්තු- III,II,I		31	
24	සංවර්ධන සහකාර	සං.නි.සේ-දෙපාර්තමේන්තු- III,II,I		110	
25	කෘෂි නිෂ්පාදන ව්‍යාපෘති සහකාර	සං.නි.සේ-දෙපාර්තමේන්තු- III,II,I		40	
26	සංවර්ධන නිලධාරී	සං.නි.සේවය -III,II,I	2500	2022	478
27	උපාධිධාරී අභ්‍යාසලාභී සංවර්ධන නිලධාරි			144	
28	ගොවිජන බැංකු නිලධාරී	දෙපාර්තමේන්තු	559	0	559
29	සහකාර ගොවිජන බැංකු නිලධාරී	දෙපාර්තමේන්තු	559	0	559
30	තාක්ෂණ සහායක	ශ්‍රී.ලං.තා.සේ	17	0	17
31	කාර්මික නිලධාරී - I/II/III	ශ්‍රී.ලං.තා.සේ--III,II,I	105	85	20
32	සැලසුම් ශිල්පි	ශ්‍රී.ලං.තා.සේ -III,II,I	1	1	0
33	පුස්තකාලයාධිපති	පුස්තකාලාධිපති සේවය- III,II,I	1	0	1
34	රාජ්‍ය කළමනාකරණ සහකාර - I/II/III	රා.ක.ස.සේ- III,II,I	538	471	67
35	ගොවිජන සේවා මධ්‍යස්ථාන ලිපිකරු - I/II/III	දෙපාර්තමේන්තු- III,II,I	1118	867	251
36	කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර I/II	දෙපාර්තමේන්තු- III,II,I	10400	9367	1033
37	ක්ෂේත්‍ර සහකාර	දෙපාර්තමේන්තු- III,II,I	2	0	2
38	ලඝු/යතුරු ලේඛක	දෙපාර්තමේන්තු- III,II,I	15	4	11

අනු අංකය	තනතුර	සේවාව/ශ්‍රේණිය	අනුමත සංඛ්‍යාව	සිටින සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
39	තොරතුරු සන්නිවේදන තාක්ෂණ සහකාර	ශ්‍රී.ලං.තො.තා.සේ.-3 පංතියේ - III,II,I	3	0	3
එකතුව			**16065**	**13155**	**3054**
ප්‍රාථමික මට්ටම					
40	රියදුරු - I/II/III	රියදුරු සේවය-III,II,I	111	90	21
41	යන්ත්‍ර කාර්මික	දෙපාර්තමේන්තු-III,II,I	8	0	8
42	යන්ත්‍ර ක්‍රියාකරු	දෙපාර්තමේන්තු -III,II,I විශේෂ	36	34	2
43	රිය සහායක	දෙපාර්තමේන්තු-III,II,I	21	5	16
44	කාර්යාල කාර්ය සහායක - I/II/III	කා.සේ.සේ-III,II,I	110	86	24
45	සංචාරක බංගලා භාරකරු	දෙපාර්තමේන්තු-III,II,I	7	3	4
46	කම්කරු	දෙපාර්තමේන්තු	559	349	210
47	මුරකරු	දෙපාර්තමේන්තු	671	291	380
48	යන්ත්‍ර සහායක	දෙපාර්තමේන්තු -III,II,I විශේෂ	32	14	18
49	නුපුහුණු කම්කරු	දෙපාර්තමේන්තු	17	3	14
එකතුව			**1572**	**875**	**697**

1.1.4 ආයතන කටයුතු

(I) 2018 වර්ෂය තුළ දීප ව්‍යාප්ත සේවාවල නිලධාරීන්ගේ විචලනතා පහත පරිදි වේ.

අනු අංකය	සේවය	ස්ථාන මාරු වී ගිය නිලධාරීන් සංඛ්‍යාව	ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන් සංඛ්‍යාව
01	ශ්‍රී ලංකා පරිපාලන සේවය III	01	02
02	ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය I/ III	02	01
03	ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය III	01	01
එකතුව		**04**	**04**

(II) නව බඳවා ගැනීම්.

සමාලෝචිත වර්ෂය තුළ මෙම දෙපාර්තමේන්තුවට නව පත්වීම් ලබා පැමිණි ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ඉංජිනේරු සේවයේ හා ගණකාධිකාරී සේවයේ නිලධාරීන් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

අනු අංකය	නිලධාරියාගේ නම	සේවය	අනුයුක්ත දිනය
1	ඒ.සී. කරුණාතිලක මිය	ශ්‍රී.ලං.ප.සේ III	2018.02.23
2	ජේ.කේ. ජයනන්ද මයා	ශ්‍රී.ලං.ප.සේ III	2018.02.23
3	එස්. වරුණි මිය	ශ්‍රී.ලං.ප.සේ III	2018.03.28
4	පී.ජී.සී.එස්. ආරියරත්න මිය	ශ්‍රී.ලං.ඉ.සේ III	2018.08.01
5	එම්. තිවාස්කර් මයා	ශ්‍රී.ලං.ඉ.සේ III	2018.08.20
6	ඒ.බී.ඩී.ටී. නන්දරත්න මයා	ශ්‍රී.ලං.ඉ.සේ III	2018.08.20

(III) නව පත්වීම් හා ස්ථිර කිරීම

ගොවිජන සංවර්ධන නිලධාරී බඳවා ගැනීමේ විවෘත තරග විභාගයේ ප්‍රතිඵල මත නිලධාරීන් 63 ක් ද, කාර්මික නිලධාරී තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගයේ ප්‍රතිඵල මත නිලධාරීන් 30 ක් ද, කම්කරු බඳවා ගැනීමේ විවෘත සම්මුඛ පරීක්ෂණයෙන් කම්කරු තනතුරු 128 ක් ද, මුරකරු බඳවා ගැනීමේ විවෘත සම්මුඛ පරීක්ෂණයෙන් මුරකරු තනතුරු 277 ක් ද බඳවාගෙන ඇත. රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය මඟින් උපාධිධාරී අභ්‍යාසලාභීන් ලෙස බඳවා ගත් නිලධාරීන් අතුරෙන් 140 දෙනෙකු ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කළ අතර, රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් 77 දෙනෙකු දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කරන ලදී.

(IV) තනතුර අතහැර යාම, ඉල්ලා අස්වීම, මිය යාම්, වැඩ තහනම් කිරීම

සමාලෝචිත වර්ෂය තුළ සිදු වූ වෙනස්කම් පහත පරිදි වේ.

අනු අංකය	තනතුර	සේවය හැර යාම	ඉල්ලා අස්වීම	මියයාම්	මුදාහැරීම	වැඩ තහනම්
01	නියෝජ්‍ය/සහකාර කොමසාරිස්	-	-	-	02	-
02	රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය	-	02	-	01	-
03	කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර	14	09	15	24	17
04	ගොවිජන සේවා මධ්‍යස්ථාන ලිපිකරු	-	02	-	06	-
05	ගොවිජන සංවර්ධන නිලධාරී	-	-	-	-	-
06	සංවර්ධන නිලධාරී(දෙපාර්තමේන්තු)	-	01	-	01	-
07	සංවර්ධන නිලධාරී	-	02	-	13	-
08	රියදුරු			01		
09	කාර්යාල කාර්ය සහයක	-	01	-	03	-
එකතුව		**14**	**17**	**16**	**50**	**17**

(V) ස්ථාන මාරුවීම්

දීපව්‍යාප්ත සේවාවන් හැරුණු විට ඒකාබද්ධ සේවාවල නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

අනු අංකය	තනතුර	ස්ථාන මාරු වී ගිය සංඛ්‍යාව	පැමිණි සංඛ්‍යාව
1	රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය	16	15
2	රියදුරු සේවය	8	7
3	සංවර්ධන නිලධාරී	34	34
4	කාර්යාල සේවක සේවය	08	06
එකතුව		**66**	**62**

(V1) විශ්‍රාම ගැනීම්

සමාලෝචිත වර්ෂය තුළ විශ්‍රාම ගැනීම පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

අනු අංකය	තනතුර	විශ්‍රාම ගිය සංඛ්‍යාව	
		වි.වැ.2.17 වගන්තියෙන්	**වි.වැ.2.12 වගන්තියෙන්**
1	සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තු)	04	-
2	ගොවිජන සංවර්ධන නිලධාරී	03	-
3	රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය	08	-
4	රියදුරු සේවය	03	-
5	කාර්යාල සේවක සේවය	04	-
6	ගොවිජන සේවා මධ්‍යස්ථාන ලිපිකරු	20	-
7	සංවර්ධන නිලධාරී(දෙපාර්තමේන්තු)	01	-
8	කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර	09	03
9	කාර්මික නිලධාරී	07	-
10	දිස්ත්‍රික් තාක්ෂණ නිලධාරී	01	-
11	රිය සහායක	01	-
එකතුව		**61**	**03**

1.1.5. විදේශ සංචාර හා පුහුණු

සමාලෝචිත වර්ෂය තුළ දී විදේශ ශිෂ්‍යත්ව, සම්මේලන හා වැඩමුළුවලට සහභාගිවීම පහත පරිදි වේ.

1. 2018.04.22 දින සිට 2018.04.29 දින දක්වා මැලේසියාවේ පවත්වන ලද (“රාජ්‍ය අංශ අභ්‍යන්තර විගණකවරුන් සඳහා කළමනාකරණ විගණනය පිළිබඳ ජාත්‍යන්තර වැඩසටහන”) පුහුණු වැඩමුළුවට ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත ප්‍රධාන අභ්‍යන්තර විගණක, රේණුකා කොළඹගේ මිය සහභාගි වීම.
2. 2018.05.15 දින සිට 2018.06.04 දින දක්වා චීනයේ පවත්වන ලද (“එක් තීරයක් - එක් මාවතක්’මුලපිරීම යටතේ රටවල් සඳහා ජල සම්පත් කළමනාකරණය සහ සුළු පරිමාණ ජල විදුලිබල සංවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණය 2018”) පුහුණු වැඩමුළුවට පුත්තලම, රාජකදළුව ගොවිජන සංවර්ධන නිලධාරී ආර්.එම්.ඩී.එස්. රාජපක්ෂ මහතා සහභාගි වීම.
3. 2018.06.04 දින සිට 2018.06.08 දින දක්වා තායිලන්තයේ පවත්වන ලද (“කෘෂිකර්මාන්තය සඳහා ද්‍රෝන යානා, චන්ද්‍රිකා ඡායාරූප සහ භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) භාවිතය

පිළිබඳ කලාපීය පුහුණුව") පුහුණු වැඩමුළුව සඳහා ප්‍රධාන කාර්යාලයේ ඉංජිනේරු ඩී.ඩී. ප්‍රභාත් විතාරණ මහතා සහභාගි වීම.

4. 2018.06.08 දින සිට 2018.06.21 දින දක්වා චීනයේ පවත්වන ලද ("අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංගමයේ (ASEAN) නිලධාරීන් සඳහා පරිසර හිතකාමී කෘෂිකර්මාන්තය සහ පශු සම්පත් හැකියාව වැඩි දියුණු කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය 2018") වැඩමුළුව සඳහා එස්.වයි.ඩී.ඒ. සෝමවංශ මහතා සහභාගි වීම.

5. 2018.08.02 දින සිට 2018.08.22 දින දක්වා චීනයේ පවත්වන ලද ("සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා කෘෂිකාර්මික නිෂ්පාදන සැකසුම් හා වෙළඳාම පිළිබඳ සම්මන්ත්‍රණය 2018") වැඩමුළුවට පොතුවිල් ගොවිජන සංවර්ධන නිලධාරි එම්.එල්.ඒ. රහීම් මහතා සහභාගි වීම.

6. 2018.08.08 දින සිට 2018.08.28 දින දක්වා චීනයේ පවත්වන ලද ("සංවර්ධනය වෙමින් පවතින රටවල ආනයන හා අපනයන, සත්ව හා ශාක නිරෝධායන නිලධාරීන් පිළිබඳ සම්මන්ත්‍රණය 2018") වැඩසටහන සඳහා පහත සඳහන් නිලධාරීන් සහභාගි වීම.
    a. මහනුවර ඉංජිනේරු සහකාර - එම්.ජී.එන්.තිලකසිරි මයා.
    b. හලාවත නියෝජ්‍ය කොමසාරිස් - ඩබ්.එම්.එන්.පී. බුද්ධදාස මයා.
    c. මුන්නේෂ්වරම් ගොවිජන සංවර්ධන නිලධාරි - ජී.පී.කේ. ගුණරත්න මයා.
    d. ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත ගණකාධිකාරි - කේ.ජී.එස්. මධුවන්ති මෙය.
    e. ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත සහකාර අධ්‍යක්ෂක (සැලසුම්) - එල්.බී.බුද්ධිකා සුජානි මීය.

7. 2018.08.14 දින සිට 2018.08.22 දින දක්වා ඊශ්‍රායලයේ පවත්වන ලද ("කෘෂිකාර්මික අංශ නවීකරණ ව්‍යාපෘතිය- ASMP ") සඳහා අතිරේක කොමසාරිස් ජනරාල් එස්.ඩී.කේ.ප්‍රනාන්දු මහතා සහභාගි වීම.

8. 2018.08.21 දින සිට 2018.09.10 දින දක්වා චීනයේ පවත්වන ලද ("එක් තීරයක් - එක් මාවතක්'යටතේ සත්ව නිෂ්පාදන වෙළඳාම සහ වසංගත වැළැක්වීම සහ පාලනය කිරීම සඳහා වන සහයෝගිතාව පිළිබඳ සම්මන්ත්‍රණය 2018") වැඩසටහන සඳහා පහත සඳහන් නිලධාරීන් සහභාගි වීම.
    a. පුත්තලම ගොවිජන සංවර්ධන නිලධාරි - ඩී.එම්.ආර්.බී. දිසානායක මයා.
    b. ගම්පහ ගොවිජන සංවර්ධන නිලධාරි - ජේ. එච්. කස්තුරිආරච්චි මයා.

9. 2018.08.23 දින සිට 2018.09.12 දින දක්වා චීනයේ පවත්වන ලද ("සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ජෛව ස්කන්ධ ශක්තිය වැඩි දියුණු කිරීම හා උපයෝගී කර ගැනීම පිළිබඳ සම්මන්ත්‍රණය") පුහුණු වැඩසටහන සඳහා පහත සඳහන් නිලධාරීන් සහභාගි වීම.
    a. අනුරාධපුරය ගොවිජන සංවර්ධන නිලධාරි - එච්.කේ.ජේ. බණ්ඩාර මයා.
    b. උඩුබද්දාව ගොවිජන සංවර්ධන නිලධාරි - ඩබ්.ආර්.ඒ. කරුණාසිරි මයා.

10. 2018.08.30 දින සිට 2018.09.12 දින දක්වා කොරියාවේ පවත්වන ලද ("තිරසර ග්‍රාමීය සංවර්ධනය - SRD") පුහුණු වැඩමුළුවට ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත සහකාර කොමසාරිස් (ගොවි බැංකු) එස්.එම්.පී.කේ. වීරසේකර මැණිකේ මිය සහභාගි වීම.

11. 2018.09.07 දින සිට 2018.09.27 දින දක්වා චීනයේ පවත්වන ලද ("සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ජෛව - ස්වාභාවික වායු පිළිබඳ සම්මන්ත්‍රණය 2018") වැඩසටහන සඳහා පහත සඳහන් නිලධාරීන් සහභාගි වීම.
    a. කුරුණෑගල ගොවිජන සංවර්ධන නිලධාරි - ඊ.එම්.එල්.කේ. ඒකනායක මයා.
    b. ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත සහකාර කොමසාරිස් (නීති)- එච්.එම්.එරංග අතපත්තු මයා.

12. 2018.09.11 දින සිට 2018.09.23 දින දක්වා චීනයේ පවත්වන ලද (“ලෝක ආහාර සංවිධානය (FAO) - චීන දකුණු සහයෝගීතා (SSC) වැඩසටහන යටතේ ගෝලීය වශයෙන් වැදගත් කෘෂිකාර්මික උරුම පද්ධතිය (GIAHS) දෙවන අදියර සඳහා සංවර්ධන වැඩමුළුව”) පුහුණු වැඩමුළුව සඳහා ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත ඉංජිනේරු ඩී.ඩී. ප්‍රභාත් විතාරණ මහතා සහභාගි වීම.

13. 2018.09.12 දින සිට 2018.09.18 දින දක්වා චීනයේ පවත්වන ලද (“සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ආහාර සුරක්ෂිතතාව පිළිබඳ අමාත්‍යාංශීය සම්මන්ත්‍රණය2018”) පුහුණු වැඩසටහන සඳහා ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් ඩබ්.එම්.එම්.බී. වීරසේකර මහතා සහභාගි වීම.

14. 2018.09.23 දින සිට 2018.09.30 දින දක්වා ඇමෙරිකා එක්සත් ජනපදයේ පවත්වන ලද (“සුළු හා මධ්‍ය පරිමාණ වැව් සංවර්ධන වැඩසටහන යටතේ ජලජ වල්පැලෑටි අස්වනු නෙලීමේ නිෂ්පාදන පරීක්ෂාව සඳහා ඇමරිකා එක්සත් ජනපදයේ නිල සංචාරය”)පුහුණු වැඩසටහන සඳහා ප්‍රධාන කාර්යාලයේ සහකාර කොමසාරිස් (යාන්ත්‍රික) පී.ඒ. ආනන්ද වීරවංශ මහතා සහභාගි වීම.

15. 2018.09.24 දින සිට 2018.09.29 දින දක්වා ඉන්දියාවේ පවත්වන ලද 2015/2016 (“කාර්යාල කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව”) සඳහා පහත සඳහන් නිලධාරීන් සහභාගි වීම.
    a. රත්නපුරය පරිපාලන නිලධාරි - ආර්.ආර්. එස්. කල්‍යාණී මිය.
    b. කෑගල්ල පරිපාලන නිලධාරි - පී.ඒ.ඊ.අයි. පණ්ඩිතරත්න මිය.

16. 2018.10.10 දින සිට 2018.10.17 දින දක්වා පකිස්ථානයේ පවත්වන ලද (“ආපදා අවදානම් අවම කිරීම සහ කළමනාකරණය” පුහුණු වැඩසටහන සඳහා කෑගල්ල සහකාර කොමසාරිස් කේ.ඒ.එස්. සුමිත් චන්දන මහතා සහභාගි වීම.

17. 2018.10.21 දින සිට 2018.10.27 දින දක්වා ෆිජි හි පවත්වන ලද (“පරිසර සංචාරක ව්‍යාපාරය හා කෘෂි සංචාරක ව්‍යාපාරය පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම”) පුහුණු වැඩසටහන සඳහා ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් ඩබ්.එම්.එම්.බී. වීරසේකර මහතා සහභාගි වීම.

18. 2018.10.28 දින සිට 2018.11.03 දින දක්වා තායිවානයේ පවත්වන ලද (“කෘෂි ව්‍යාපාර සහ වටිනාකම් දාම කළමනාකරණය”) පුහුණු වැඩසටහන සඳහා කොමසාරිස් (සංවර්ධන) ඒ.එච්.එම්.එල්. අබේරත්න මහතා සහභාගි වීම.

19. 2018.12.11 දින සිට 2018.12.20 දින දක්වා පකිස්ථානයේ පවත්වන ලද (“වාරිමාර්ග පද්ධතිය සහ ජල කළමනාකරණය”) පුහුණු වැඩමුළුව සඳහා පහත සඳහන් නිලධාරීන් සහභාගි වීම.
    a. පොතුහැර ගොවිජන සංවර්ධන නිලධාරි - ඊ.ජය ශ්‍රී එදිරිසිංහ මහතා.
    b. ප්‍රධාන කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු සහකාර - ඒ.ඉසෙඩ්.ජේ. සිංගරායර් මහතා.

1.1.6. විනය කටයුතු

සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ ආරම්භ කර ඇති මූලික විමර්ශන සංඛ්‍යාව 38 කි. විධිමත් විනය පරීක්ෂණ ගණන 10 කි. විනය නියෝග 12 ක් ද, චෝදනා පත්‍ර 07 ක් ද නිකුත් කර ඇත.

1.1.7. පුහුණු හා හැකියා වර්ධන

සමාලෝචිත වර්ෂය තුළ දී පුහුණු හා හැකියා වර්ධන වැය ශීර්ෂය යටතේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ කුසලතා, ආකල්ප හා දැනුම වර්ධනය කිරීම සඳහා වර්ෂය අවසාන වන විට රු. මි.4.03 ක මුදලක් වැය කර තිබුණි.

අනු අංකය	පුහුණුව ලද නිලධාරියාගේ /නිලධාරීන් ගේ නම	තනතුර	පුහුණු පාඨමාලාවේ නම	පුහුණු ආයතනයේ නම	දින ගණන / කාල සීමාව
1	පී.කේ. පත්බේරිය	සහකාර කොමසාරිස්	පශ්චාත් උපාධි(Master of Financial Economic Degree Program 2018)	කොළඹ විශ්ව විද්‍යාලය	අවුරුදු 1
2	වී.පී. පීටර්ස්	සහකාර කොමසාරිස්	පශ්චාත් උපාධි(Master of Financial Economic Degree Program 2018)	කොළඹ විශ්ව විද්‍යාලය	අවුරුදු 1
3	ජී.ඒ. ඩී. පී. විජේරත්න	ගණකාධිකාරී	පශ්චාත් උපාධි(Master of Financial Economic Degree Program 2018)	කොළඹ විශ්ව විද්‍යාලය	අවුරුදු 1
4	ජී.ටී.ඊ.දිල්රුක්ෂි	ගණකාධිකාරී (කළුතර)	පශ්චාත් උපාධි (Master of Financial Economic Degree Program 2018)	කොළඹ විශ්ව විද්‍යාලය	අවුරුදු 1
5	බී.ඒල්.ඒස්.ඩි. පෙරේරා	කාර්මික නිලධාරි	Training Programme on Waste Water Collection, Treatment, Disposal, Reuse And Storm Water Drainage	නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය	දින 4 යි
6	ඒම්. ඒච්. වී. ඒච්.ඒල්. සමරජීව	කාර්මික නිලධාරි	Training Programme on Waste Water Collection, Treatment, Disposal, Reuse And Storm Water Drainage	නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය	දින 4 යි
7	වී.නවිෂ්නි	කාර්මික නිලධාරි	Microsoft Project	නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය	පැය 56
8	කේ.ජී.එස්.මධුවන්ති	ගණකාධිකාරී	MPM Degree	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	
9	ඒ.එම්.ජී.කේ. උපසිරි	නීති සහකාර	Diploma in English	මිලෝදා ආයතනය	
10	ජේ.එස්. එදිරිසිංහ	ගො.සං.නි.- පොතුහැර	පශ්චාත් උපාධි පාඨමාලාව	කැළණිය විශ්ව විද්‍යාලය	අවුරුදු 1
11	එච්.එම්.ඩී.ඩබ්.කේ. හේරත්	ගො.සං. නිලධාරි (මහනුවර)	ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව	කැළණිය විශ්ව විද්‍යාලය	
12	-	ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන්	ධනාත්මක ආකල්ප වර්ධනය මඟින් මානව සම්පත් සංවර්ධනය පිළිබඳ වැඩමුළුව	ප්‍රධාන කාර්යාලය	2018.02.01
13	-	විනිශ්චය සභා ලේකම්වරු	ගොවිජන විනිශ්චය සභා නීති පුහුණු වැඩමුළුව	ප්‍රධාන කාර්යාලය	2018.01.16
14	-	ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන්	ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ඵලදායීතා පුහුණු වැඩමුළුව	ප්‍රධාන කාර්යාලය	2018.03.29
15	-	ගොවිජන විනිශ්චය සභා නිලධාරීන්	ගොවිජන විනිශ්චය සභා නිලධාරීන් සහ ගො.සං.නි සඳහා වන නීති පුහුණු වැඩමුළුව	පොතුහැර, ගොවිජන සංවර්ධන ජාතික පුහුණු ආයතනය	2018.05.17 හා 18
16	-		ගො.සං. පනතේ (2000 අංක 46) 35 (1) වගන්තිය යටතේ කරණු ලබන විනිශ්චය සම්බන්ධ වැඩමුළුව	ප්‍රධාන කාර්යාලය	2018.05.10
17	-	දෙපාර්තමේන්තු නවක රා.ක.ස. හා සං.නි. (180)	ආයතන කටයුතු හා කාර්යාල කළමණාකරණය පිළිබඳ එක්දින පුහුණු වැඩමුළුව	ප්‍රධාන කාර්යාලය	2018.06.21

අනු අංකය	පුහුණුව ලද නිලධාරියාගේ/ නිලධාරීන්ගේ නම	තනතුර	පුහුණු පාඨමාලාවේ නම	පුහුණු ආයතනයේ නම	දින ගණන / කාල සීමාව
18	-	නවක කාර්මික නිලධාරීන්(28)	ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී III ශ්‍රේණියේ නිලධාරීන්ගේ සේවාරම්භක පුහුණු වැඩමුළුව (1 වන කණ්ඩායම)	පොතුහැර, ගොවිජන සංවර්ධන ජාතික පුහුණු ආයතනය	2018.07.10 සිට 20 දක්වා
19	-	නවක කාර්මික නිලධාරීන්(13)	ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී III ශ්‍රේණියේ නිලධාරීන්ගේ සේවාරම්භක පුහුණු වැඩමුළුව (2 වන කණ්ඩායම)	පොතුහැර, ගොවිජන සංවර්ධන ජාතික පුහුණු ආයතනය	2018.10.22 සිට 30 දක්වා
20	-	නවක ගොවිජන සංවර්ධන නිලධාරීන්(45)	නවක ගොවිජන සංවර්ධන නිලධාරීන්ගේ නේවාසික සේවාරම්භක පුහුණු වැඩමුළුව (1 වන කණ්ඩායම)	පොතුහැර, ගොවිජන සංවර්ධන ජාතික පුහුණු ආයතනය	2018.11.26 සිට 12.01 දක්වා
21	-	අභ්‍යන්තර විගණන නිලධාරීන්(35)	අභ්‍යන්තර විගණන නිලධාරීන් සඳහා වන නේවාසික පුහුණු වැඩමුළුව	පොතුහැර, ගොවිජන සංවර්ධන ජාතික පුහුණු ආයතනය	2018.12.03 සිට 07 දක්වා
22	-	නවක ගොවිජන සංවර්ධන නිලධාරීන්(17)	නවක ගොවිජන සංවර්ධන නිලධාරීන්ගේ නේවාසික සේවාරම්භක පුහුණු වැඩමුළුව (2 වන කණ්ඩායම)	පොතුහැර, ගොවිජන සංවර්ධන ජාතික පුහුණු ආයතනය	2018.12.17 සිට 21 දක්වා

පුහුණු වැඩසටහන් සඳහා පහත දක්වා ඇති පරිදි ඒ ඒ දිස්ත්‍රික් කාර්යාලවලට පුහුණු හා හැකියා වර්ධන වැය ශීර්ෂය යටතේ රු.මී.0.13ක ප්‍රතිපාදනයක් ලබා දී තිබුණි.

අනු අංකය	නිලධාරියාගේ නම	තනතුර	ප්‍රතිපාදන මුදාහළ දිස්ත්‍රික්කය	පුහුණුවේ නම
1	එච්.එම්.ඩී.ඩබ්.කේ. හේරත්	සංවර්ධන නිලධාරි (දිස්.කා.)	මහනුවර	ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව
2	එස්.බී. සුනිල් ශ්‍රීයානන්ද	සංවර්ධන නිලධාරි (දිස්.කා.)	මොණරාගල	ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව
3	එස්.ඩී.එන්. සමරතුංග	සංවර්ධන නිලධාරි (දිස්.කා.)	මහනුවර	ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව

1.1.8. සාකච්ඡා

සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන්, දිස්ත්‍රික් භාර නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරුන් හා දිස්ත්‍රික් භාර නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පැවැත් වූ සාකච්ඡා පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

අනු අංකය	සාකච්ඡා වර්ගය	සහභාගි වූවන්	පැවැත් වූ දිනය	පැවැත් වූ ස්ථානය	සහභාගි වූ සංඛ්‍යාව
1	නියෝජ්‍ය/සහකාර කොමසාරිස් සාකච්ඡාව	දිස්ත්‍රික් භාර නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන්, ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්, ගණකාධිකාරිවරුන් හා ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන්	2018.02.27	ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරය	120
2	නියෝජ්‍ය/සහකාර කොමසාරිස් සාකච්ඡාව	දිස්ත්‍රික් භාර නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන්, ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්, ගණකාධිකාරිවරුන්, දිස්ත්‍රික් තාක්ෂණ නිලධාරීන් හා ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන්	2018.04.24	ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරය	120
3	නියෝජ්‍ය/සහකාර කොමසාරිස් සාකච්ඡාව	දිස්ත්‍රික් භාර නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන්, දෙපාර්තමේන්තුගත සහකාර කොමසාරිස්වරුන්, ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්, ගණකාධිකාරවරුන් හා ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන්	2018.06.22 හා 23	පොතුහැර, ගොවිජන සංවර්ධන ජාතික පුහුණු ආයතනය	120
4	නියෝජ්‍ය/සහකාර කොමසාරිස් සාකච්ඡාව	දිස්ත්‍රික් භාර නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන්, දෙපාර්තමේන්තුගත සහකාර කොමසාරිස්වරුන්, ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්, මූලස්ථාන ගොවිජන සංවර්ධන නිලධාරීන්, දිස්ත්‍රික් තාක්ෂණ නිලධාරීන්, ඉංජිනේරු සහකාර, තාක්ෂණ නිලධාරීන් හා ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන්	2018.07.24	ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරය	175
5	නියෝජ්‍ය/සහකාර කොමසාරිස් සාකච්ඡාව	දිස්ත්‍රික් භාර නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන්, ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්, දිස්ත්‍රික් තාක්ෂණ නිලධාරීන් හා ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන්	2018.08.16	ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරය	100
6	නියෝජ්‍ය/සහකාර කොමසාරිස් සාකච්ඡාව	දිස්ත්‍රික් භාර නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන්, දෙපාර්තමේන්තුගත සහකාර කොමසාරිස්වරුන්, ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්, ගණකාධිකාරිවරුන්, දිස්ත්‍රික් තාක්ෂණ නිලධාරීන් හා ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන්	2018.09.07 හා 08	පොතුහැර, ගොවිජන සංවර්ධන ජාතික පුහුණු ආයතනය	120
7	නියෝජ්‍ය/සහකාර කොමසාරිස් සාකච්ඡාව	දිස්ත්‍රික් භාර නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් හා ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන්	2018.10.04	ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරය	90
8	නියෝජ්‍ය/සහකාර කොමසාරිස් සාකච්ඡාව	දිස්ත්‍රික් භාර නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන්, දෙපාර්තමේන්තුගත සහකාර කොමසාරිස්වරුන්, ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්, ගණකාධිකාරිවරුන් හා ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන්	2018.11.16 හා 17	පොතුහැර, ගොවිජන සංවර්ධන ජාතික පුහුණු ආයතනය	110
9	නියෝජ්‍ය/සහකාර කොමසාරිස් සාකච්ඡාව	දිස්ත්‍රික් භාර නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන්, ගණකාධිකාරිවරුන්, දිස්ත්‍රික් මාණ්ඩලික සහකාර නිලධාරීන් හා ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන්	2018.12.06	ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරය	110

1.1.9. දෙපාර්තමේන්තුගත සහකාර කොමසාරිස්වරුන් පිළිබඳ විස්තර

අනු අංකය	නිලධාරියාගේ නම	දිස්ත්‍රික්කය
01.	එම්.එම්.එරංග අතපත්තු මයා	ප්‍රධාන කාර්යාලය
02.	ඩී.එම්.ටී.බී.දිසානායක මයා	මාතලේ
03.	ඒ.ආර්.ආර්.රාමනායක මෙය	මොණරාගල
04.	අනුෂා දේවප්‍රිය මිය	කෑගල්ල
05.	ඩී.එම්.එස්.බී.දිසානායක මයා	බදුල්ල
06.	ඒ.එස්.ඩබ්.දහනායක මයා	මාතර, ගාල්ල
07.	ඩබ්.ගුණසේන මයා	රත්නපුර
08.	එස්.පී.පී.සේනාධීර මයා	පුත්තලම
09.	එස්.එම්.පී.කේ.වීරසේකර මැණිකේ මිය	මහනුවර
10.	එච්.පී.කේ.රංජනී මිය	කළුතර
11.	එස්.වයි.ඩී.ඒ.සෝමවංශ මයා	අනුරාධපුරය

1.2 පාලන අංශය

පාලන අංශය මඟින් ඉටු කරනු ලබන ප්‍රධානම සේවාව වනුයේ දෙපාර්තමේන්තුවට ලැබෙන සියලුම සාමාන්‍ය ලිපි , ලියාපදිංචි ලිපි හා වෙක්පත් ඒ ඒ අංශ වෙත යොමු කිරීම සහ ඒ ඒ අංශවලින් ලැබෙන සියලුම ලිපි අදාළ ආයතන හා පුද්ගලයින් වෙත යැවීමට කටයුතු කිරීමයි.

ඊට අමතරව පහත සඳහන් සේවාවන් ද පාලන අංශය මඟින් ඉටුකරනු ලබයි.

- දෙපාර්තමේන්තුවේ ආරක්ෂක හා පවිත්‍රතා කටයුතු පවත්වාගෙන යෑම.
- පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- පාර්ලිමේන්තු වාචික ප්‍රශ්න හා සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- අතිගරු ජනාධිපතිතුමන්ගේ උපදෙස් පරිදි ක්‍රියාවට නැංවෙන “ ජනපතිට කියන්න ” මහජන දුක් ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණයෙහි කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- මහජන පෙත්සම් කාරක සභාව හා සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) කාර්යාලය හා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට අදාළ කටයුතු පිළිබඳ සම්බන්ධීකරණ කටයුතු.
- දෙපාර්තමේන්තුවේ සියලුම දුරකථන බිල්පත් , විදුලි බිල්පත්, ජල බිල්පත් පියවීම හා වරිපනම් ගාස්තු ගෙවීම.
- දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ සියලුම නිලධාරීන්ගේ නිවාඩු සම්බන්ධ රාජකාරී.
- දෙපාර්තමේන්තු අභ්‍යන්තර දුරකථන පද්ධතියේ නඩත්තු කටයුතු සිදු කිරීම.
- නිල නිවාස කුලී අය කිරීම.
- දෙපාර්තමේන්තුව වෙත මිල දී ගනු ලබන පුවත්පත් සම්බන්ධ සියලුම රාජකාරී.
- දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන් සඳහා දුම්රිය අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර ලබාදීම.
- දුම්රිය බලපත්‍ර ලබා දීම.
- ප්‍රධාන කාර්යාලීය සෘජු දුරකථන පද්ධතිය නඩත්තු කිරීම.
- ගිනි නිවීමේ උපකරණ නඩත්තු කිරීම.
- රජයේ මැතිවරණවලට අදාළ රාජකාරී කටයුතු සිදුකිරීම.
- දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කිරීම.
- රජයේ නිලධාරීන්ගේ ඇප තැන්පත් නිදහස් කිරීමට අදාළ රාජකාරී කටයුතු සිදුකිරීම.

02. සංවර්ධන අංශය

- **අංශයේ අරමුණු**

01. කෘෂිකර්මාන්තයේ අභිවෘද්ධිය සඳහා වන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම තුළින් ජාතික ආර්ථිකය නහාසිටුවීම.

02. දිස්ත්‍රික් කාර්යාල, ගොවිජන සේවා මධ්‍යස්ථාන අලුත්වැඩියා කිරීම/ඉදිකිරීම තුළින් නිලධාරීන් සඳහා පහසුකම් වැඩි කිරීම හා එමඟින් ගොවි ජනතාවට වඩා ඵලදායී හා කාර්යක්ෂම සේවාවන් ලබා දීම.

- **වගකීම්**

01. සංවර්ධන කටයුතු සඳහා දෙපාර්තමේන්තුව වෙත වෙන්වෙන වාර්ෂික ප්‍රතිපාදන උපරිම උපයෝජනයට ලක් කිරීම හා සංවර්ධන කටයුතු නිසි ලෙස අධීක්ෂණයට ලක් කිරීම.

- **කාර්යයන්**

01. සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණයන් සිදු කිරීම.

02. දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිලි පුනරුත්ථාපනය කිරීම/නව ගොඩනැගිලි ඉදි කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණයන් සිදු කිරීම.

03. දෙපාර්තමේන්තුවට අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීමට කටයුතු කිරීම.

04. ගොවිජන සංවර්ධන අරමුදල හා ගොවීන්ගේ භාරකාර අරමුදල යටතේ වාර්ෂිකව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණයන් සිදු කිරීම හා වෙනත් ආයතන මඟින් දෙපාර්තමේන්තුව හරහා ක්‍රියාත්මක කරන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණයන් සිදු කිරීම.

05. දෙපාර්තමේන්තුවට අවශ්‍ය යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීම හා යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කටයුතු සිදු කිරීම.

06. කෘෂිකාර්මික යටිතල පහසුකම් සංවර්ධනයට අදාළව විවිධ ආයතන හා මහජනතාව වෙතින් ඉදිරිපත් වන ඉල්ලීම්වලට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම.

07. ජාතික අලුත් සහල් මංගල්‍යය උත්සවය සංවිධාන කටයුතු සිදු කිරීම.

- **නිලධාරීන් සංඛ්‍යාව**

01. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන්	- 02
02. සහකාර කොමසාරිස් (යාන්ත්‍රික)	- 01
03. සංවර්ධන නිලධාරීන්	- 06
04. කෘෂි සංවර්ධන සහකාර	- 01
05. රාජ්‍ය කළමණාකාර සහකාර	- 07
06. මධ්‍යස්ථාන ලිපිකරු	- 01
07. උපාධිධාරී අභ්‍යාසලාභී	- 01
08. කාර්යාල කාර්ය සහයක	- 03
මුළු එකතුව	**- 22**

2.1. සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය -

- **වැය විෂය- 281-2-2-12-2506**

2018 වර්ෂය සඳහා සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණ හා පුරන් කුඹුරු සංවර්ධන වැඩසටහන සඳහා මෙම දෙපාර්තමේන්තුව වෙත රු .මිලියන 1500ක ප්‍රතිපාදන වෙන් වූ අතර ඒ යටතේ දිස්ත්‍රික් 25 ම ආවරණය වන පරිදි කර්මාන්ත 863 ක් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනය රු.මි.1,160.84 කි. එම කර්මාන්තයන්ගෙන් කර්මාන්ත 776 ක වැඩ අවසන් කර ඇති අතර 2019 වසරට අවිච්ඡේද කර්මාන්ත සංඛ්‍යාව 71 කි. මීට අමතරව වසර තුළ ගංවතුර හානි සඳහා රු.මි. 6.00 ක් ද ජල කළමනාකරණ වැඩසටහන් සඳහා රු.මි.200.76 ක් ද වෙනත් සංවර්ධන කටයුතු සඳහා රු.මි.36.40 ක් ද 2017 අවිච්ඡේද කර්මාන්ත සඳහා රු.මි.95.91 ක් ද වෙන්කර ඇත. ඒ අනුව මෙම වැය ශීර්ෂය යටතේ 2018.12.31 දිනට රු.මි.563.57 ක වියදමක් දරා ඇති අතර අතැති බිල්පත් වටිනාකම රු.මි.670.34 කි. ඒ අනුව වැය ශීර්ෂයේ 2018.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (කළ වැඩ වටිනාකම) 82.26% ක් වන අතර භෞතික ප්‍රගතිය 89.9% ක් වේ. (**ඇමුණුම 01**)

- **වැය විෂය- 118 -2-3-40-2506**

කෘෂිකර්ම අමාත්‍යාංශයේ වැය විෂය 118 -2 -3 -40-2506 යටතේ විශේෂ ව්‍යාපෘති (කුඩා වැව් හා ඇළ මර්ග ප්‍රතිසංස්කරණය) සඳහා මිලියන 1000 ක ප්‍රතිපාදන වෙන් වූ අතර ඒ යටතේ දිස්ත්‍රික් 25 ම ආවරණය වන පරිදි කර්මාන්ත 440 ක් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන රු.මි.954.92 කි. එම කර්මාන්තයන්ගෙන් වැඩ අවසන් කළ කර්මාන්ත සංඛ්‍යාව 347ක් වන අතර 2019 වසරට අවිච්ඡේද කර්මාන්ත සංඛ්‍යාව 89 කි. එසේම ආරම්භ නොකරන ලද කර්මාන්ත ගණන 04 ක් වේ. මීට අමතරව වෙනත් වැඩ සඳහා රු.මි.4.00 ක් ද 2017 අවිච්ඡේද කර්මාන්තයන් සඳහා රු.මි.46.06 ක් ද වෙන් කර ඇත. ඒ අනුව මෙම වැය ශීර්ෂය යටතේ 2018.12.31 දිනට රු.මි.248.49 ක වියදමක් දරා ඇති අතර අතැති බිල් පත් වටිනාකම රු.මි.577.73 කි. ඒ අනුව වැය ශීර්ෂයේ මූල්‍ය ප්‍රගතිය (කළ වැඩ වටිනාකම අනුව) 84.58% ක් හා භෞතික ප්‍රගතිය 78.9% ක් වේ. (භෞතික ප්‍රගතිය දක්වා ඇත්තේ සම්පූර්ණ වශයෙන් වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති සලකා වන අතර අර්ධ වශයෙන් වැඩ අවසන් කරන ලද ව්‍යාපෘතීන් ද ඇතුළත් කිරීමෙන් භෞතික ප්‍රගතිය 88% ක් වේ.)
(ඇමුණුම 02)

- **වැය විෂය 118-2-3-37-2506**

කෘෂිකර්ම අමාත්‍යාංශයේ වැය විෂය 118-2-3-37-2506 යටතේ දෙපාර්තමේන්තුව වෙත ලද ප්‍රතිපාදන වලින් 2017 වර්ෂයේ අවිච්ඡේද ව්‍යාපෘති 165 ක් වෙනුවෙන් බැඳීම් වටිනාකම ලෙස රු.මි.323.61 ක් දිස්ත්‍රික්ක වෙත වෙන් කර ඇති අතර 2018.12.31 දිනට එහි වියදම රු.මි.110.20 ක් වන අතර අතැති බිල්පත් වටිනාකම රු.මි.67.95 කි. තවද, එම ප්‍රතිපාදන යටතේ ගම්පහ හා හම්බන්තොට දිස්ත්‍රික්කයන්හි නව ව්‍යාපෘති 48 ක් ක්‍රියාත්මක වූ අතර ඒ සඳහා වෙන් කළ ප්‍රතිපාදනය රු.මි.117.29 කි. ඒ යටතේ 2018.12.31 දිනට වියදම රු.මි.3.00 වන අතර අතැති බිල්පත් වල වටිනාකම රු.මි.109.28 කි. එසේම මේ යටතේ කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන ලද කෘෂි ගම්මාන ව්‍යවසායකත්ව වැඩසටහන සඳහා බදුල්ල දිස්ත්‍රික්කය වෙත රු.මි.13.51 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කරන ලද අතර ඒ යටතේ කර්මාන්ත 5 ක් ක්‍රියාත්මක කරන ලදී. 2018.12.31 දිනට එහි වියදම රු.මි.7.05 ක් වන අතර අතැති බිල්පත් වල වටිනාකම රු.මි.5.20 කි. (**ඇමුණුම 03**)

සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණ වැඩසටහනට සමගාමීව 2018 වසරේ දී නව සංකල්පයක් අනුව විශේෂ වැඩසටහන් දෙකක් ක්‍රියාත්මක වූ අතර එම තොරතුරු පහත සඳහන් පරිදි වේ.

- **වැව් දහසයි ගම් දහසයි වැඩසටහන**

  මෙම වැඩසටහන යටතේ හඳුනාගනු ලැබූ වාරි කර්මාන්තයන් සමඟම එම ග්‍රාමයේ අනෙකුත් යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම ද එම ග්‍රාමයේ මහජන සුභ සිද්ධිය සඳහා ඉවහල් වන සේවාවන් ලබාදීම ද දේශීය සංස්කෘතිය රැකගනු වස් විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ද සිදුවිය. ඒ අනුව දිවයිනේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි කර්මාන්ත 361ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද අතර එයින් කර්මාන්ත 329 ක වැඩ 2018 වර්ෂයේ දී අවසන් කර ඇත. මේ සඳහා වෙන් කර ඇති මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි.755.67ක් වේ. **(ඇමුණුම 04)**

- **රොන් මඩ ඉවත්කර වැව් ගැඹුරු කිරීමේ වැඩසටහන**

  මෙම වැඩසටහන රජයේ ප්‍රතිපාදන යොදා ගැනීමකින් තොරව අදාළ වාරි කර්මාන්තය ගැඹුරු කිරීමේ දී ඉවත් කරනු ලබන රොන් මඩ හා පස් අලෙවි කර ලබා ගන්නා මුදල් ගොවි සංවිධාන අරමුදලක් මඟින් වාරි කර්මාන්තයේ සියලු අලුත්වැඩියාවන් සඳහා යෙදවීමෙන් මෙම ප්‍රතිසංස්කරණ වැඩසටහන ක්‍රියාත්මක විය. මේ යටතේ පුත්තලම දිස්ත්‍රික්කයේ ආනමඩුව හා කුඩාවැව යන ගොවිජන සේවා මධ්‍යස්ථානයන්ට අදාළව කර්මාන්ත 05ක් සිදු කර ඇති අතර එහි ඇස්තමේන්තු මුළු වටිනාකම රු.මි.7.01ක් වන අතර මුළු කළ වැඩ වටිනාකම රු.මි.6.46ක් වේ. මෙහි භෞතික ප්‍රගතිය 100% ක් වේ. **(ඇමුණුම 05)**

2.2. ගොඩනැගිලි පුනරුත්ථාපනය - වැය විෂය 281-2-2-0-2001

ඉහත වැය විෂය යටතේ රු .මි.180 ක ප්‍රතිපාදන වෙන් වූ අතර මේ යටතේ දිස්ත්‍රික් 25 ම ආවරණය වන පරිදි ගොවිජන සේවා මධ්‍යස්ථාන අලුත්වැඩියා කර්මාන්ත 118 ක් ද ප්‍රධාන කාර්යාලයේ අලුත්වැඩියා කර්මාන්ත 02 ක් ද ලෙස මුළු කර්මාන්ත 120ක් ක්‍රියාත්මක කරන ලදී. මෙම වැය ශීර්ෂය යටතේ 2018.12.31 දිනට දරා ඇති වියදම රු.මි.48.78 ක් වන අතර අතැති බිල්පත් වටිනාකම රු.මි.118.41 ක් වේ. වැඩ අවසන් කර්මාන්ත සංඛ්‍යාව 95 කි. **ඒ අනුව මූල්‍ය ප්‍රගතිය 92.9% ක් වන අතර මෙහි භෞතික ප්‍රගතිය 79.16% ක් වේ.(ඇමුණුම 06**)

2.3. ගොඩනැගිලි පුනරුත්ථාපනය - වැය විෂය 281-1-1-0-2001

2018 වසරේ ඉහත වැය විෂය යටතේ රු.මි. 60 ක ප්‍රතිපාදන වෙන් වූ අතර එම මුළු ප්‍රතිපාදනය යටතේ ක්‍රියාත්මක වූ මුළු කර්මාන්ත ගණන 22 කි. මෙම වැය ශීර්ෂයේ 2018.12.31 දිනට දරා ඇති වියදම රු.මි.20.03 ක් වන අතර අතැති බිල්පත් වටිනාකම රු.මි.20.18 ක් වේ. මෙහි වැඩ අවසන් කළ කර්මාන්ත ගණන 17 ක් වේ. මෙම වැඩසටහනෙ හි මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිළිවෙලින් **67.03% හා 77% කි. (ඇමුණුම 07)**

2.4. ගොඩනැගිලි අත්පත් කර ගැනීම වැය විෂය - 281-2-2-0-2104

ඉහත වැය විෂය යටතේ රු.මි.20 ක ප්‍රතිපාදන වෙන් වූ අතර එම ප්‍රතිපාදන දිස්ත්‍රික් 07 ක් අවරණය වන පරිදි ක්‍රියාත්මක වූ කර්මාන්ත ගණන 08 කි. මෙම වැය ශීර්ෂයේ 2018/12/31 දිනට වියදම රු.මි.5.90 ක් වන අතර අතැති බිල්පත් වටිනාකම රු.මි.8.20 ක් වේ. ඒ අනුව වැඩ අවසන් කර්මාන්ත සංඛ්‍යාව 6 ක් වේ. මෙහි මූල්‍ය ප්‍රගතිය 70.52% ක් වන අතර භෞතික ප්‍රගතිය 85.7% ක් වේ. (**ඇමුණුම 08**)

2.5. ජාතික සමගිය හා සංහිඳියා කාර්යාංශය මඟින් ලබා දුන් ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලද සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණ වැඩසටහන

මෙම වැඩසටහන යටතේ උතුරු හා නැගෙනහිර පළාත් හි සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා රු.මි.500 ක ප්‍රතිපාදන වෙන් වූ අතර දිස්ත්‍රික්ක 08 ක් ආවරණය වන පරිදි කර්මාන්ත 129 ක් ක්‍රියාත්මක කරන ලදී. එම කර්මාන්ත අතරින් වැඩ අවසන් කර්මාන්ත 107 ක් වන අතර 2019 වසරට අවිච්ඡේද කර්මාන්ත ගණන 18 කි. මේ යටතේ 2018/12/31 දිනට වියදම රු.මි.222.52 ක් වන අතර අතැති බිල්පත් වටිනාකම රු.මි.152.31 කි. මෙම වැඩසටහනෙහි මූල්‍ය ප්‍රගතිය 76.18% ක් වන අතර භෞතික ප්‍රගතිය 83% ක් වේ. (**ඇමුණුම 09**)

2.6. යන්ත්‍ර පුනරුත්ථාපන වැය විෂය 281-2-2-0-2002

මෙම වැය ශීර්ෂය යටතේ වෙන් වූ ප්‍රතිපාදන ප්‍රමාණය වූ රු.මි. 10 ක් වූ අතර යන්ත්‍ර අත්පත් කර ගැනීම (281-2-2-0-2103 වැය විෂය) යටතේ වෙන් කර තිබූ රු.මි.3.5 ප්‍රතිපාදන ප්‍රමාණය ද මෙම වැය ශීර්ෂයට මාරු කොට යන්ත්‍ර පුනරුත්ථාපනය සඳහා යොදවන ලද මුළු ප්‍රතිපාදන ප්‍රමාණය වන රු.මි.13.5 න් යන්ත්‍ර පුනරුත්ථාපනය සඳහා රු.11.66 ක වියදමක් දරා ඇත. ඒ අනුව මූල්‍ය ප්‍රගතිය 86.43% කි.

2.7. යන්ත්‍ර සේවා සැපයීම

යාන්ත්‍රික අංශය (දෙපාර්තමේන්තුව සතු ඩෝසර් /එක්ස්කැවේටර් යන්ත්‍ර)

2018.12.31 ට අප දෙපාර්තමේන්තුව සතුව තිබූ යන්ත්‍ර පිළිබඳ විස්තර පහත පරිදි වේ.

ජපන් යන්ත්‍ර

01. එක්ස්කැවේටර් යන්ත්‍ර	-	04
02. මිනි එක්ස්කැවේටර් යන්ත්‍ර	-	02
03. ඩෝසර් යන්ත්‍ර	-	14
04. කුඩ පස් තලන රෝලර්	-	02
එකතුව	-	**22**

චීන යන්ත්‍ර

01. එක්ස්කැවේටර් යන්ත්‍ර	-	07
02. වීල් ලෝඩර්	-	03
03. බැකෝ ලෝඩර්	-	05
04. බුල් ඩෝසර්	-	09
05. වයිබ්‍රේටර් රෝලර්	-	04
06. මෝටර් ග්‍රේඩර් යන්ත්‍ර	-	01
එකතුව	-	29
මුළු එකතුව	-	**51**

ජපන් ආධාර යටතේ ලබා දුන් යන්ත්‍රවලින් ක්‍රියාකාරී නොවන යන්ත්‍ර 06 ක් (DAS 26, DAS 27,DAS 28, DAS 34, DAS 45,DAS 17) අපහරණය කිරීමට කටයුතු යොදා ඇති අතර එයින් DAS 28,DAS 34, අපහරණය කටයුතු අවසන් කර ඇත. චීන ආධාර යටතේ ලබා දුන් යන්ත්‍රවලින් ක්‍රියාකාරී නොවන යන්ත්‍ර 07ක් (DAS 99,DAS 105, DAS 84,DAS101,DAS 104 ,DAS 88,DAS 102) අපහරණය කිරීමට කටයුතු යොදා ඇත. ඒ අනුව දෙපාර්තමේන්තුව සතුව ක්‍රියාකාරී මට්ටමේ මුලු යන්ත්‍ර ප්‍රමාණය 38 කි. මෙම යන්ත්‍ර ප්‍රමාණය පහත දැක්වෙන පරිදි ප්‍රාදේශිය යාන්ත්‍රික ඒකකවලට අනුයුක්ත කර ඇත.

අනු අංකය	ස්ථානය	චීන යන්ත්‍ර	ජපන් යන්ත්‍ර	එකතුව
01	මාලඹේ	01	01	02
02	මහව	06	06	12
03	හම්බන්තොට	03	04	07
04	මොණරාගල	01	04	05
05	අනුරාධපුරය	11	01	12
	එකතුව	**22**	**16**	**38**

ආදායම් විස්තර - 2018

01. හම්බන්තොට - රු.මි.0.64

02. මොණරාගල - රු.මි.0.14

03. අනුරාධපුරය - රු.මි.0.87

04. කුරුණෑගල - රු.මි.1.38

මෙම යන්ත්‍රවලින් 2018 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇති ආදායම රු.මි.3.04ක් වේ. මෙම යන්ත්‍ර 2018 වර්ෂයේ දී ක්‍රියාකර ඇති සේවා මීටර් පැය ගණන 4,428 ක් පමණ වේ . ඒ අනුව ඉටු කර ඇති වැඩවල මුළු වටිනාකම ආසන්න වශයෙන් රු.මි.25.08 කි.

සිදු කරන ලද අලුත්වැඩියාවන් සංඛ්‍යාව = 35

2.8. ගොවීන්ගේ භාරකාර අරමුදල

- **කෘෂි මාර්ග**
  - ගම්පහ දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික මාර්ගයක් කොන්ක්‍රීට් දමා නවීකරණය කිරීමේ ව්‍යාපෘතියක් 2018 වර්ෂයේ ආරම්භ කරන ලද අතර එහි ඇස්තමේන්තු වටිනාකම රු.මි.0.28ක් වන අතර මෙහි වියදම ලෙස රු.මි.0.17 ක් දරා ඇත. මේ සඳහා ලද මුදල වන රු.මි.0.17 ක අත්තිකාරම් මුදල පියවා ඇති අතර ව්‍යාපෘතියේ වැඩ අවසන් කර ඇත. ඒ අනුව මූල්‍ය ප්‍රගතිය 100% ක් ද භෞතික ප්‍රගතිය 100% ක් ද වේ.
    (**ඇමුණුම 10**)
  - බදුල්ල දිස්ත්‍රික්කයේ 2018 වර්ෂයේ ආරම්භ කළ ව්‍යාපෘතියක් වන කහත්තේවල කෘෂි මාර්ගය සඳහා අනුමත මුළු ඇස්තමේන්තු මුදල රු.මි.4.44 ක් වන අතර ඒ සඳහා ලද රු.මි.0.88 අත්තිකාරම් මුදල පියවා ඇති අතර අදාළ අතැති බිල් පත් වටිනාකම රු.මි.3.09ක් වේ. භෞතික ප්‍රගතිය 100% වන අතර කළ වැඩ වටිනාකම අනුව මූල්‍ය ප්‍රගතිය 89.7% කි. (**ඇමුණුම 11**)

2.9. ගොවිජන සංවර්ධන අරමුදල

ගොවිජන සංවර්ධන අරමුදලින් මධ්‍යස්ථානවල සැපයුම වැඩිදියුණු කිරීම හා සංවර්ධනය කිරීම යටතේ අලෙවිසැල් සංවර්ධනය කිරීම සඳහා රු.මි.25 ක් වෙන් වූ අතර 2017 වසරේ වියදම් පියවීමෙන් අනතුරුව 2018 වසර සඳහා වන මූල්‍ය ප්‍රමාණය රු.මි.21.92 කි. එයින් රු.මි.17.66 ක් යොදවා දිස්ත්‍රික්ක 21 ක් ආවරණය වන පරිදි මධ්‍යස්ථානයන් 49 ක අලෙවිසල් සංවර්ධන කර්මාන්තයන් සඳහා අත්තිකාරම් ලබා දුන් අතර එහි මුළු වියදම රු.මි.**17.30 කි.(ඇමුණුම 10)**

ගොඩනැගිලි, වාහන සහ උපකරණ නඩත්තු කිරීම හා අලුත්වැඩියා කිරීම වෙනුවෙන් රු.මි.15 ක් වෙන් වූ අතර 2017 වසරේ පියවීම් කිරීමෙන් අනතුරුව 2018 වසර සඳහා වන මූල්‍ය ප්‍රමාණය රු.මි. 9.90 කි. එයින් රු.මි.6.84 ක් යටතේ දිස්ත්‍රික්ක 08 ක් ආවරණය වන පරිදි මධ්‍යස්ථාන අලුත්වැඩියා කර්මාන්තයන් 12 ක් සඳහා අත්තිකාරම් ලබා දුන් අතර එහි මුළු වියදම රු.මි.6.61 ක් වේ. **(ඇමුණුම 10)**

2.10. ඉඩම් අත්පත් කර ගැනීම

2018 වසරේ ද දෙපාර්තමේන්තුව වෙත පැවරී නොමැති ගොවිජන සේවා මධ්‍යස්ථාන පිහිටි ඉඩම් හා සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය සඳහා අවශ්‍ය ඉඩම් පවරා ගැනීමට කටයුතු සිදු කෙරුණි . මෙහිදී ඉඩම් පවරා ගැනීමේ ක්‍රියාවලිය සඳහා දීර්ඝ කාලයක් ගතවීම හා නිරන්තර විරෝධතා මතුවීම නිසා මෙම කාර්යය අඛණ්ඩව සිදු වෙමින් පවතී.

2.11. අලුත් සහල් මංගල්‍යය

අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ අභියස දී **51 වන** වරටත් ජාතික අලුත් සහල් මංගල්‍යය අප්‍රේල් මස 07 හා 08 යන දිනයන්හි දී උත්සවාකාරයෙන් පවත්වන ලදී .

ලක්වාසී ගොවි ජනතාවගේ අභිවෘද්ධිය අපේක්ෂාවෙන් “කළට වැසි වසීවා - කෙත් වතු සාර වේවා” යන තේමාව යටතේ එවකට ගරු කෘෂිකර්ම අමාත්‍යතුමාගේ මහපෙන්වීම හා කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ උපදෙස් අනුව 2018 අලුත් සහල් මංගල්‍යය සාර්ථකව පවත්වන්නට විය.





මෙම ජාතික උත්සවය ශ්‍රී ලංකා රූපවාහිණී සංස්ථාව හා ගුවන් විදුලි සංස්ථාව මඟින් සජීවීව ප්‍රචාරය කිරීමට පෙර වසරවල දී මෙන්ම මෙවර ද කටයුතු කරන ලදී. දිවයිනේ ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා එක් රැස් කර භාර දුන් සහල් මෙදින පූජා කරන ලද අතර ඒ සඳහා අවශ්‍ය සහල් සහ මුදල් ආධාර ලබා දීමට දිවයින පුරා පිහිටි ගොවි සංවිධාන විසින් සිදු කරන ලදී. මෙම අලුත් සහල් මංගල්‍යය සාර්ථක කර ගැනීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති සියලුම ආයතනයන් ද, විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා මෙන්ම උතුරු මැද පළාත් සභාව, අනුරාධපුර දිස්ත්‍රික් ලේකම්

කාර්යාලය හා පෞද්ගලික ආයතනයන් ද විශාල දායකත්වයක් ලබා දෙන ලදී. මෙහිදී අලුත් සහල් මංගල්‍යය නිමිති කර ගත් සමරු ග්‍රන්ථය ද එළිදක්වන ලදී.

මේ සඳහා වැය ශීර්ෂය 281-2-2-0-1409 යටතේ රු.මි. 3.00 ක් අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලය වෙත ලබා දී ඇති අතර ඉන් රු.මි.2.96 ක වියදම් දරා ඇත. ඊට අමතරව ගොවීන්ගේ භාරකාර අරමුදල යටතේ රු.මි. 3.00ක් ලබා දුන් අතර මාධ්‍ය ප්‍රචාරණ කටයුතු සඳහා ඉන් රු.මි.2.99 ක වියදම් දරා ඇත. එසේම අගසස් අරමුදල යටතේ ප්‍රධාන කර්යාලය මඟින් රු.මි.0.58 ක වියදමක් දරා ඇත. ඒ අනුව 2018 ජාතික අලුත් සහල් මංගල්‍ය සඳහා වන සමස්ත වියදම රු.මි. 6.53 කි. (**ඇමුණුම 12**)

2.12. මහජන දුක්ගැනවිලි යාන්ත්‍රණය- (" ජනපතිට කියන්න වැඩසටහන")

- මහජන පැමිණිලි ජනාධිපති කාර්යාලයෙන්, අග්‍රමාත්‍ය කාර්යාලයෙන් හා කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් යොමුවන පැමිණිලි හා ඉල්ලීම්

2018 වසරේ ජනවාරි පළමු දින සිට ජූනි මස 30 වන දින දක්වා පැමිණිලි හා ඉල්ලීම් 168ක් ද 2018 ජූලි මස පළමු දින සිට 2018 දෙසැම්බර් මස 31 වන දින දක්වා පැමිණිලි හා ඉල්ලීම් 315ක් ද ලෙස ලැබී ඇති මුළු පැමිණිලි සංඛ්‍යාවට අදාළව ප්‍රගතිය පහත පරිදි වේ.

කාලය	දිස්ත්‍රික්කය වෙත යොමු ගත පැමිණිලි හා ඉල්ලීම්	විසඳී ඇති පැමිණිලි හා ඉල්ලීම්	මධ්‍යස්ථාන වෙත යොමු වී ඇති ඉල්ලීම්
2018.01.01-2018.06.30	168	41	127
2018.07.01-2018.12.31	315	34	281

- ජනපතිට කියන්න වැඩසටහන වෙත යොමු වන පැමිණිලි හා ඉල්ලීම්.

දිස්ත්‍රික්කයට යොමු ගත ඉල්ලීම් හා පැමිණිලිවලින් 2018.01.01 සිට 2018.06.30 දක්වා 103ක් ද 2018.07.01 සිට 2018.12.31 දක්වා 214ක් ද ලෙස ලැබී ඇති මුළු පැමිණිලි සංඛ්‍යාවට අදාළව ප්‍රගතිය පහත පරිදි වේ.

කාලය	දිස්ත්‍රික්කය වෙත යොමු ගත පැමිණිලි හා ඉල්ලීම්	විසඳී ඇති පැමිණිලි හා ඉල්ලීම්	මධ්‍යස්ථාන වෙත යොමු වී ඇති ඉල්ලීම්
2018.01.01-2018.06.30	103	21	82
2018.07.01-2018.12.31	214	25	189

03. ඉංජිනේරු අංශය

- **දැක්ම:**

ගුණාත්මක වූ ඉංජිනේරු තාක්ෂණයක් තුළින් දෙපාර්තමේන්තුගත සියලුම ඉදිකිරීම් හා සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කර පවත්වාගෙන යාම.

- **මෙහෙවර:**

නව තාක්ෂණික ශිල්ප ක්‍රම යොදාගනිමින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව ඉහළම තලයට රැගෙන යාමේ ඉලක්කය සපුරා ගැනීම.

- **අරමුණු:**

01. සුළු වාරිමාර්ග සහ ගොඩනැගිලි ඉදිකිරීම් හා අලුත්වැඩියා කටයුතුවලදී අවශ්‍ය වන ඉංජිනේරුමය උපදෙස් ලබාදීම සහ ඇතිවන ගැටලු නිරාකරණය කිරීමට අවශ්‍ය තාක්ෂණික උපදෙස් හා ඊට නායකත්වය සැපයීම.
02. එම ඉදිකිරීම්වල ප්‍රමිතිය උපරිම අන්දමින් පවත්වාගෙන යාමට අවශ්‍ය උපදෙස් ලබාදීම.
03. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශය නහා සිටුවීමට සහ එහි කාර්යභාරය නියමිත අයුරින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදීම සහ ක්‍රමවේදයන් සකස් කිරීම.
04. ප්‍රාදේශීය ඉංජිනේරුවරුන් සහ තාක්ෂණ සේවා නිලධාරීන් සමඟ සම්බන්ධීකරණය සියලු අධීක්ෂණ කටයුතු හා කාර්ය සාධනය ඔප්නැංවීමට කටයුතු කිරීම.
05. රටේ ජීවනාලිය වන් ගොවි පරපුර නියෝජනය කරන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේදී සිදුවන අක්‍රමිකතා දුරලමින් එහි උන්නතිය උදෙසා අවංක මෙහෙවරකට උරදීම.

- **කාර්යභාරයන්:**

ඉංජිනේරු අංශය මඟින් සුළු වාරිමාර්ග, ගොඩනැගිලි, කෘෂි මාවත් හා වෙනත් සිවිල් ඉංජිනේරුමය ඉදිකිරීම් සම්බන්ධයෙන් පහත සඳහන් කාර්යභාරයන් ඉටුකරනු ලබයි.

1. මිල ගණන් විශ්ලේෂණ සකස් කිරීම.
2. ඉංජිනේරුමය ඇස්තමේන්තු අනුඥාත කිරීම.
3. තාක්ෂණ ඇගැයීම් සිදුකිරීම.
4. ඉංජිනේරු කාර්ය මණ්ඩල සහ රාජකාරි වගකීම්/ පත්කිරීම්, ස්ථානමාරු කිරීම් පිළිබඳ නිර්දේශ ලබාදීම.
5. ඉංජිනේරුමය ගැටලු සඳහා උපදෙස් ලබාදීම.
6. ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රධාන කාර්යාලයට අයත් ගොඩනැගිලිවල ඉදිකිරීම් / අලුත්වැඩියා කටයුතු සිදු කිරීම.
7. ඉදිකිරීම් අධීක්ෂණය සඳහා වැඩ පිළිවෙළක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
8. සියලුම ඉංජිනේරුවරුන්ගේ කාර්යසාධන ඇගයීම.

- **කාර්ය මණ්ඩලය:**

අනු අංකය	තනතුර	අයත්වන සේවය/පන්තිය	සිටින නිලධාරීන් සංඛ්‍යාව
01	අධ්‍යක්ෂ (ඉංජිනේරු)	ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය I පන්තිය	01
02	ප්‍රාදේශීය ඉංජිනේරු	ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය III පන්තිය	01
03	දිස්ත්‍රික් තාක්ෂණ නිලධාරී	ශ්‍රී ලංකා තාක්ෂණ සේවය විශේෂ පන්තිය	01
04	සැලසුම් ශිල්පී	ශ්‍රී ලංකා තාක්ෂණ සේවය I පන්තිය	01
05	තාක්ෂණ නිලධාරී	ශ්‍රී ලංකා තාක්ෂණ සේවය III පන්තිය	03
06	සංවර්ධන නිලධාරී	සංවර්ධන නිලධාරී සේවය III පන්තිය	03
07	කාර්යාල කාර්ය සහායක	කාර්යාල කාර්ය සහායක සේවය	01
එකතුව			**11**

- **2018 වර්ෂය තුළ ඉංජිනේරු අංශය විසින් ඉටුකරන ලද කාර්යයන්**

මෙම අංශයේ රාජකාරී කටයුතු සංවර්ධන අංශයේ ක්‍රියාකාරී සැලැස්ම මත ක්‍රියාත්මක වේ. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබන සුළු වාරිමාර්ග, දෙපාර්තමේන්තුගත ගොඩනැගිලි ඉදිකිරීම් හා අලුත්වැඩියාවන්, ඇස්තමේන්තු අනුඥාත කිරීම්, තාක්ෂණ ඇගයීම් සහ මිල විශ්ලේෂණ වාර්තා සැකසීම් ආදිය ඉංජිනේරු අංශය හරහා සිදුවන අතර මෙම වර්ෂයේ එම කටයුතු සාර්ථකව ඉටුකළ ආකාරය පිළිබඳ මෙම පාලන වාර්තාවට ඇතුළත් කර ඇත.

3.1. මිල ගණන් විශ්ලේෂණය

- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් දිස්ත්‍රික්ක මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන සුළු වාරිමාර්ග ඇස්තමේන්තු සකස් කිරීමේදී පොදුවේ භාවිතා වන අයිතමයන් සඳහන් කර, මිල විශ්ලේෂණ අනුපාත හා සුළු වාරිමාර්ග මිල අනුපාත ඇතුළත් කරමින් මිල විශ්ලේෂණ අනුපාත වාර්තාව සකස් කර ඇත.
- මෙසේ සකස් කරන ලද මිල විශ්ලේෂණ වාර්තාව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් සියලුම දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් වෙත යොමු කර ඇත.
- තවද, මෙම මිල විශ්ලේෂණ වාර්තාව අවශ්‍ය අවස්ථාවල දී සංශෝධනය කරමින් සියලුම දිස්ත්‍රික්ක වෙත දැනුම්දීම සිදු කරනු ලබයි.

3.2. ඉංජිනේරුමය ඇස්තමේන්තු අනුඥාත කිරීම

දෙපාර්තමේන්තුවේ සංවර්ධන අංශය හරහා 2018 වර්ෂයේ අප අංශය වෙත යොමු කරන ලද ඉංජිනේරුමය ඇස්තමේන්තුවල ගැටලු හා අඩුපාඩු පිළිබඳ සොයා බලා අධ්‍යක්ෂ ඉංජිනේරු විසින් අනුමැතිය ලබාදීම සිදුකර ඇත. එසේ අනුමැතිය ලබාදුන් ඇස්තමේන්තුවල සාරාංශයක් මෙහි ඇතුළත් කර ඇත. **(ඇමුණුම 13)**

3.3. ප්‍රධාන කාර්යාලය අලුත්වැඩියා කිරීම

මෙම වර්ෂය තුළ ප්‍රධාන කාර්යාලයේ පැරණි ගොඩනැගිල්ල අලුත්වැඩියා කටයුතු ආරම්භ කළ අතර මෙහිදී වැසිකිළි පද්ධතිය නවීකරණය සහ තෙමහල් ගොඩනැගිල්ල නවීකරණය ගොඩනැගිලි දෙපාර්තමේන්තුව මඟින් ඉටුකිරීමට කටයුතු කර ඇති අතර මේ සඳහා අවශ්‍ය උපදෙස් සහ සම්බන්ධීකරණ කටයුතු ඉංජිනේරු අංශය මඟින් ඉටුකර ඇත. මෙම නවීකරණ කටයුතු සඳහා වැය වූ ප්‍රතිපාදන පිළිබඳ සාරාංශයක් මෙසේ දැක්විය හැකිය.
ප්‍රධාන කාර්යාලයේ ආපනශාලාව නවීකරණය කිරීම සඳහා සැලසුම් සකස් කිරීම, ඇස්තමේන්තු සකස් කිරීම සහ අධීක්ෂණ කටයුතු මෙම අංශය මඟින් ඉටුකරන ලදී.

අනු අංකය	ව්‍යාපෘතියේ නම	ඇස්තමේන්තුගත මුදල (රු.මි.)	2018 වර්ෂයේ නිදහස් කළ ප්‍රතිපාදන/ වියදම (රු.මි.)
01	පැරණි ගොඩනැගිල්ලේ වැසිකිළි පද්ධතිය නවීකරණය	16.27	15.00
02	පැරණි තෙමහල් ගොඩනැගිල්ල නවීකරණය	25.69	15.00
03	ආපනශාලාව නවීකරණය	1.50	1.32

3.3.1. පැරණි ගොඩනැගිල්ලේ වැසිකිළි පද්ධතිය නවීකරණය

ප්‍රධාන කාර්යාලයේ පැරණි ගොඩනැගිල්ලේ වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා කටයුතු වර්ෂ අවසානයේදී අවසන් කර ඇත.

3.3.2. පැරණි තෙමහල් ගොඩනැගිල්ල නවීකරණය

ප්‍රධාන කාර්යාලයේ පැරණි ගොඩනැගිල්ල නවීකරණය ගොඩනැගිලි දෙපාර්තමේන්තුව එක්ව සිදු කරනු ලබන අතර මේ වන විට එහි දෙවන මහලේ අලුත්වැඩියා කටයුතු 90% ක් පමණ අවසන් කර ඇත. මෙහිදී එහි ස්ථාපිත අංශයන්හි රාජකාරී කටයුතු පහසු ලෙස කරගෙන යාමට අවශ්‍ය ඉඩකඩ පහසුකම් සලකා බලා අලුත්වැඩියා කටයුතු සිදුකර ඇත. මෙහි නවීකරණ කටයුතු සිදු වී තිබෙන ආකාරය ඡායාරූප මඟින් පැහැදිලිව දක්වා ඇත. **(ඇමුණුම 14)**

3.3.3. ආපන ශාලාව නවීකරණය

ප්‍රධාන කාර්යාලයේ ආපනශාලාව අලුත්වැඩියාව ඉටුකරවා ගැනීම සඳහා නිර්දේශිත ගොවි සංවිධානයක් වෙත කර්මාන්තය ප්‍රදානය කළ අතර එම අලුත්වැඩියා කටයුතු දින 14 කින් අවසන් කිරීමට හැකිවිය. අලුත්වැඩියා කරන ලද නව ආපන ශාලාවේ ඡායාරූප කිහිපයක් මෙහි ඇතුළත් කර ඇත. **(ඇමුණුම 15)**

3.4. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් සංචාරක නිවාස අලුත්වැඩියා කිරීම

මෙම දෙපාර්තමේන්තුව සතු සංචාරක නිවාස 02 ක් කතරගම සහ අනුරාධපුර මිහින්තලේ පිහිටා ඇත. මෙම සංචාරක නිවාස අලුත්වැඩියා කිරීම සහ වැඩිදියුණු කිරීම මෙම වර්ෂයේදී ආරම්භ කර ඇති අතර මේ වන විට මිහින්තලේ සංචාරක නිවාසය අලුත්වැඩියාව අවසන් කර ඇත.

තවද කතරගම සංචාරක නිවාසය නවීකරණ කටයුතු ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. මේ සඳහා වැය වූ ප්‍රතිපාදන පිළිබඳ සාරාංශය පහත දක්වා ඇත.

අනු අංකය	ව්‍යාපෘතියේ නම	ඇස්තමේන්තුගත මුදල (රු.මි.)	2018 වර්ෂයේ නිදහස් කළ ප්‍රතිපාදන මුදල (රු.මි.)
01	මිහින්තලය සංචාරක නිවාසය අලුත්වැඩියාව	25.00	10.00
02	කතරගම සංචාරක නිවාසය අලුත්වැඩියාව	40.17	10.00

3.5. තාක්ෂණ කමිටු ඇගයීම් කටයුතු සිදුකිරීම

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිලි හා සුළු වාරිමාර්ග අලුත්වැඩියාව, ප්‍රතිසංස්කරණය හා ඉදිකිරීම්වලට අදාළ ඇස්තමේන්තු සකස් කිරීමෙන් පසු එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ ප්‍රසම්පාදන ලේඛන ඇගයීම, නිර්දේශ කිරීම හා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් පසු සුදුසු කොන්ත්‍රාත්කරුවන් තේරීමට අදාළ තීරණ ගැනීම මේ යටතේ සිදු කරයි.

ඒ අනුව මෙම වර්ෂයේදී සිදුකරන ලද තාක්ෂණ කමිටු ඇගැයීම් හා නිර්දේශ ලබාදුන් වාර්තාවන්හි සාරාංශයක් මෙහි ඇතුළත් වේ. **(ඇමුණුම 16)**

04. ආයතනික සංවර්ධන අංශය

අරමුණ හා වගකීම

ගොවි ජනතාවගේ කෘෂිකාර්මික අවශ්‍යතා සපුරාදීම මඟින් ඔවුන්ගේ ආර්ථික හා සමාජයීය පසුබිම ශක්තිමත් කිරීම අරමුණු කොට මැදිහත්කරුවෙකුගේ භූමිකාව ඉටුකිරීම පිණිස සමස්ත ගොවිජන සේවා මධ්‍යස්ථාන ජාලය මෙහෙයවීම සඳහා 2018 වර්ෂය තුළ මෙම අංශය වෙතින් ඉටුකරන ලද කාර්යභාරය ඒ ඒ විෂයයන් ඔස්සේ පහත සඳහන් පරිදි පෙළගස්වනු ලැබේ.

4.1. ගොවිජන සේවා මධ්‍යස්ථාන අධීක්ෂණය

<u>ගොවිජන සේවා මධ්‍යස්ථාන පරීක්ෂණ වාර්තා ලැබීම</u>.

- ගොවිජන සේවා මධ්‍යස්ථාන අධීක්ෂණයට අදාළව පරීක්ෂණ වාර්තා නියමිත පරිදි ප්‍රධාන කාර්යාලය වෙත එවීමට කටයුතු කරන ලෙස සියලුම දිස්ත්‍රික් නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරුන් වෙත දන්වා යවා ඇත. ඒ අනුව මෙම වර්ෂයේදී ගොවිජන සේවා මධ්‍යස්ථාන පරීක්ෂණ 351 ක් පරීක්ෂා කොට ඇති අතර වාර්තා ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් වී ඇත.

<u>ගොවිජන සේවා මධ්‍යස්ථාන මඟින් සේවා සැපයීම.</u>

- ගොවි ජනතාවට අවශ්‍ය බීජ හා රෝපණ ද්‍රව්‍ය , පැළ වර්ග, කෘෂි උපකරණ හා වෙනත් අවශ්‍ය කෘෂිකාර්මික ද්‍රව්‍ය ගොවිජන සේවා මධ්‍යස්ථාන මඟින් සපයා දීම හා ඒ මඟින් ආදායම් ඉපයීමට කටයුතු කර ඇත.

4.2. පොදු මුදල්/අක්කර බදු/කුවිතාන්සි පොත් සහ මුදල් පොත් සැපයීම

- ඇණවුම් කර ඇති පොත් ගබඩාවේ තොග අවසන් වන්නට පෙර නැවත මුද්‍රණය කිරීමට කටයුතු කිරීම හා අවශ්‍යතාව පරිදි දිස්ත්‍රික් කාර්යාල වෙත බෙදා හැරීම මෙම අංශය මඟින් සිදුකරනු ලැබේ. ඒ අනුව 2018 වසරේ කුවිතාන්සි පොත් අලෙවිය පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

වර්ගය	පොත් ප්‍රමාණය	මුදල (රු.මි.)
පොදු මුදල් කුවිතාන්සි පොත්	26,926	1.34
අක්කර බදු කුවිතාන්සි පොත්	14,870	0.74
කමිටු මුදල් කුවිතාන්සි පොත්	61	0.07
එකතුව	**41,857**	**2.16**

4.3. අක්කර බදු අයකිරීම

2018 වර්ෂයේ අක්කර බදු ඉලක්කය		➢ රු.මි. 130.14
ඉලක්කය අනුව ගොවිජන සංවර්ධන අරමුදලට 20% දායකත්වය		➢ රු.මි. 26.03
2018 වර්ෂය තුළ අක්කර බදු අයවීම (පෙර වර්ෂවල හිඟ ද සමඟ)		➢ රු.මි. 127.03
අයවීම් අනුව 2018.12.31 දින වන විට ගොවිජන සංවර්ධන අරමුදලට බැර කර ඇති මුදල	➢ 2018 වර්ෂය සඳහා	➢ රු.මි. 26.01
	➢ 2017 හා පෙර වර්ෂ සඳහා හිඟ	➢ රු.මි. 4.70
		➢ රු.මි. 30.72

4.4. 2 KR - ජපන්-යෙන් ආධාර යටතේ ට්‍රැක්ටර් බෙදාහැරීම හා කළමනාකරණය



<u>ට්‍රැක්ටර් වාරික අය කිරීම</u>

- 2KR ජපන්-යෙන් ආධාර වැඩසටහන යටතේ කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා ලැබී, මෙම දෙපාර්තමේන්තුව මඟින් 2012 වර්ෂය දක්වා බෙදාහරින ලද ට්‍රැක්ටර්/කෘෂි උපාංග වෙනුවෙන් 2018 වර්ෂය තුළ දී අයකරන ලද වාරික මුදල් දිස්ත්‍රික්කවලින් ප්‍රධාන කාර්යාලය වෙත එවා ඇත.
- ඒ අනුව පහත දැක්වෙන පරිදි වාරික මුදල් ගොවිජන සංවර්ධන අරමුදලට බැර කර ඇත.

<u>රෝද 02 ට්‍රැක්ටර් වාරික මුදල්</u>

i. 1992-2006 වර්ෂ තුළ ගොවි සංවිධාන වෙත නිකුත් කළ ට්‍රැක්ටර් සඳහා - රු.මි. 0.45
ii. 2008 වර්ෂයේ ගොවීන් වෙත නිකුත් කළ ට්‍රැක්ටර් සඳහා - රු.මි. 2.45
iii. 2010 වර්ෂයේ නිකුත් කළ ට්‍රැක්ටර් සඳහා - රු.මි. 9.63
iv. 2012 වර්ෂයේ ගොවීන් වෙත නිකුත් කළ ට්‍රැක්ටර් සඳහා - රු.මි. 13.28

එකතුව =රු.මි.**25.77**

<u>රෝද 04 ට්‍රැක්ටර් වාරික මුදල්</u>

- 1986-2012 දක්වා ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත ලබාදී ඇති ට්‍රැක්ටර් සඳහා - රු.මි.0.31

<u>වතුර පොම්ප වාරික මුදල්</u>

- 2010 වර්ෂයේ ගොවීන් වෙත නිකුත් කරන ලද වතුර පොම්ප සඳහා - රු.මි.0.08

<u>ගර්හිත ට්‍රැක්ටර් හා කෘෂි උපාංග අපහරණය</u>

2018 වර්ෂයේදී ගර්හිත ට්‍රැක්ටර් හා කෘෂි උපාංග අපහරණය යටතේ පහත පරිදි අපහරණ කටයුතු සිදු කර ඇත.

	රෝද 04 ට්‍රැක්ටර්	**රෝද 02 ට්‍රැක්ටර්**	**වෙලර්**	**වෙනත්**
ගාල්ල	05	07	01	12
මුලතිව්	-	-	-	17
එකතුව	05	07	01	29

4.5. පවරා දුන් ට්‍රැක්ටර් ගණන

ට්‍රැක්ටර් යන්ත්‍ර පවරා දීමේ දී භාවිතා කරනු ලබන ලිපි ලේඛන සහ පවරා දීමේ ක්‍රියාපටිපාටිය.

4.5.1. අදාළ දිස්ත්‍රික් කාර්යාලයේ නියෝජ්‍ය/ සහකාර කොමසාරිස් විසින් ට්‍රැක්ටරය අදාළ ගොවි සංවිධානය වෙත / ගොවි සංවිධාන සාමාජිකයා වෙත පවරා දෙන මෙන් කරනු ලබන ලිඛිත ඉල්ලීම සමඟ පහත සඳහන් ලේඛන සම්පූර්ණ කර ප්‍රධාන කාර්යාලය එවා තිබිය යුතු ය.

i. ගිවිසුම් ප්‍රකාරව ට්‍රැක්ටරය පාවිච්චි කර ඇති බවටත් සම්පූර්ණ වාරික මුදල ම ප්‍රධාන කාර්යාලය වෙත ගෙවා ඇති බවටත් ගොවිජන සංවර්ධන නිලධාරීගේ නිර්දේශය.
ii. සම්පූර්ණ වාරික මුදල ම ගෙවා අවසන් බව තහවුරු කිරීම සඳහා අදාළ ට්‍රැක්ටරය සඳහා වාරික ගෙවීමට අදාළ ව ප්‍රධාන කාර්යාලය වෙත එවන ලද චෙක්පත් විස්තර වාර්තාව (චෙක්පත් අංකය, දිනය, වටිනාකම, කුවිතාන්සි අංකය හා දිනය යන විස්තර).
iii. අදාළ පාර්ශ්වකරුගේ ජාතික හැඳුනුම්පතේ සහතික කරන ලද ඡායා පිටපත.
iv. ට්‍රැක්ටරය භාර දීමට අදාළ ගිවිසුමේ පිටපත.
v. අවසන් වරට ලබා ගෙන ඇති වාර්ෂික ආදායම් බලපත්‍රයේ පිටපත.
vi. නිවැරදිව පුරවන ලද එම්.ටී.ඒ 06 පෝරම් කට්ටලය.

4.5.2. ඉහත ලිපි ලේඛන සම්පූර්ණ වන්නේ නම්, වාරික ගෙවීම් නිසි පරිදි ප්‍රධාන කාර්යාලය වෙත ප්‍රේෂණය කර ඇත්දැයි අංශයේ අදාළ පොත්පත් (වාරික අයවීම් ලේඛනය, ලැබුණු චෙක්පත් ලේඛනය, සරප් අංශය ට යොමු කරන ලේඛනය) හා සසඳා චෙක්පත් අගරු වී ඇත් දැයි නිවැරදි ව තහවුරු කර ගැනීම පිණිස වාරික අයවීම් වාර්තාව ගිණුම් අංශය වෙත යොමු කිරීම.

4.5.3. අස්ථානගත වී ඇති හෝ ලියාපදිංචි අංකයක් සඳහන් නොවන ට්‍රැක්ටර් රථ සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මඟින් අනු පිටපතක් ලබා ගැනීම ට කටයුතු කිරීම.

4.5.4. තහවුරුව ලද පසු, ට්‍රැක්ටර් රථය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව ට අයත් නම්, ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් ද, එම රථය කෘෂිකර්ම අමාත්‍යාංශය ට අයත්

නම්, එහි ලියාපදිංචි සහතිකය සමඟ එම්.ටී.ඒ. 06 පෝරම කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් වෙත ට යොමුකර අත්සන් කරවා ගත යුතු ය.

4.5.5. එම්.ටී.ඒ. 06 පෝරම අත්සන් තැබීමෙන් පසු,

i. ලියාපදිංචි සහතිකයේ මුල් පිටපත සමඟ එම්.ටී.ඒ 06 කට්ටලයේ "බී" සහ "බී 01" පෝරම්, ප්‍රධාන කාර්යාලය විසින් නිකුත් කරනු ලබන, පවරා දීමේ ඉදිරි කටයුතු සඳහා උපදෙස් ඇතුළත් ලිපිය සමඟ දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර කොමසාරිස් වෙත යොමු කිරීම.
   - පිටපත් - කෘෂිකර්ම අමාත්‍යාංශයට, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්ට, අදාළ ගොවි මහතාට

ii. එම්.ටී.ඒ. 06 කට්ටලයේ "ඒ" පෝරමය, ප්‍රධාන කාර්යාලය විසින් නිකුත් කරනු ලබන ලිපිය සමඟ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් වෙත යොමු කිරීම.
   - පිටපත් - අදාළ දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර කොමසාරිස් ට, අදාළ ගොවි මහතාට

4.5.6. අදාළ ගොවි මහතා ට ආදායම් බලපත්‍රය ලබා ගැනීම සඳහා ලිපි නිකුත් කිරීම.

i. අදාළ ට්‍රැක්ටර් රථය ලියාපදිංචිකර ඇත්තේ ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ නම්, කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිර්දේශය සහිත ලිපිය සමඟ ගො.සං.දෙ විසින් නිකුත් කරනු ලබන අදාළ ලිපිය ලබා දීම.

ii. අදාළ ට්‍රැක්ටර් රථය ලියාපදිංචිකර ඇත්තේ ගො.සං.කො. ජනරාල් නමින් නම්, අප දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරනු ලබන අදාළ ලිපිය ලබා දීම.

4.5.7. ට්‍රැක්ටර් අයිතිකරු විසින් අදාළ ලේඛන, ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය මඟින් තමා වෙත ලබා ගෙන, ඒවා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් වෙත යොමු කර, පවරා ගැනීමේ ක්‍රියාවලිය අවසන් කිරීම.

	දිස්ත්‍රික්කය	**පවරා දුන් ට්‍රැක්ටර් ගණන**
		2018.01.01 – 2018.12.31
1	කොළඹ	00
2	ගම්පහ	01
3	කළුතර	00
4	මහනුවර	00
5	මාතලේ	00
6	නුවරඑළිය	00
7	ගාල්ල	01
9	හම්බන්තොට	08
10	යාපනය	05
11	කිලිනොච්චි	14
12	මන්නාරම	00
13	වවුනියාව	00
14	මුලතිව්	07
15	මඩකළපුව	04
16	අම්පාර	03
17	ත්‍රිකුණාමලය	13

	දිස්ත්‍රික්කය	පවරා දුන් ට්‍රැක්ටර් ගණන
		2018.01.01 – 2018.12.31
18	කුරුණෑගල	07
19	පුත්තලම	03
20	අනුරාධපුරය	01
21	පොළොන්නරුව	01
22	බදුල්ල	05
23	මොණරාගල	06
24	රත්නපුරය	02
25	කෑගල්ල	07
එකතුව		**88**

4.6. වාර්ෂික ගිණුම් වාර්තා

2017 වර්ෂයේ වාර්ෂික ගිණුම් වාර්තා 2018.12.31 දක්වා 01 ක් ලැබී ඇති අතර ඉතිරි හිඟ ගිණුම් වාර්තා සියල්ල ගෙන්වා ගැනීමට දිස්ත්‍රික් මට්ටමින් ලිපි යවා ඇති අතර එම වාර්තා 2019 ජනවාරි 31 ට පෙර ගෙන්වා ගැනීමට කටයුතු යොදා ඇත.

4.7. විගණකාධිපති විගණන විමසුම් 2018

විගණකාධිපති විගණන විමසුම්	සහකාර කොමසාරිස් නමට	කොමසාරිස් ජනරාල් නමට	එකතුව
ලැබීම්	20	07	27
පිළිතුරු යැවීම්	2	0	2
පිළිතුරු යැවිය යුතු	18	07	25

4.8. විශේෂ කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන (උතුරු නැගෙනහිර පළාත් දිස්ත්‍රික්ක 8ක් තුළ)

කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් උතුරු නැගෙනහිර පළාත් සඳහා 2018 අවසන් කාර්තුව තුළ ක්‍රියාත්මක කරන ව්‍යාපෘති අතරට මෙම විශේෂ කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන අයත් වේ. මේ සඳහා රුපියල් මිලියන 49.547ක මුදලක් අමාත්‍යාංශය විසින් වෙන් කළ අතර ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන ලදී .

මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම්,

- නිෂ්පාදනය වැඩි කිරීම සඳහා ගුණාත්මක බීජ නොමිලේ සැපයීම- (උඳු, මුං, සෝයා බෝංචි, කුරක්කන්, මිරිස්.)
- ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය සැපයීම (පළතුරු පැල) පැපොල්, කෙසෙල්, දෙහි, දෙළුම්, පේර, කොස්, බෙලි, දිවුල්.
- පත්‍ර වර්ණ දර්ශක (Leaf Colour Charts) නොමිලේ ලබා දීම තුළින් පොහොර භාවිතා කිරීමේ කාර්යක්ෂමතාව වැඩි කිරීම.
- ගෙවතු වගාවක් ලෙස මිරිස් වගාව ප්‍රවර්ධනය සඳහා වගා මලු සැපයීම.
- වාණිජ අඹ වගාව සඳහා අඹ පැල සැපයීම.

- කෘෂි නිපැයුම් වැඩි කිරීම සඳහා 50% සහනාධාර යටතේ සූර්ය බල ශක්ති වතුර පොම්ප ලබා දීම.

4.9. 2018 යල කන්නයේ කීඩෑ හා පුරුක් පණු හානි සිදුවූ කුඹුරු සඳහා බීජ වී සහනාධාරයක් ලබා දීම

වී වගාව කෙරෙහි හානි පමුණුවන ප්‍රධාන පළිබෝධකයන් දෙදෙනකු ලෙස කීඩෑවා හා කහ පුරුක් පණුවා හැඳින්විය හැකිය. කීඩෑ හා පුරුක් පණු හානි ඉතා ශිඝ්‍රයෙන් ව්‍යාප්ත වීම නිසා ගොවිතැනට විශාල හානියක් සිදුව ඇති අතර අස්වැන්න ද නොලැබී යාමෙන් ගොවීන් දැඩි දුෂ්කරතාවයට පත්ව ඇත. මෙම තත්ත්වය හේතුවෙන් අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 2018 යල කන්නයේ කීඩෑ හා පුරුක් පණු හානි සිදු වූ කුඹුරු හිමි ගොවීන් සඳහා බිත්තර වී සහනාධාර ලබා දීම සිදු කරන ලදී.

දැනට පොළොන්නරුව දිස්ත්‍රික්කයට පමණක් රු.මි.69.74 ක මුදලක් ලබා දී ඇති අතර ඉතිරි දිස්ත්‍රික්කයන් සඳහා මුදල් ගෙවීමට තොරතුරු ලබා ගෙන ඇත. තවද වෙන් කරන ලද මුදල් ප්‍රමාණවත් නොවන බැවින් අතිරේක ප්‍රතිපාදන ලේකම් කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් ඉල්ලීමක් කර ඇත.

වැය ශීර්ෂය	දිස්ත්‍රික්කය	වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි.)
118-02-03-20-2509	පොළොන්නරුව, අම්පාර	20.00
118-02-03-37-2506	පොළොන්නරුව, කුරුණෑගල, බදුල්ල, අනුරාධපුරය , වවුනියාව, මන්නාරම, පුත්තලම,මොණරාගල, හම්බන්තොට	24.00
001-2-6-11-2509 ජනාධිපති ලේකම් කාර්යාලය	පොළොන්නරුව	56.00

4.10. ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන ''අපි වවලයි අපි කන්නේ'' කඩිනම් කෘෂිකාර්මික සංවර්ධන වැඩ පිළිවෙළ යටතේ පළතුරු ගම්මාන ස්ථාපිත කිරීම 2018

''අපි වවලයි අපි කන්නේ'' කඩිනම් කෘෂිකාර්මික සංවර්ධන වැඩ පිළිවෙළ යටතේ මුළු දිවයිනම ආවරණය වන පරිදි පළතුරු ගම්මාන ස්ථාපිත කිරීමේ වැඩසටහනක් 2018 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද අතර එකී අරමුණු පහත පරිදි වේ.

වැඩසටහනේ අරමුණු :

- උතුරු පළාත් හැර සෑම ගොවිජන සේවා මධ්‍යස්ථානයක්ම ආවරණය වන පරිදි එක් එක් දේශගුණික කලාප අනුව වගා කළ හැකි පළතුරු වගාව ව්‍යාප්ත කොට දිවයිනේ පළතුරු නිෂ්පාදනය ඉහළ දැමීම.
- මෙරටට ආනයනය කරනු ලබන පළතුරු ප්‍රමාණය සීමා කර විදේශ විනිමය ඉතිරි කර ගැනීම.
- වගා කළ හැකි මුඩු ඉඩම් කාර්යක්ෂමව වගාවට යොමු කිරීමත්, පළතුරු නිෂ්පාදනය වැඩි කිරීම තුළින් ගොවීන්ගේ ආදායම් තත්ත්වය ඉහළ නැංවීම, පළතුරු වගා කිරීම සඳහා උනන්දුවක් දක්වන ගොවීන්ට සහන සැලසීම වස් පළතුරු පැළ නොමිලේ ලබා දීමත්, පළතුරු පරිභෝජනය වැඩි කිරීම තුළින් ජනතාවගේ පෝෂණ තත්ත්වය නංවාලීමත් මෙම වැඩසටහනේ සෙසු අරමුණු විය.
- මේ සඳහා රුපියල් මිලියන 50ක මුදලක් වෙන් වූ අතර ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන ලදී.

දෙපාර්තමේන්තුව විසින් හඳුන්වාදෙන ලද අයදුම්පත්‍රයක් මඟින් ගම්මාන මට්ටමින් ප්‍රතිලාභීන් හඳුනා ගැනීම මඟින් සිදු කරන ලද කරන අතර ඒ අනුව දිස්ත්‍රික් මට්ටමේ ප්‍රතිලාභ නාම ලේඛනය සකස් කර ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාල මඟින් විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි පැළ තවාන්වලින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිර්දේශිත පළතුරු පැළ මිලදී ගැනීම සහ එම පැළ අදාළ ගොවීන් වෙත බෙදා හැරීමටත් කටයුතු කර ඇත

4.11. ගොවි සංවිධාන අතුරු ව්‍යවස්ථාව

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ගොවි සංවිධාන ක්‍රියාත්මකවන ආකාරය, පවත්වාගෙන යනු ලබන ආකාරය, නීති රීති හා රෙගුලාසි ඇතුළත් කරමින් ගොවි සංවිධානයේ අරමුණු, පරමාර්ථ හා කාර්යයන් විධිමත්ව සපුරා ගැනීමට අවශ්‍ය මඟ පෙන්වීම ලබාදෙමින් ගොවි සංවිධාන අතුරු ව්‍යවස්ථාව සකස් කිරීමේ ආදර්ශයක් ලෙස ගොවි සංවිධාන අතුරු ව්‍යවස්ථාව 1991 අංක 04 දරන ගොවිජන සේවා (සංශෝධිත) පනත යටතේ 1991 දී සකස් කර තිබුණි.

2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත යටතේ ගොවි සංවිධාන සඳහා ආදර්ශ අතුරු ව්‍යවස්ථාවක් 2018 වර්ෂය වන තෙක්ම සකස් කර නොතිබුණු අතර 2018 වර්ෂයේ දී නව පනත යටතේ වඩාත් කාර්යක්ෂමව කටයුතු ඉටුකරගෙන යාම සඳහා ගොවි සංවිධාන අතුරු ව්‍යවස්ථාවක් එළිදක්වන ලදී.

4.12. කෘෂිකාර්මික ප්‍රතිපත්තිවලට අනුකූලව කෘෂිකාර්මික ඉඩම් යෙදවීම හා පුරන් කුඹුරු වගා කරවීම.

2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ ii කොටසේ විධිවිධාන ක්‍රියාත්මක කර දීර්ඝ කාලයක් තිස්සේ වගා නොකළ හෝ ඵලදායී ලෙස වගා නොකළ කුඹුරු ඉඩම් වගා කරවීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්යයක් වන අතර මීට අදාළ නීතිමය කටයුතු දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට 17/2018 චක්‍රලේඛය 2018.08.01 දින නිකුත් කරමින් අඛණ්ඩ ක්‍රමවේදයක් තුළින් පුරන් කුඹුරු වගාවට යෙදවීමට විධිමත් සැලසුමක් 2018/19 මහ කන්නයේ සිට ක්‍රියාත්මක කරන ලදී.

ඉහත ක්‍රමවේදය හා 2018.10.18 සිට 2018.10.31 දක්වා දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කරන ලද විශේෂ වැඩසටහන හා ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන යටතේ 2018 වර්ෂයේ පුරන් කුඹුරු වගා කිරීමේ සතුටුදායක තත්ත්වයක් වාර්තා වූ අතර කුඹුරු ඉඩම් අක්කර 16,150 ක කැබලි 14,868 ක් වී වගාව කරන ලදී.

තවද අනුරාධපුර දිස්ත්‍රික්කයේ පුරන් කුඹු ගණයට නොවැටෙන නමුත් අඛණ්ඩව කන්න හයක් පමණ නියඟය හා අඩු ජල පහසුකම් හේතුවෙන් වගා කිරීමට නොහැකිව තිබූ කුඹුරු ඉඩම් අක්කර 33,149 ක් වගාවට යෙදවීමට 2018 වර්ෂයේ මහ කන්නයේ හැකියාව ලැබීම දෙපාර්තමේන්තුව ලද ජයග්‍රහණයකි.

කාලගුණ විපර්යාස නිසා රටේ ආහාර නිෂ්පාදනයට දැඩි බලපෑම් එල්ලවන වකවානුවක ඊට සාර්ථකව මුහුණදීම සඳහා 19/2018 චක්‍රලේඛය 2018.08.27 දින නිකුත් කරමින් පුරන් කුඹුරු වර්ගීකරණය තුළ වී වගා කළ නොහැකි නමුත් වෙනත් කෘෂිකාර්මික බෝග වගා කළ හැකි බවට හඳුනා ගත් පුරන් කුඹුරුවල එකී වගාවන් සිදු කිරීමට පුද්ගලයින් දිරිමත් කරමින් ඒ සඳහා ලිහිල් නීති ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී. ඒ අනුව කුඹුරු ඉඩම් අක්කර 2,263 ක් සඳහා වෙනත් කෘෂිකාර්මික බෝග වගා කිරීමට අවසර ලබා දී ඇත.

4.13. ග්‍රාමීය මට්ටමේ බීජ වී ගොවිපලවල් 2018 යල හා 2018/19 මහ

2018-2020 ජාතික වගා සංග්‍රාම වැඩ පිළිවෙළ අතිගරු ජනාධිපතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලද අතර, ඒ අනුව යමින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හමුවේ ඇති ප්‍රබල අභියෝගයක් වන්නේ ශ්‍රී ලංකාවේ වී වගා කළ හැකි දැනට පුරන්ව ඇති සියලුම කුඹුරු ඉඩම්වල වී වගාව සඳහා නැවත යොමු කිරීමයි.

එබැවින් 2018 යල කන්නයේ හා 2018/19 මහ කන්නයේ මෙම ඉලක්කය ජය ගැනීමට හැකි වන පරිදි සෑම කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරයකු විසින්ම තම වසමේ බීජ වී අවශ්‍යතාව සපුරාලනු වස් තම බල ප්‍රදේශයට ගැළපෙන වී වර්ගයක් තෝරා ගෙන බීජ වී ගොවිපලක් පවත්වාගෙන යා යුතු ලෙස දැනුම් දුන් අතර එහි 2018 වර්ෂයේ ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.

දිස්ත්‍රික්කය	2018 **යල කන්නය**		2018/19 **මහ කන්නය**	
	ගොවීන් සංඛ්‍යාව	**වගා කළ කුඹුරු අක්කර ප්‍රමාණය**	**ගොවීන් සංඛ්‍යාව**	**වගා කළ කුඹුරු අක්කර ප්‍රමාණය**
01. කොළඹ	61	97	63	99
02. ගම්පහ	215	215	90	151
03. කළුතර	214	233	254	254
04. මහනුවර	214	173	224	204
05. මාතලේ	155	173	17	10
06. නුවරඑළිය	-	-	20	25
07. ගාල්ල	85	120	38	47
08. මාතර	42	49	42	53
09. හම්බන්තොට	214	325	-	-
10. කුරුණෑගල	574	670	686	670
11. පුත්තලම	164	117	82	165

දිස්ත්‍රික්කය	2018 යල කන්නය		2018/19 මහ කන්නය	
	ගොවීන් සංඛ්‍යාව	වගා කළ කුඹුරු අක්කර ප්‍රමාණය	ගොවීන් සංඛ්‍යාව	වගා කළ කුඹුරු අක්කර ප්‍රමාණය
13. කෑගල්ල	220	189	40	47
14. බදුල්ල	224	211.5	-	-
15. මොණරාගල	-	-	-	-
16. අනුරාධපුර	204	271	-	-
17. පොළොන්නරුව	308	670.25	-	-
18. අම්පාර	-	-	-	-
19. යාපනය	-	-	50	119
20. වවුනියාව	-	-	20	15
21. ත්‍රිකුණාමලය	-	-	-	-
22. මඩකළපුව	13	290	-	-
23. මන්නාරම	-	-	-	-
24. කිළිනොච්චි	-	-	-	-
25. මුලතිව්	27	45	-	-
එකතුව	**3,089**	**3,959.75**	**1,756**	**1,947**

4.14. "කෙතට අරුණ'' පොහොර සහනාධාර වැඩසටහන

කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් මෙහෙයවනු ලබන පොහොර සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පහත පරිදි දැක්විය හැකිය.

- 2016 යල කන්නයේ සිට 2017/18 මහ කන්නය දක්වා **පොහොර සහනාධාර මුදල් වැඩසටහන** ක්‍රියාත්මක වූ අතර, ඒ අනුව 2017/18 මහ කන්නයට අදාළ පොහොර සහනාධාර මුදල් වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පහත පරිදි දැක් වේ.

4.14.1. පොහොර සහනාධාර (මුදල්) වැඩසටහන පිළිබඳ තොරතුරු - 2017/18 මහ

කන්නය	පොහොර ලබාගත් ගොවීන් සංඛ්‍යාව	වගා කරන ලද කුඹුරු හෙක්ටයාර ප්‍රමාණය	ලබා දුන් සහනාධාර මුදල
2017 / 2018 මහ	880,859	634,457.00	රු.මි.8,004.77

- 2018 යල කන්නයේ සිට **සහනාධාර පොහොර වැඩසටහන** නැවත ක්‍රියාත්මක කළ අතර, ඒ අනුව 2018 යල හා 2018/19 මහ කන්නවලට අදාළව සහනාධාර පොහොර වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පහත සඳහන් පරිදි දැක්විය හැකිය.

4.14.2. "කෙතට අරුණ" පොහොර සහනාධාර වැඩසටහන යටතේ පොහොර නිකුත් කිරීම පිළිබඳ තොරතුරු

කන්නය	පොහොර ලබාගත් ගොවීන් සංඛ්‍යාව	කුඹුරු අක්කර ප්‍රමාණය	නිකුත්කරන ලද පොහොර ප්‍රමාණය (මෙ.ටො.)			
			යූරියා	T.S.P.	M.O.P.	එකතුව
2018 යල (2018.04.01 සිට 2018.09.30 දක්වා)	578,687	868,029.33	71,403.58	17,570.26	23,982.66	112,956.50
2018/19 මහ (2018.10.01 සිට 2019.03.31 දක්වා)	912,786	1,631,868.00	127,890.78	31,052.41	37,065.64	196,008.83

4.15. " අපි වවලයි අපි කන්නේ " කොස් පැළ දස ලක්ෂයක් රෝපණය කිරීමේ විශේෂ වැඩසටහන 2018

"අපි වවලයි අපි කන්නේ" ජාතික කෘෂිකාර්මික වැඩසටහන යටතේ ආහාර සුරක්ෂිතතාව ඇති කිරීමේ අරමුණ පෙරදැරි කරගෙන දිවයින පුරා කොස් පැළ ලක්ෂ 10 ක් රෝපණය කිරීම මෙම වැඩසටහනේ මූලික අරමුණ විය. ශ්‍රී ලංකා හදබිම අධිකාරිය සමඟ එක් ව ක්‍රියාත්මක කරන ලද මෙම වැඩසටහන සඳහා අප දෙපාර්තමේන්තුව මඟින් කොස් පැළ ලක්ෂ 5 ක් බෙදා දීමට සැලසුම් කරන ලදී.

කොස් පැළ සකස් කිරීමේ ප්‍රගතිය

අනු අංකය	දිස්ත්‍රික්කය	දිස්ත්‍රික්ක වෙත ලබා දුන් ඉලක්කය	සකස් කර ඇති පැළ සංඛ්‍යාව	රෝපණය කර ඇති පැළ සංඛ්‍යාව
01	කොළඹ	10,000	10,000	2,582
02	කළුතර	30,000	13,092	1,038
03	ගම්පහ	50,000	18,555	18,555
04	මහනුවර	54,720	54,720	51,722
05	මාතලේ	20,000	20,150	8,525
06	නුවරඑලිය	10,200	10,200	10,200
07	කුරුණෑගල	60,000	56,419	56,315
08	පුත්තලම	10,000	12,763	12,763
09	ගාල්ල	50,000	30,250	30,250
10	මාතර	50,000	22,600	5,200
11	හම්බන්තොට	10,000	5,700	5,700
12	රත්නපුරය	36,000	21,377	21,377
13	කෑගල්ල	50,420	28,719	26,838

අනු අංකය	දිස්ත්‍රික්කය	දිස්ත්‍රික්ක වෙත ලබා දුන් ඉලක්කය	සකස් කර ඇති පැළ සංඛ්‍යාව	රෝපණය කර ඇති පැළ සංඛ්‍යාව
14	බදුල්ල	20,000	20,850	20,850
15	අනුරාධපුරය	22,840	23,130	19,322
16	පොළොන්නරුව	5,000	4,900	4,900
17	මොණරාගල	5,000	9,000	8,800
18	අම්පාර	5,000	4,535	4,535
19	යාපනය	5,000	4,446	4,446
20	කිළිනොච්චිය	5,000	3,025	3,025
21	මුලතිව්	5,000	4,600	1,025
22	මඩකළපුව	5,000	5,100	5,100
23	ත්‍රිකුණාමලය	5,000	5,535	5,187
24	මන්නාරම	5,000	5,000	5,000
25	වවුනියාව	5,000	890	890
	එකතුව	**534,180**	**395,556**	**334,145**

4.16. "නිසල ගොවිදනට බුහුමන්" වැඩසටහන - 2018

ලේ, දහඩිය, කඳුළු වගුරවමින් අනේකවිධ දුක්ගැහැට විඳිමින් රටට බත සපයා දී අප අතරින් වියෝවූ සියලු ගොවිදනට කෘතවේදීත්වය පලකරනු වස් ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සහ ගොවි ජනතාව සම්බන්ධ කරගෙන ධර්ම දේශනා පැවැත්වීම, පිරිත් සජ්ඣායනය පැවැත්වීම, දානමය පුණ්‍යකර්ම සංවිධානය වැනි එක් එක් ආගම් මුල්කරගෙන විවිධ ආගමික වැඩසටහන් පැවැත්වීම මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක විය. ඒ යටතේ දිවයින පුරා ක්‍රියාත්මක වූ වැඩසටහන් සංඛ්‍යාව පහත දැක්වේ.

අනු අංකය	දිස්ත්‍රික්කය	පැවැත් වූ ආගමික වැඩසටහන් සංඛ්‍යාව
1	කොළඹ	09
2	කළුතර	20
3	ගම්පහ	26
4	මහනුවර	45
5	මාතලේ	05
6	නුවරඑලිය	06
7	කුරුණෑගල	56
8	පුත්තලම	18
9	ගාල්ල	33
10	මාතර	23
11	හම්බන්තොට	24
12	රත්නපුරය	42
13	කෑගල්ල	14
14	බදුල්ල	31
15	අනුරාධපුරය	41

අනු අංකය	දිස්ත්‍රික්කය	පැවැත් වූ ආගමික වැඩසටහන් සංඛ්‍යාව
16	පොළොන්නරුව	12
17	මොණරාගල	18
18	අම්පාර	03
19	යාපනය	23
20	කිළිනොච්චිය	08
21	මුලතිව්	17
22	මඩකළපුව	17
23	ත්‍රිකුණාමලය	06
24	මන්නාරම	12
25	වවුනියාව	04
	එකතුව	**513**

4.17. "අපි වවලයි අපි කන්නේ" ජාතික කෘෂිකාර්මික ක්‍රියාන්විතය 2018 - 2020 "වැව් දහසක් ගම් දහසක්" වැඩසටහන

අතිගරු ජනාධිපතිතුමාගේ මහපෙන්වීම යටතේ හා ගරු කෘෂිකර්ම අමාත්‍යතුමාගේ සංකල්පනාවක් පරිදි ''අපි වවලයි -අපි කන්නේ'' යන තේමාව යටතේ ක්‍රියාත්මක වන රජයේ තුන් අවුරුදු කඩිනම් කෘෂිකාර්මික වැඩපිළිවෙළේ එක් අංගයක් වන ''වැව්-දහසක් - ගම් දහසක්'' වැඩසටහන මේ වන විට ආරම්භ කොට ඇති අතර, මේ යටතේ ඉදිරි වර්ෂ තුන තුළ වැව් දහසක් හා ඒ ආශ්‍රිත ගම්මාන දහසක් සංවර්ධනය කිරීමට නියමිත ය.

තෝරාගත් වැව් ආශ්‍රිත ගම්මානවල වැව හා වාරි පද්ධතිය සංවර්ධනය කරමින් කෘෂිකර්මාන්තය නහා සිටුවීම, ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය, සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම හා ග්‍රාමීය ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය කිරීම මඟින් ඔවුන්ගේ සමාජ, ආර්ථික, සංස්කෘතික හා අධ්‍යාත්මික ප්‍රවර්ධනයක් ඇති කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ විය. සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ තීරණ ගැනීමේ දී ග්‍රාමීය ජනතාවගේ ක්‍රියාකාරී සහභාගීත්වය ලබා ගනිමින් ඔවුන්ගේ ජීවන තත්ත්වය නහා සිටුවීම සඳහා කෘෂිකාර්මික නිෂ්පාදන වැඩිදියුණු කිරීම, දුප්පත්කම තුරන් කිරීම, සමාජ අසමානතාව අඩු කිරීම, ග්‍රාමීය ජනතාවගේ ස්ව ශක්තිය නහා සිටුවීම, ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, ග්‍රාමීය නිෂ්පාදන සඳහා වෙළඳපලක් ඇති කිරීම ග්‍රාමීය ප්‍රදේශවල නව නිෂ්පාදන බිහි කිරීම, අවාසි සහගත සහ ඉහළ අවදානම් සහිත ජන කණ්ඩායම්වලට සුභසාධනය ලබා දීම තුළින් ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම ආදිය ද මෙම වැඩසටහනේ ප්‍රමුඛ අපේක්ෂාවන් විය.

- ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය.
- වැව ආශ්‍රිත සංවේදී පරිසර පද්ධතිය තුළ ගස් සිටුවීම.
- ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- "සිතමු" කාන්තා වැඩසටහන ශක්තිමත් කිරීම.
- ''සරු පිරි ගෙවත්ත'' සංකල්පය ක්‍රියාත්මක කිරීම.
- ''සුපසන් නිවස'' වැඩසටහන.
- වෙනත් ප්‍රජා මූලික අවශ්‍යතා සම්පූර්ණ කිරීම.
- වගා බිම්වල පාංශු සෞඛ්‍යය මැනීම හා පාංශු සෞඛ්‍යය කාඩ්පත් හඳුන්වා දීම.
- ජලාශවල මිරිදිය මසුන් ඇති කිරීම.

- කෘෂිකාර්මික ඉඩම් කාර්යක්ෂම වගාව.
- බෝග ජල අවශ්‍යතාව මත වාරි ජලය සැපයීම.
- "නිසල ගොවිදනට බුහුමන්" වැඩසටහන.
- ගොවි හැදුනුම්පත් නිකුත් කිරීම.
- පොහොර සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- ජල ප්‍රමිතිය මැනීම යටතේ වැවේ, ජල මාර්ග වල වගා ලිං වල ජල ප්‍රමිතිය මැනීම
- ගොවි සංවිධාන ප්‍රතිව්‍යුහගත කිරීම.
- ගොවි සංවිධාන පුහුණු / කෘෂි ව්‍යාපෘති සම්බන්ධ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ගොවි නිෂ්පාදන අලෙවි කිරීම සඳහා අලෙවි පහසුකම් වැඩිදියුණු කිරීම.
- වෙනත් සමාජ සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

05. ප්‍රවාහන අංශය

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සහ ඒ යටතේ පවතින දිස්ත්‍රික් කාර්යාලයන්හි ප්‍රවාහන අවශ්‍යතා සහ සේවාවන් කාර්යක්ෂමව සපුරා දෙමින් ආයතනික මෙහෙවර සාක්ෂාත් කර ගැනීමට උපරිම සේවය ලබාදීම අප අංශයේ ප්‍රධාන අරමුණ හා වගකීම වේ. විශේෂයෙන්ම 2018 වර්ෂයේ දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන ලද සියලුම සංවර්ධන වැඩ සටහන් ගොවිජන සංවර්ධන පනතේ නීතිමය කාර්යයන් සඳහා මෙන්ම ගුවන්විදුලි හා රූපවාහිනී වැඩසටහන් සඳහා ගොවි බැංකුවේ ප්‍රවාහන අවශ්‍යතා සපුරා දෙන ලදී. එමෙන්ම පරිපාලනය මඟින් පැවරෙන විවිධ නිල ප්‍රවාහන කටයුතු සඳහා ප්‍රවාහන අංශය මඟින් විශාල දායකත්වයක් ලබා දෙන ලදී. රාජකාරි සඳහා සැහැල්ලු වාහන (ජීප්, ද්විත්ව වැන්, මෝටර් කාර්) ඇතුළුව ලොරි, ටෙන්වීල්, ප්‍රයිම් වර් රථ හා ක්‍රේන් ට්‍රක් රථ ඇතුළත්ව ධාවනයේ යෙදෙන වාහන 158 ක් පමණ වන දෙපාර්තමේන්තුව සතු වාහන ප්‍රවාහනයට යොදවා ගන්නා ලද අතර එම වාහන අතුරින් අවු.20 ක් අධික පැරණි වාහන අලුත්වැඩියාවන් හා නඩත්තු කටයුතු ඉටුකර ගනිමින් මෙම සංවර්ධන හා සෙසු කාර්යයන් බාධාවකින් තොරව ඉටුකිරීමට පහසුකම් සැලසීම කරන ලදී.

මෙම කාර්යයන්ට අමතරව ප්‍රවාහන අංශයේ ප්‍රධාන කාර්යයන්,

1) ප්‍රධාන කාර්යාලයේ හා සියලුම දිස්ත්‍රික් කාර්යාලවල ඇති වාහනවල අලුත්වැඩියාවන්.
2) වාහන අනතුරු සම්බන්ධව මු.රෙ. අනුව නීතිමය කටයුතු කිරීම.
3) හානි හා පාඩු ලේඛන පවත්වා ගෙන යෑම.
4) විසර්ජන ගිණුම් පිළියෙළ කිරීම.
5) ධාවන සටහන් ලේඛන පරීක්ෂාව හා විගණනයට ඉදිරිපත් කිරීම.
6) විගණන විමසුම් සඳහා පිළිතුරු සැකසීම.
7) වාහන රක්ෂණය.
8) නිදහස් ආදායම් බලපත්‍ර ලබා ගැනීම.
9) වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් සෑදීම.
10) ඉන්ධන නිකුත් කිරීම, බිල්පත් පියවීම.
11) අලුත්වැඩියාවන්ට සම්බන්ධ ලොග් සටහන් පොත් පවත්වාගෙන යෑම.
12) නව වාහන ලබා ගැනීම සඳහා කටයුතු කිරීම.
13) රියදුරු/ රිය සහයකයන්ගේ නිවාඩු සැකසීම හා අතිකාල ගමන් වියදම්පත් පරීක්ෂාව.
14) නිලධාරීන්ට වෙන්කළ වාහන සඳහා මාසික ඉන්ධන ගාස්තු ගෙවීමට වවුචර් පිළියෙළ කිරීම.
15) නිල වාහන සඳහා ලබා ගන්නා අතිරේක ඉන්ධන වෙනුවෙන් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම.
16) ඉන්ධන අත්තිකාරම් ගෙවීම හා පියවීම ඉටුකිරීම.
17) පැරණි රථ අපහරණය කර විකිණීම.
18) ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්තුමා විසින් පවරණු ලබන අනෙකුත් කාර්යයන් සිදු කිරීම.

ඉහත කාර්යයන් කාර්යක්ෂමව හා කඩිනම්ව සිදු කිරීම සඳහා ප්‍රවාහන අංශය තුළ සේවය කරන නිලධාරීන් හා කනිෂ්ට සේවයේ නිලධාරීන් ප්‍රමාණාත්මක වශයෙන් පහත දක්වා ඇත.

තනතුර	නිලධාරීන් ප්‍රමාණය
සහකාර කොමසාරිස් (යාන්ත්‍රික)	01
සංවර්ධන නිලධාරීන්	01
අභ්‍යාසලාභී සංවර්ධන නිලධාරීන්	02
රාජ්‍ය කළමනාකරණ සහකාර	03
කාර්යාල කාර්ය සහයක	01
රියදුරු	21
රිය සහයක	03

2018 වර්ෂය තුළ ප්‍රවාහන අංශය මඟින් අත්පත් කර ගැනීමට නියමිත වූ ඉලක්ක වනුයේ,

- 2018 වර්ෂය තුළ ප්‍රධාන කාර්යාලයේ හා සියලුම දිස්ත්‍රික් කාර්යාලයන් සතු වාහනවල සිදුකළ යුතු අලුත්වැඩියාවන් සිදු කිරීම
- රු: ලක්ෂ දෙකට වැඩි අලුත්වැඩියාවන් සඳහා කඩිනමින් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීම.
- වාහන අනතුරු සම්බන්ධව කටයුතු කිරීමේදී මු.රෙ. අනුව නීතිමය කටයුතු සිදු කිරීම.
- හානි හා පාඩු ලේඛන පවත්වා ගෙන යෑමට කටයුතු කිරීම.
- විසර්ජන ගිණුම් නිවැරදිව පිළියෙළ කිරීම.
- ලොග් සටහන් පොත් ක්‍රමානුකූලව පවත්වාගෙන යාම.
- රියදුරු, රිය සහයක මහතුන්ගේ ධාවන සටහන් ලේඛන පරීක්ෂා කිරීම සහ විගණනයට ඉදිරිපත් කිරීම.
- විගණන විමසුම් සඳහා පිළිතුරු සැකසීම හා විගණනයට අවශ්‍ය තොරතුරු සැපයීමට බැඳී සිටීම.
- වාහන රක්ෂණය කඩිනම්ව හා ක්‍රමවත්ව සිදු කිරීම.
- නිදහස් ආදායම් බලපත්‍ර ලබා ගැනීම.
- වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් කාර්ය මණ්ඩල සහභාගීත්වයෙන් හා යෝජනාවන්ගෙන් සමන්විතව සකස් කිරීම.
- ඉන්ධන නිකුත් කිරීම හා කඩිනමින් බිල්පත් පියවීමට ක්‍රියා කිරීම.
- නව වාහන ලබා ගැනීම සඳහා කටයුතු කිරීම.
- රියදුරු/ රිය සහයකයන්ගේ නිවාඩු සැකසීම හා අතිකාල ගමන් වියදම්පත් පරීක්ෂා කිරීම.
- නිලධාරීන්ට වෙන්කළ වාහන සඳහා මාසික ඉන්ධන ගාස්තු ගෙවීමට වවුචර් පිළියෙළ කිරීම.
- නිල වාහන සඳහා ලබා ගන්නා අතිරේක ඉන්ධන වෙනුවෙන් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම.
- ඉන්ධන අත්තිකාරම් ගෙවීම හා පියවීම ඉටුකිරීම.
- පැරණි රථ අපහරණය කර විකිණීම.

2018 වර්ෂය ආරම්භයේදී ප්‍රවාහන අංශය මඟින් සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂිත වූ ඉහත ඉලක්කයන් වසර අවසානයේ කොතෙක් දුරට සාර්ථක වී ඇත්ද යන්න සැකවින් පහත පරිදි දක්වා ඇත.

1) නිලධාරීන්ගේ ප්‍රවාහන කටයුතු සිදු කර ඇත. (කොළඹ දිස්ත්‍රික්කය තුළ හා දිවයින පුරා)
2) නිලධාරීන් ප්‍රවාහනය සඳහා පොදු වාහන පහසුකම් සැලසීම.
3) වැව් ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා අධික බරෙන් යුතු බුල්ඩෝසර් සහ එස්කැවේටර් යන්ත්‍ර ප්‍රවාහනය කර ඇත.
4) කෘෂි උපකරණ බෙදා හැරීම සඳහා ප්‍රවාහන පහසුකම් ලබා දී ඇත.
5) අලුත් සහල් මංගල්‍යය සඳහා ලොරි රථ හා අනෙකුත් ප්‍රවාහන පහසුකම් සැලසීම සිදු කර ඇත.
6) නව කැබ් රථ 20ක් ලබා ගැනීම.
7) ප්‍රධාන කාර්යාලයේ හා සියලුම දිස්ත්‍රික් කාර්යාලයන්හි සතු වාහනවල සිදුකළ යුතු අලුත්වැඩියාවන් සිදු කර ඇත.
8) රුපියල් ලක්ෂ දෙකට වැඩි අලුත්වැඩියාවන් සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීම සිදු කර ඇත.
9) වාහන අනතුරු සම්බන්ධව කටයුතු කිරීමේදී මු.රෙ. අනුව නීතිමය කටයුතු සිදු කර ඇත.
10) හානි හා පාඩු ලේඛන පවත්වාගෙන යෑමට කටයුතු කර ඇත.
11) විසර්ජන ගිණුම් නිවැරදිව පිළියෙළ කර ඇත.
12) ලොග් සටහන් පොත් ක්‍රමාණුකූලව පවත්වා ඇත.
13) රියදුරු, රිය සහයක මහතුන්ගේ ධාවන සටහන් ලේඛන පරීක්ෂා කිරීම සහ විගණනයට ඉදිරිපත් කිරීම සිදු කර ඇත.
14) විගණන විමසුම් සඳහා පිළිතුරු සැකසීම හා විගණනයට අවශ්‍ය තොරතුරු ලබා දී ඇත.
15) වාහන රක්ෂණ කටයුතු සිදු කර ඇත.
16) නිදහස් ආදායම් බලපත්‍ර ලබා ගැනීම සිදු කර ඇත.
17) වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් කාර්ය මණ්ඩල සහභාගීත්වයෙන් හා යෝජනාවන්ගෙන් සමන්විතව සකස් කර ඇත.
18) ඉන්ධන නිකුත් කිරීම හා බිල්පත් පියවීමට ක්‍රියා කර ඇත.
19) රියදුරු/ රිය සහයකයන්ගේ නිවාඩු සැකසීම හා අතිකාල ගමන් වියදම්පත් පරීක්ෂා කිරීම සිදු කර ඇත.
20) නිලධාරීන්ට වෙන්කළ වාහන සඳහා මාසික ඉන්ධන ගාස්තු ගෙවීමට වවුචර් පිළියෙළ කිරීම සිදු කර ඇත.
21) නිල වාහන සඳහා ලබාගන්නා අතිරේක ඉන්ධන වෙනුවෙන් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීම සිදු කර ඇත.
22) ඉන්ධන අත්තිකාරම් ගෙවීම හා පියවීම සිදු කර ඇත.
23) පැරණි රථ අපහරණය කර විකුණා ඇත.

ඒ අනුව 2018 වර්ෂය තුළ ක්‍රියාකාරී සැලැස්ම අනුව වර්ෂය තුළ අත්පත් කරගැනීමට නියමිත වූ ඉලක්කයන් 90% ක් පමණ සපුරා ගැනීමට හැකිවිය.

06. නීති අංශය

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ඉඩම්වලින් ප්‍රශස්ත ඵලදායිතාවක් ලබා ගනිමින් ශ්‍රී ලාංකීය ගොවි ජනතාව තිරසර සංවර්ධනයක් සඳහා රැගෙන යාමේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ දර්ශනය මුදුන්පත් කරලීම සඳහා පහත සඳහන් ආකාරයෙන් නීති අංශය එම මෙහෙවරට දායක වේ.

1. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ප්‍රතිපත්තිය සැකසීමට ගොවිජන නීතිය, ඊට අදාළ රීති සකස් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු අමාත්‍යාංශය වෙත ලබා දීම හා සහාය වීම.

2. අඳ ගොවීන් හා ඉඩම් හිමියන් අතර ඇති වන කෘෂිකාර්මික ආරවුල් විසඳීම සඳහා වන නෛතික මඟපෙන්වීම.

3. වගා අයිතිවාසිකම් ආරක්ෂා කරදීම.

4. ග්‍රාමීය වාරි කර්මාන්ත ආරක්ෂා කිරීම හා වගා රීති ක්‍රියාත්මක කිරීමට අදාළ නීතිමය රැකවරණය සැලසීම.

5. දෙපාර්තමේන්තු නිලධාරීන්, ගොවීන් හා ආයතන සඳහා නීතිමය උපදේශනය ලබා දීම.

6. ගොවිජන නීතිය බලගැන්වීම සඳහා අධිකරණමය කාර්යයන්හි නිරත වීම.

ඉහත කාර්යයන් කාර්යක්ෂමව හා කඩිනම්ව ඉටුකිරීම සඳහා නීති අංශය තුළ සේවය කරන නිලධාරීන් හා කනිෂ්ඨ සේවයේ නිලධාරීන් ප්‍රමාණාත්මක වශයෙන් පහත දක්වා ඇත.

තනතුර	නිලධාරීන් ප්‍රමාණය
1. සහකාර කොමසාරිස් (නීති)	01
2. නීති සහකාර	01
3. ශාඛා ප්‍රධානි	01
4. සංවර්ධන නිලධාරි	02
5. රාජ්‍ය කළමනාකරණ සහකාර	05
6. මධ්‍යස්ථාන කළමනාකරණ සහකාර	03
7. කාර්යාල කාර්ය සහායක	02

6.1. 2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත.

2000 අංක 46 දරන පනතට 2011 අංක 46 දරන සංශෝධිත පනත ගෙන ආ අතර එය 2011.11.22 දින සිට ක්‍රියාත්මක වන බැවින් ඒ අනුව අඳ ගොවි අනුප්‍රාප්තිය සඳහා ප්‍රතිපාදන සලසා ඇත. එමඟින් 2000.08.18 දින හෝ ඊට පෙර දිනවල ලිඛිත හෝ වාචික ගිවිසුමක් මත අඳ ගොවි අයිතිවාසිකම් හිමි අයකු මිය ගිය අවස්ථාවකදී අඳ අයිතිය උරුම විය යුතු බව සහ අඳ ගොවියා පූර්ණ දුබලතාවයකට පත් වූ විට අඳ ගොවි අනුප්‍රාප්තිය පැවරීම සඳහා ද ප්‍රතිපාදන සලසා ඇත.

දැනට ක්‍රියාත්මක වන 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත හා 2011 අංක 46 දරන (සංශෝධන) පනත ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන නියෝග සාදා මේ වනවිට ක්‍රියාත්මක වන අතර කාලීනව ඉතාමත් වැදගත් වන කෘෂිකාර්මික ඉඩම් කාර්යක්ෂමව වගා කිරීම සඳහා වන පනතේ 22, 23,

25 සහ 26 වගන්ති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නියෝග සාදා දැනටමත් වගා නොකර පුරන්ව පැවති කුඹුරු ඉඩම් විශාල ප්‍රමාණයක් වගා කෙරෙමින් පවතී. එසේම ගොවිජන සංවර්ධන පනතේ ඉතිරි නියෝග ත්‍රෙ භාෂාවෙන් සකස්කර මේ වනවිට නීති කෙටුම්පත් සම්පාදක වෙත යවා ඇත.

2018 වර්ෂය තුළ නීති අංශය මඟින් අත්පත් කරගැනීමට නියමිත වූ ඉලක්ක වර්ෂය අවසානයේ දී කොතෙක් දුරට සාර්ථකවී ඇත්ද යන්න සැකවින් පහත පරිදි දක්වා ඇත.

6.2. ගොවි ආරවුල් විසඳීම. (ගොවිජන විනිශ්චය සභා/සමාලෝචන මණ්ඩල)

2011 අංක 46 දරන පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත අනුව ඉඩම් හිමියන් විසින් අඳ ගොවීන් නෙරපීම, අඳ ගොවීන් විසින් ඉඩම් හිමියන් වෙත ප්‍රවේණි ගෙවීම පැහැර හැරීම ඇතුළු පනතේ සඳහන් වගන්ති 11 ක් සම්බන්ධයෙන් ගොවිජන විනිශ්චය සභාව මඟින් පරීක්ෂණ පැවැත්විය යුතු ලෙස දක්වා ඇති අතර ගොවිජන විනිශ්චය සභාවල තීරණයට එරෙහිව අභියාචනා කිරීම සඳහා පිහිටුවා ඇති සමාලෝචන මණ්ඩල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නියෝග සාදා ඒ අනුව ගොවිජන විනිශ්චය සභා සහ සමාලෝචන මණ්ඩල මේ වනවිට ක්‍රියාත්මක වෙමින් පවතී.

ගොවිජන විනිශ්චය සභා සඳහා ලැබී ඇති පැමිණිලි

විනිශ්චය සභා සඳහා ලැබී ඇති පැමිණිලි ගණන	යොමුකර ඇති කැඳවීම් ලිපි ප්‍රමාණය	පවත්වා ඇති පරීක්ෂණ ගණන	පවත්වා අවසන් පරීක්ෂණ ගණන	2018.12.31 දිනට ඉතිරි පරීක්ෂණ ගණන
11811	3943	3138	4820	6991

2018.12.31 දිනට සමාලෝචන මණ්ඩලයේ ප්‍රගතිය.

අභියාචනා ගොනු ගණන	විභාග කිරීම සඳහා ඉදිරිපත් කරඇති ගොනු ගණන	නියෝග නිකුත්කර ඇති නඩු	ඉල්ලා අස්කර ගැනීමට ඉල්ලීම් කළ නඩු	ඉදිරි කටයුතු සඳහා පවතින නඩු
450	103	101	09	237

6.3 ගොවි පැමිණිලි (පොදු)

ගොවිජන සංවර්ධන පනත යටතේ ලැබී ඇති පැමිණිලි.

2018 වර්ෂය තුළ ලැබීම්	2018.01.01 දිනට ඉතිරි	2018 වර්ෂය තුළ විසඳීම්	2018.12.31 දිනට ඉතිරි
13422	13808	6539	20691

6.4. අධිකරණ කටයුතුවලට මැදිහත්වීම්

නීතිපති සහාය ලබා ගැනීමට කටයුතු කිරීම

අධිකරණය	පැමිණිලි සංඛ්‍යාව
ශ්‍රේෂ්ඨාධිකරණය	**03**
අභියාචනාධිකරණය	**13**
දිසා අධිකරණය	**10**
මහාධිකරණය	**41**
මහේස්ත්‍රාත් අධිකරණය	**08**
එකතුව	**75**

6.5 කුඹුරු ඉඩම් අනවසරයෙන් ගොඩ කිරීම

කුඹුරු ඉඩම් අනවසරයෙන් ගොඩ කිරීම සම්බන්ධයෙන් දිස්ත්‍රික් මට්ටමෙන් නීතිමය පියවර ගැනීම 2018 වර්ෂය තුළ ප්‍රගතිය පහත දැක්වේ.

- අනවසර ගොඩ කිරීම් /ඉදි කිරීම් සඳහා තහනම් නියෝග ලබා ගත් සංඛ්‍යාව (33 වගන්තිය) - **306**
- වරදට දඬුවම් කිරීම හා යථා තත්ත්වයට පත් කිරීම - (32 වගන්තිය) – **290**
- අවසන් වූ නඩු සංඛ්‍යාව - **195**

6.6. කෘෂිකාර්මික ඉඩම් ලේඛන සම්බන්ධ කාර්යයන්

ගොවිජන සංවර්ධන පනත ක්‍රියාත්මක කිරීමේදී උක්ත පනතේ 53 වගන්තිය කෘෂිකාර්මික ඉඩම් ලේඛන සම්බන්ධයෙන් පනවා ඇති විධිවිධාන ක්‍රියාත්මක කිරීම සහ එම කටයුතු අධීක්ෂණය කිරීම වැදගත් කාර්යයකි. දිවයිනේ සියලුම ගොවිජන සේවා මධ්‍යස්ථාන වල ඇති කෘෂිකාර්මික ඉඩම් ලේඛන (ගොඩ/මඩ) මහජන පරීක්ෂාව සඳහා සෑම වර්ෂයකටම දෙවරක් එනම් ජනවාරි හා ජූලි මාසවල විවෘතව තබන බව පුවත්පත් මඟින් දැනුම් දෙනු ලැබේ. එසේ විවෘතව තැබීමෙන් අනතුරුව ඒ පිළිබඳව ලැබෙන ඉල්ලුම්පත් පරීක්ෂා කර බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම ගොවිජන සේවා කාරක සභාවල වගකීමකි. උක්ත ක්‍රියාවලියේ ප්‍රගතිය පහත ඉදිරිපත් කර ඇත.

කෘෂිකාර්මික ඉඩම් ලේඛන සංශෝධනය.

2018 වර්ෂය තුළ ලැබීම්	පෙර වර්ෂ වල ඉතිරි	පරීක්ෂණ කළ යුතු මුලු ගණන	පරීක්ෂා කර අවසන්	ඉතිරි සංඛ්‍යාව
25258	9423	34681	11667	23014

6.7. නෛතික උපදේශන කාර්යයන්

දෙපාර්තමේන්තු නිලධාරීන් වග උත්තරකරුවන් කරමින් අධිකරණයේ පවරනු ලබන නඩු සම්බන්ධයෙන් නීතිපති සහාය ලබා දීම සහ අවශ්‍ය අවස්ථාවන්හිදී අධිකරණයේ පෙනී සිටීම සිදු කරනු ලැබේ. යම් යම් හේතූන් මත මානව හිමිකම් කොමිෂම මඟින් සහනයක් අපේක්ෂා කරන්නන් සඳහා අවශ්‍ය සහාය ලබාදීම සහ පෙනී සිටීම සිදු කෙරේ.

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා වෙත, මානව හිමිකම් කොමිෂම වෙත අවශ්‍ය අවස්ථාවන්හිදී පෙනී සිටීමින් කරුණු ඉදිරිපත් කිරීම සිදු කරනු ලැබේ. එහි විස්තර පහත දැක් වේ.

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලයට ඉදිරිපත් වූ පැමිණිලි (2018)	02
මානව හිමිකම් කොමිෂමට ඉදිරිපත් වූ පැමිණිලි (2018)	02
පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවට පිළිතුරු සැපයීම (2018)	05
සිවිල් නඩු විධාන සංග්‍රහය (461 වගන්තිය) (2018)	14
අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවට ඉදිරිපත් වූ පැමිණිලි (2018)	01

ඉහත දක්වා ඇති පරිදි 2018 වර්ෂය තුළ ක්‍රියාකාරී සැලැස්ම අනුව අත්පත් කරගැනීමට නියමිත වූ ඉලක්කයන් 90% ක් පමණ සපුරා ගැනීමට හැකිවිය.

07. ගිණුම් අංශය

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි ගිණුම් අංශය ප්‍රධාන අංශ 4 කින් සමන්විත වේ. මුදල් අංශය, ගෙවීම් හා සාරාංශ අංශය, වැටුප් හා අත්තිකාරම් ගිණුම් අංශය හා ප්‍රසම්පාදන අංශය මෙම අංශ හතර වේ. මුදල් අංශය, වාර්ෂික අයවැය ලේඛනය පිළියෙළ කිරීම, අක්මුදල් අවශ්‍යතා ලබා ගැනීම, භාණ්ඩාගාරය සමඟ අදාළ සම්බන්ධීකරණයන් ඉටු කිරීම හා වාර්ෂික විසර්ජන ගිණුම පිළියෙළ කිරීමට අදාළ කාර්යයන් ඉටු කරයි. ගෙවීම් හා සාරාංශ අංශය දෙපාර්තමේන්තුවේ සියලු ගෙවීම් කටයුතු සිදු කිරීම, දිස්ත්‍රික් කාර්යාල 25 හි ගෙවීම් කටයුතු අධීක්ෂණය, මාසික ගිණුම් සාරාංශ ඒකාබද්ධ කර භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම හා පොදු තැන්පත් ගිණුම්වල කටයුතු සිදු කරයි. වැටුප් හා අත්තිකාරම් ගිණුම් අංශයෙන් ප්‍රධාන කාර්යාලයේ වැටුප් හා අත්තිකාරම් ගෙවීම් හා දිස්ත්‍රික් කාර්යාල 25 ට අදාළ වැටුප් හා අත්තිකාරම් ගෙවීම් කටයුතු අධීක්ෂණය කිරීම හා වාර්තා පවත්වා ගැනීම සිදුකරයි. ප්‍රසම්පාදන අංශය ප්‍රධාන කාර්යාලයේ ප්‍රසම්පාදන හා ගබඩා කටයුතු මෙන්ම දිස්ත්‍රික් කාර්යාල 25 ට අදාළ ප්‍රසම්පාදන හා ගබඩා කටයුතු පාලනය හා අධීක්ෂණ කාර්යයන් ඉටු කරයි.

කාර්යභාරය

1. වාර්ෂික විසර්ජන පනතින් බලය ලැබූ වියදම් කළමනාකරණය කිරීම සඳහා මුදල් රෙගුලාසි, අණ පනත්, චක්‍රලේඛනවලට අනුකූලව කටයුතු කරමින් දෛනිකව, මාසික හා වාර්ෂික ගිණුම් වාර්තා නිසි පරිදි පවත්වා ගැනීම.
2. වාර්ෂික වියදම් හා ආදායම් ඇස්තමේන්තු සැකසීම.
3. වත්කම් කළමනාකරණය.
4. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාලවල වැටුප් ණය අත්තිකාරම්, පොදු තැන්පත් ඇතුළු වියදම් මූලධන හා පුනරාවර්තන ගෙවීම් කටයුතු ඉටු කිරීම් හා වියදම් කළමනාකරණය කිරීම.
5. දෙපාර්තමේන්තුවේ හා දිස්ත්‍රික් කාර්යාලවල ප්‍රසම්පාදන කමිටු පත්කිරීම හා ප්‍රසම්පාදන කාර්යයන් ඉටු කිරීම හා අධීක්ෂණය.
6. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමෙන් ණය ගෙවීම්, ඒවා නිසි පරිදි අයකර ගැනීම් හා ඊට අදාළ වාර්තා හා ගිණුම් පවත්වා ගැනීම.
7. දෙපාර්තමේන්තුවෙහි මාසික හා වාර්ෂික ගිණුම් අදාළ කිරීම හා නියමිත වෙලාවට අදාළ ආයතන වෙත ඉදිරිපත් කිරීම.
8. දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් රාජ්‍ය ගිණුම් කාරක සභාවට ඉදිරිපත් කිරීමට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම හා ඊට අදාළ කාර්යයන් ඉටු කිරීම.
9. ගොවිජන සංවර්ධන අරමුදලට අදාළව වාර්ෂික අයවැය ඇස්තමේන්තු අදාළ කිරීම, ලැබීම් හා ගෙවීම් කළමනාකරණය කිරීම හා අවසාන ගිණුම් අදාළ කිරීම .
10. ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් නමින් ලැබෙන සියලුම විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම.

7.1 වර්ෂයේ කාර්යසාධනය

මෙම වර්ෂයේ මෙහෙයුම් වැඩසටහන හා සංවර්ධන වැඩසටහන යන වැඩසටහන් දෙක වෙනුවෙන් දෙපාර්තමේන්තුව වෙත රු.මි. 9,616.89 ක සමස්ත ප්‍රතිපාදනයක් මහා භාණ්ඩාගාරයෙන් වෙන්කර තිබුණි. මෙයින් රු.මි. 6,827 ක් පුනරාවර්තන වැය සඳහා වූ අතර රු.මි. 2,789.89 ක් මූලධන ව්‍යාපෘතීන් සඳහා විය. පුනරාවර්තන හා මූලධන ප්‍රතිපාදනයන් වර්ෂය තුළ දී උපයෝජනය වූ ආකාරය පහත අයුරු වේ.

විස්තරය	ශුද්ධ ප්‍රතිපාදනය (රු.මි.)	වාර්ෂික වියදම (රු.මි.)	ප්‍රතිපාදන ඉතිරිය (රු.මි.)	ශුද්ධ ප්‍රතිපාදනයට සාපේක්ෂව වාර්ෂික වියදම % ලෙස
පුනරාවර්තන	**6827.00**	**6660.00**	**167.00**	**97.55**
1-1 මෙහෙයුම් ක්‍රියාකාරකම්	**487.42**	**394.81**	**92.61**	**81.00**
පුද්ගල පඩිනඩි	388.06	336.13	**51.93**	**86.62**
වෙනත්	99.36	58.67	**40.69**	**59.05**
2-2 සංවර්ධන ක්‍රියාකාරකම්	**6339.58**	**6265.19**	**74.39**	**98.83**
පුද්ගල පඩිනඩි	6073.00	6011.86	**61.14**	**98.99**
වෙනත්	266.58	253.33	**13.25**	**95.03**
මූලධන	**2789.89**	**1325.53**	**1464.36**	**47.51**
1-1 මෙහෙයුම් ක්‍රියාකාරකම්	**91.60**	**51.59**	**40.01**	**56.32**
ගොඩනැගිලි පුනරුත්ථාපන	66.00	28.37	**37.63**	**42.98**
වාහන පුනරුත්ථාපන	18.00	17.84	**0.16**	**99.11**
ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ	4.50	2.84	**1.66**	**63.11**
කල්බදු වාහන සඳහා ණය මුදල ආපසු ගෙවීම	0.60	0.60		**100.00**
පුහුණු හා හැකියා වර්ධන	2.50	1.93	**0.57**	**77.20**
2-2 සංවර්ධන ක්‍රියාකාරකම්	**2698.29**	**1273.94**	**1424.35**	**47.21**
ගොඩනැගිලි පුනරුත්ථාපන	235.49	99.62	**135.87**	**42.30**
යන්ත්‍ර පුනරුත්ථාපන	14.13	11.67	**2.46**	**82.59**
වාහන පුනරුත්ථාපන	8.00	7.02	**0.98**	**87.75**
ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ	22.10	18.02	**4.08**	**81.54**
ගොඩනැගිලි ඉදිකිරීම්	39.01	26.98	**12.03**	**69.16**
පුරන් කුඹුරු අස්වැද්දීම	55.00	16.08	**38.92**	**29.24**
සුළුවාරිමාර්ග පුනරුත්ථාපනය	2024.56	1050.81	**973.75**	**51.90**
එල්ලංහා ව්‍යාපෘතිය	300.00	43.74	**256.26**	**14.58**

2018 වර්ෂයේ දී මූලධන වියදම් සඳහා දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ වෙන්කරන ලද රු.මි.2,789.89 ට අමතරව කෘෂිකර්ම අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ රු.මි.3,144.90 ක් ද අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ රු.මි.104.23 ක් ද ජාතික සමගිය හා සහජීවනය රාජ්‍ය අමාත්‍යාංශය ප්‍රතිපාදන යටතේ රු.මි.501.07 ක් ද ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්‍රතිපාදන යටතේ රු.මි.58.26 ක් ද ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය ප්‍රතිපාදන යටතේ රු.මි.19.85 ක් ද ලෙස රු.මි. 3,828.31 ක් ලැබුණු අතර, ඒ අනුව 2018 වර්ෂයේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ලද රු.මි.6,618.20 ක මූලධන ප්‍රතිපාදන යටතේ දිවයිනේ දිස්ත්‍රික් කාර්යාල 25 ම දායක කර ගනිමින් රටේ සංවර්ධන කාර්යය සඳහා උපයෝජනය කරන ලදී.

2018 වර්ෂයේ දී දෙපාර්තමේන්තු ප්‍රාග්ධන වැය විෂයන්ගේ මූල්‍ය ප්‍රගතිය 47.83% ක් විය. මෙයට හේතු වූයේ වර්ෂය අවසානයේ ගෙවීම් කිරීම සඳහා ප්‍රමාණවත් තරමින් අක්මුදල් නොලැබීමය.
එමෙන්ම ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය යටතේ අභ්‍යාසලාභී උපාධිධාරී පුහුණුව සඳහා ලද රු.මි.9.32 ප්‍රතිපාදන මුදලින් 98.53% ක් උපයෝජනය විය.

ගිණුම් අංශයේ කාර්ය මණ්ඩලය මනාව මෙහෙයවමින් අදාළ ප්‍රතිපාදන දිස්ත්‍රික් කාර්යාල අතර බෙදාහැර දිවයින පුරාම කාර්යාලවල මූල්‍ය කළමනාකරණය සාර්ථකව ඉටුකිරීමට හැකිවීම මෙම වසරේ අප ලද ජයග්‍රහණය වේ.

7.2 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම් අංක 281011/281012

	වියදමෙහි උපරිම සීමාව **රු.මි.**	**ලැබීම් වල අවම සීමාව** **රු.මි.**	**හර ශේෂයෙහි උපරිම සීමාව** **රු.මි.**
විසර්ජන පනතින් බලය දුන් සීමාව	295.32	225.00	600.00
වර්ෂයේ සත්‍ය අගයන්	296.22	257.84	444.64

2018 වර්ෂය තුළ දී උත්සව අත්තිකාරම් ලෙස රු.මි. 112 ක් ද විශේෂ අත්තිකාරම් ලෙස රු.මි. 37.6 ක් ද හා ආපදා ණය ලෙස රු.මි. 145.72 ක් ලෙස නිලධාරින් අතරේ ලබාදීම සිදු කෙරිණි.

08. අභ්‍යන්තර විගණන අංශය

මෙම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශයට අනුයුක්තව ප්‍රධාන අභ්‍යන්තර විගණක හා නිලධාරීන් 31 දෙනෙකු 2018 වර්ෂයේ සේවයේ යෙදී ඇත. දිස්ත්‍රික්ක 19 ක් ආවරණය වන පරිදි ගොවිජන සේවා කාරක, ගොවි බැංකු නියමු ව්‍යාපෘති හා විශේෂ පරීක්ෂණක් සෝදිසි විගණනයන් සිදුකර ඇත. විස්තර පහත පරිදි වේ.

අනු අංකය	විගණන සැලැස්ම අනුව විගණන ක්ෂේත්‍ර	විගණන සැලැස්ම අනුව විගණන සංඛ්‍යාව	වර්ෂය තුළ දී සිදුකරන ලද විගණන සංඛ්‍යාව
01	ප්‍රධාන කාර්යාලයේ ආයතනික කටයුතු	03	00
02	ප්‍රසම්පාදන	10	12
03	ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලවල පරිපාලන කටයුතු හා ව්‍යාපෘති පරීක්ෂාව	03	12
04	මුදල් හා ගිණුම් ගොවිජන සේවා මධ්‍යස්ථානවල ගණුදෙනු හා ගිණුම්	144	46
05	ගොවි බැංකුවල ගණුදෙනු හා ගිණුම්	82	31
06	ගොවිජන සංවර්ධන අරමුදලේ ලැබීම් ගෙවීම්	01	00
07	පෙත්සම් හා විශේෂ පරීක්ෂණ	ලැබෙන පරිදි	10
08	විගණන කළමනාකරණ කමිටු රැස්වීම්	04	04
09	මධ්‍යස්ථාන අවසන් ගිණුම් පරීක්ෂාව	05	00
	එකතුව	**252**	**115**

දිස්ත්‍රික්ක අනුව ගොවිජන සේවා කාරක සභා, ගොවි බැංකු නියමු ව්‍යාපෘති විගණනය සහ විශේෂ පරීක්ෂණ සිදුකර ඇති ආකාරය පහත පරිදි වේ.

අනු අංකය	දිස්ත්‍රික්කය	සිදුකර ඇති විගණන ගණන		සිදුකරන ලද විශේෂ පරීක්ෂණ	එකතුව
		ගොවිජන සේවා කාරක සභා	ගොවි බැංකු නියමු ව්‍යාපෘති		
1	කොළඹ	01	02	0	03
2	ගම්පහ	05	05	0	10
3	කළුතර	04	01	0	05
4	ගාල්ල	01	01	03	05
5	මාතර	05	0	01	06
6	හම්බන්තොට	01	02	0	03
7	රත්නපුර	03	01	02	06
8	කෑගල්ල	01	0	0	01
9	කුරුණෑගල	05	03	0	08
10	පුත්තලම	02	01	0	03
11	මහනුවර	05	04	01	10

අනු අංකය	දිස්ත්‍රික්කය	සිදුකර ඇති විගණන ගණන		සිදුකරන ලද විශේෂ පරීක්ෂණ	එකතුව
		ගොවිජන සේවා කාරක සභා	ගොවි බැංකු නියමු ව්‍යාපෘති		
12	නුවරඑළිය	04	01	01	06
13	බදුල්ල	04	08	0	12
14	මොණරාගල	0	03	0	03
15	අනුරාධපුරය	06	03	0	09
16	පොළොන්නරුව	05	01	0	06
17	මාතලේ	04	02	01	07
18	අම්පාර	01	02	03	06
19	ත්‍රිකුණාමලය	0	0	01	01
	එකතුව	**57**	**40**	**13**	**110**

ගොවිජන සේවා කාරක සභා, ගොවි බැංකු නියමු ව්‍යාපෘති හා විශේෂ පරීක්ෂණවලට අමතරව පහත දැක්වෙන කාර්යයන් සිදු කර ඇත.

අනු අංකය	සිදුකර ඇති කාර්යය	සිදුකර ඇති විගණන ගණන
01	දිස්ත්‍රික් කාර්යාල	12
02	විගණන කළමනාකරණ කමිටු රැස්වීම්	04
03	ප්‍රසම්පාදන	12
එකතුව		**28**

ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ ස්ථාන මාරුවීම හේතුවෙන් මස 02 ක විගණන පරීක්ෂණ සිදු කිරීමට නොහැකි විය. එමෙන්ම විගණන සැලැස්මේ දක්වා ඇති ඇතැම් ඉලක්කයන් ඉක්මවා විගණනය කිරීමට සිදු වූ නිසා සමස්ත ඉලක්කය වෙත ළඟාවීමට නොහැකි වී ඇත.

09. ඵලදා වර්ධන හා අලෙවි අංශය

"ශ්‍රී ලාංකීය ගොවිජන සමාජයේ සහ සියලු කෘෂිකාර්මික ඉඩම්වල තිරසර සංවර්ධනය" යන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ දැක්ම ළඟා කරගනු පිණිස ඵලදා වර්ධන හා අලෙවි අංශයට පැවරී ඇත්තේ විශේෂ කාර්යභාරයකි.

ඒ අනුව, ශ්‍රී ලංකාව තුළ වූ කෘෂිකාර්මික ඉඩම් තුළින් උපරිම කෘෂිකාර්මික ඵලදාවක් ළඟා කර ගනු පිණිස පහත කාර්යයන් 2018 වසරේදී අප විසින් ඉටුකරන්නට යෙදිණි.

15/2012 චක්‍රලේඛය

2012 වර්ෂයේ දී හඳුන්වාදුන් 15/2012 චක්‍රලේඛය ප්‍රකාරව පුරන් වූ කුඹුරු ඉඩම් තුළ කෙටි කාලීන බෝග වගාව සහ මිරිදිය මත්ස්‍ය වගාව වැඩි වශයෙන් ප්‍රචලිත කිරීමට කටයුතු කළ අතර ඒ සඳහා දිස්ත්‍රික් භාර නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් ද නිරන්තරයෙන් දැනුවත් කරන ලද අතර, අදාළ අවසරයන් කඩිනමින් ලබා දීමට කටයුතු කරන ලදී.

4/2009 චක්‍රලේඛය

4/2009 චක්‍රලේඛය පදනම් කර ගනිමින් කාර්යක්ෂම කුඹුරු ඉඩම් වගාවට කුඹුරු ඉඩම් සකස් කර ගැනීමට අවසර ලබා දීමටත් කෘෂිකාර්මික ඉඩම්වල ඵලදායිතාව වැඩි කර ගැනීම අරමුණු කරගනිමින් කෘෂි මාර්ග සකස් කර ගැනීමට කරන ලද ඉල්ලීම් සඳහා අවශ්‍ය අනුමැතිය කඩිනමින් ලබා දීමටත් 2018 වසරේදී කටයුතු කරන ලදී. **(ඇමුණුම 17)**

කාර්ය මණ්ඩලය

තනතුර	**නිලධාරීන් ප්‍රමාණය**
01. සහකාර කොමසාරිස් (ඵලදා වර්ධන හා අලෙවි)	01
02. ශාඛා ප්‍රධානී (ඵලදා වර්ධන හා අලෙවි අංශය)	01
03. සංවර්ධන නිලධාරී	01
04. උපාධිධාරී අභ්‍යාසලාභී	02
05. රාජ්‍ය කළමනාකාර සහකාර (III ශ්‍රේණිය)	05
06. ගොවිජන සේවා මධ්‍යස්ථාන කළමනාකරණ සහකාර	01
07. කාර්යාල කාර්ය සහායක	02

10. ගොවිජන බැංකු (නියමු) ව්‍යාපෘතිය

10.1. ගොවිජන බැංකුවේ දැක්ම

“ශ්‍රී ලාංකීය ගොවිජන සමාජයේ තිරසර සංවර්ධනය සහතික කෙරෙන මූල්‍ය සංස්කෘතියක් “

10.2. ගොවිජන බැංකුවේ මෙහෙවර

“ස්වශක්තියෙන් හෙබි අභිමානවත් ගොවිජන සමාජයක් ගොඩනැගීමට අවශ්‍ය කෙරෙන මූල්‍ය ශක්තිය එම සමාජය තුළ ස්ථාපිත කිරීම සඳහා ගොවි ජනතාව සංවිධානය කිරීම, සවිබල ගැන්වීම, ආයතනික ව්‍යුහයන් සංවර්ධනය කිරීම සහ පහසුකම් සැලසීම.”

10.3. ගොවිජන බැංකුවේ අභිමතාර්ථ

1. ග්‍රාමීය ජනතාවගේ දිළිඳුකම තුරන් කිරීම සඳහා ඔවුන්ට අවශ්‍ය මූල ධනය සපයා ගැනීමට සහාය වන ආයතනයක් ලෙස කටයුතු කිරීම.
2. ගොවි ජනතාවගේ ඉතිරි කිරීම් හැකියාව වර්ධනය කර ගැනීම හා ඒ තුළින් ඔවුන්ගේ ආයෝජන ශක්තිය වර්ධනය කිරීමට සහාය වීම.
3. යැපුම් මට්ටමේ කෘෂිකර්මාන්තය වාණිජමය මට්ටමකට පත් කර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය සහ උපදේශාත්මක පහසුකම් සලසා දීම.
4. ගොවි ජනතාව සංවිධාන ගත කර ඔවුන්ගේ මූල්‍ය හා ආර්ථික ශක්තිය වර්ධනය කර ගැනීමට අවකාශ සැලසීම.
5. ගොවි ජනතාව සමාජීය වශයෙන් බලවත් සමාජ ස්ථරයක් බවට පත් කිරීම සඳහා අවශ්‍ය කෙරෙන මූල්‍ය පරිසරය ගොඩනැඟීම සහ ඔවුන්ගේ සුභසාධන කටයුතු සඳහා දායක වීම.
6. ගොවි ජනතාව සතු මුදල් සහ ප්‍රාග්ධනය එම ජනතාව අතරම සංසරණය වීමට අවකාශ සැලසීම මඟින් ගොවි ආර්ථිකය ප්‍රසාරණය කිරීම.
7. ගොවි සංවිධාන ශක්තිමත් කර කෘෂිකර්මාන්තය පාදක කර ගත් ව්‍යාපාර සඳහා ඔවුන්ට අවශ්‍ය මූල්‍ය ශක්තිය ලබා දීම.
8. ලොකු ලූණු, මුං, සෝයා ආදී දැනට විශාල වශයෙන් ආනයනය කරන බෝග වගාවන් සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීම තුළින් එම වගාවන් බහුල කිරීම හා එමඟින් ජාතික ආර්ථිකයට ශක්තියක් සැපයීම.

10.4. බැංකු කාර්යයන් සහ එයට අයත් නිලධාරීන් සංඛ්‍යාව

	කාර්යයන්	නිලධාරීන් සංඛ්‍යාව
01	ගොවිජන බැංකු සඳහා ප්‍රාග්ධන මුදල් ගොවීන්ගේ භාරකාර අරමුදලින් වෙන් කරවා ගැනීම	01
02	ගොවීන්ගේ භාරකාර අරමුදලින් ලබා ගන්නා ප්‍රාග්ධන මුදල් හා පොළිය පියවීම හා ඊට අදාළ වාර්තා යාවත්කාලීනව පවත්වා ගැනීම	
03	ගොවිජන බැංකු වෙත ප්‍රාග්ධන මුදල් නිදහස් කරවා දීම	
04	ගොවිජන බැංකු ආරම්භ කිරීමට අදාළ රාජකාරී කටයුතු	
05	ගොවිජන බැංකු වෙත ලබා දුන් ප්‍රාග්ධන මුදල් හා පොළී මුදල් නැවත අය කර ගැනීමට අදාළ වාර්තා යාවත්කාලීනව පවත්වා ගැනීම	
06	ගොවිජන බැංකුවලින් අය විය යුතු ප්‍රාග්ධන මුදල් සඳහා වූ පොළිය අර්ධ වාර්ෂිකව ගණනය කිරීම	
07	ප්‍රධාන කාර්යාලය මඟින් ගොවිජන බැංකු වෙත ලබා දී ඇති ප්‍රාග්ධනය, ආපසු පියවා ඇති ප්‍රාග්ධනය හා පොළිය, තවදුරටත් අය වීමට ඇති ප්‍රාග්ධනය හා පොළිය සම්බන්ධව පවතින ගැටලු නිරාකරණය කිරීම	
08	උතුරු හා නැගෙනහිර දිස්ත්‍රික් සමඟ ක්‍රියාත්මක වැඩසටහන්වලදී අදාළ සම්බන්ධීකරණ රාජකාරී	
09	ගොවිජන බැංකු ප්‍රාග්ධන මුදල් ප්‍රධාන ලෙජරය හා විශේෂ ව්‍යාපෘතිවලට අදාළ ලෙජරයන් නඩත්තු කිරීම	01
10	ප්‍රධාන කාර්යාලය මඟින් ලබා දී ඇති ප්‍රාග්ධන මුදල් හා පොළිය ප්‍රධාන කාර්යාලය වෙත ගෙන්වා ගැනීමට අදාළ රාජකාරී	
11	ප්‍රාග්ධන මුදල් හා පොළී මුදල්වලට අදාළ චෙක්පත් ලැබීම් ලේඛනය නිසි පරිදි නඩත්තු කිරීම	
12	ප්‍රාග්ධන මුදල් හා පොළී මුදල් ලැබීම්වලට අදාළ ලදුපත් දිස්ත්‍රික් කාර්යාල වෙත යැවීම	
13	ප්‍රධාන කාර්යාලය මඟින් ගොවිජන බැංකු වෙත ලබා දී ඇති ප්‍රාග්ධනය, ආපසු පියවා ඇති ප්‍රාග්ධනය හා පොළිය, තවදුරටත් අය වීමට ඇති ප්‍රාග්ධනය හා පොළිය සම්බන්ධව පවතින ගැටලු නිරාකරණය කිරීම	
14	ගොවි බැංකු කටයුතු ක්‍රියාකාරීව හා කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාමට අදාළ ක්ෂේත්‍ර මට්ටමේ ක්‍රියාකාරීත්වය පසු විපරම් රාජකාරී	
15	ගොවිජන බැංකු අවසන් ගිණුම් වාර්තා පරීක්ෂා කිරීම හා එම වාර්තාවන්හි පවතින අඩුපාඩු සම්බන්ධව අදාළ ගොවිජන බැංකුව හා දිස්ත්‍රික් කාර්යාලය දැනුවත් කර නිවැරදි කිරීම් සිදුකරවා ගැනීම	01
16	ගොවිජන බැංකු අවසන් ගිණුම් වාර්තා නිසි පරිදි ගෙන්වා ගැනීම හා ඊට අදාළ වාර්තා යාවත් කාලීනව පවත්වා ගැනීම	
17	ගොවිජන බැංකු දිස්ත්‍රික් වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීම හා කාර්තුමය වශයෙන් ප්‍රගතිය ගෙන්වා ගැනීම හා වාර්තා සකස් කිරීම	
18	දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම	
19	ගොවිජන බැංකු පාලන වාර්තා සකස් කිරීම	01
20	ශ්‍රී ලංකා මහ බැංකුව ආදී සියලු බාහිර ආයතන සමඟ සම්බන්ධීකරණ රාජකාරී	
21	ගොවිජන බැංකු අංශයේ ලැබෙන ලිපි ලේඛනය යාවත්කාලීනව, විධිමත්ව පවත්වාගෙන යාම හා විෂය නිලධාරීන් වෙත යොමු කිරීම	
22	ගොවිජන බැංකු අංශයට අදාළ බඩු වට්ටෝරු ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාම	
23	අංශයේ සියලු නිලධාරීන්ට අදාළ නිවාඩු සම්බන්ධ ලේඛනය පවත්වාගෙන යාම හා නිවාඩු වාර්තා සකස් කිරීම	
24	ගොවිජන බැංකු දුරකථන බිල්පත් පියවීමට අදාළ රාජකාරී	
25	ගොවි බැංකුවලට අනුයුක්ත නිලධාරීන්ගේ දිරි දීමනා සම්බන්ධ රාජකාරී	

26	ගොවිජන බැංකු වෙත භෞතික සම්පත් ලබා දීම සම්බන්ධ රාජකාරී කටයුතු	
27	යතුරුපැදි ණය වාරික සම්බන්ධ C.C.10 ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාම හා අය කර ගන්නා ලද වාරික අමාත්‍යාංශය වෙත ප්‍රේෂණය කිරීමට අදාළ රාජකාරී	
28	ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ දීපව්‍යාප්ත කාර්ය සාධන තරග පැවැත්වීමට අදාළ ගොනුව පවත්වාගෙන යාම	
29	ගොවීන්ගේ භාරකාර අරමුදල මඟින් ගොවිජන බැංකු (නියමු) ව්‍යාපෘතීන් හරහා ක්‍රියාත්මක කරනු ලබන විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ රාජකාරී කටයුතු	01
30	සාර ලංකා ණය යෝජනා ක්‍රමය පිළිබඳ සියලු රාජකාරී I. සාර ලංකා ණය ඉල්ලුම්පත් ගෙන්වා ගැනීම II. එම ණය ඉල්ලුම්පත්‍ර කමිටුව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීම හා දිස්ත්‍රික්ක වෙත දැනුම් දීම III. ණය මුදල් දිස්ත්‍රික්ක වෙත ලබා දීම IV. ණය අයකර ගැනීම V. ලෙජර් නඩත්තු කිරීම “ගෙවතු දිරිය” ණය යෝජනා ක්‍රමය සම්බන්ධ සියලු රාජකාරී	
31	ගොවීන්ගේ භාරකාර අරමුදල් අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා ගොනුවක් නඩත්තු කිරීම හා වෙන් වූ මූල්‍ය ප්‍රතිපාදනයන් නිසි පරිදි දෙපාර්තමේන්තුව වෙත ගෙන්වා ගැනීම	01
32	ගොවීන්ගේ භාරකාර අරමුදල මගින් සිදු කරනු ලබන සියලු ව්‍යාපෘතීන්ට අදාළව ප්‍රගති වාර්තාවක් යාවත්කාලීනව පවත්වාගෙන යාම හා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම වෙත ඉදිරිපත් කිරීම	
33	භාරකාර අරමුදලට අදාළ සියලු ලැබීම්, ගෙවීම් සම්බන්ධ රාජකාරී, මුදල් පොත නිසි පරිදි නඩත්තු කිරීම හා බැංකු සැසඳුම් නියමිත දිනට පිළියෙළ කිරීම	
34	භාරකාර අරමුදල් මුදල් පොතට අදාළ ඔබ භාරයේ පවතින කුවිතාන්සි පොත් හා චෙක් පොත්හි ආරක්ෂාව තහවුරු කර ගැනීම	
35	ගොවීන්ගේ භාරකාර අරමුදල් වැය ලෙජරය නිසි පරිදි නඩත්තු කිරීම	
36	දෙපාර්තමේන්තුව භාරයේ රඳවා ගන්නා 1% ප්‍රාග්ධන පොළී මුදලට අදාළ වැය ලෙජරය නඩත්තු කිරීම හා ඒ හා සම්බන්ධ සියලු වියදම් වලට අදාළ රාජකාරී	
37	ගොවීන්ගේ භාරකාර අරමුදල් යතුරුපැදි ණය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධ සියලු රාජකාරී I. ප්‍රමුඛතා ලේඛනය නඩත්තු කිරීම II. අයදුම්පත්වල අඩුපාඩු සම්පූර්ණ කර ගැනීම III. සම්පූර්ණ කරන ලද අයදුම්පත් ගෙවීම් කිරීම සඬැඳි සියලු රාජකාරී IV. චෙක්පත් අදාළ පුද්ගලයන් වෙත ලබා දීම V. යතුරුපැදි ලියාපදිංචි කිරීම් සම්බන්ධ රාජකාරී	
38	ගොවීන්ගේ භාරකාර අරමුදලින් ලබාදුන් යතුරුපැදි වල ලියාපදිංචි සහතික පිටපත් ගොනුවලට අදාළ රාජකාරී	
39	දිස්ත්‍රික්ක වෙතින් මාසික ඒකාබද්ධ මාසික වාර්තා, ණය, කොටස් හා තැන්පතු පිළිබඳ වාර්තා ගෙන්වා ගැනීම, විශ්ලේෂණය කිරීම හා සමස්ත ඒකාබද්ධ වාර්තාව මාසිකව පිළියෙළ කිරීම	01
40	කොටස් තැන්පතු සම්බන්ධ ප්‍රගති වාර්තාවක් පිළියෙළ කිරීම	
41	දිස්ත්‍රික් මාසික ඒකාබද්ධ වාර්තාවන්හි අඩුපාඩු සම්බන්ධව දිස්ත්‍රික් වෙත දැනුම් දීම හා නැවත නිවැරදි වාර්තාවන් ගෙන්වා ගැනීම	
42	ගොවිජන බැංකු චක්‍රලේඛ මත සැලසී ඇති ප්‍රතිපාදනයන් ක්‍රියාත්මක කිරීම, චක්‍රලේඛ ගොනුව පවත්වාගෙන යාම හා කාලීනව චක්‍රලේඛ සඳහා වන සංශෝධන සකස් කිරීමට අදාළ රාජකාරී	
43	ගොවිජන බැංකු අංශයේ කාර්ය මණ්ඩල ගොනුව පවත්වාගෙන යාම හා ඊට අදාළ රාජකාරී කටයුතු	
44	තොරතුරු දැනගැනීමේ පනත යටතේ සිදු කෙරෙන ඉල්ලීම් සඳහා පිළිතුරු යැවීම	
45	පවිත්‍රතා කටයුතු සම්බන්ධ රාජකාරී කටයුතු	

46	ගොවිජන බැංකු අංශයට අදාළ විගණන විමසුම් ලේඛනය නඩත්තු කිරීම හා විගණන විමසුම් (අභ්‍යන්තර හා බාහිර) සඳහා පිළිතුරු සැපයීම	01
47	ගොවිජන බැංකු පරීක්ෂා කිරීමට අදාළ වාර්තා පවත්වා ගැනීම හා ඊට අදාළ සියලු රාජකාරි	
48	අංශයට අදාළ විශේෂ විමර්ශන ගොනුව පවත්වා ගෙන යාම	
49	ගොවි බැංකු පුහුණු වැඩසටහන් සම්බන්ධීකරණය සම්බන්ධ සියලු රාජකාරි	
50	ගොවි බැංකු ප්‍රචාරණය හා ප්‍රවර්ධනය කිරීමට අදාළ රාජකාරී කටයුතු	
51	ගොවි බැංකු (නියමු) ව්‍යාපෘතිය 2020 දක්වා සැලැස්මට අදාළ කටයුතු	
52	කාර්යය මණ්ඩල රැස්වීම් ගොනුව පවත්වාගෙන යාම හා ඊට අදාළ රාජකාරි කටයුතු	
53	ජාතික මෙහෙයුම් කමිටුව සම්බන්ධ රාජකාරි	
54	දිස්ත්‍රික් මෙහෙයුම් කමිටුව සමබන්ධ රාජකාරි	
55	ගොවිජන බැංකු මුදල් පොත්, පාස් පොත් මුද්‍රණය කිරීමට අදාළ සියලු රාජකාරි	01
56	ගොවිජන බැංකු මුදල් පොත්, පාස් පොත් නිකුත් කිරීම හා ඊට අදාළ චෙක්පත් ලැබීම් ලේඛනය නිසි පරිදි නඩත්තු කිරීම	
57	චක්‍රීය අරමුදල් අය කිරීමට අදාළ රාජකාරි	
58	සමාගම් හිඟ ණය අය කර ගැනීම් හා ඊට අදාළ විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම සම්බන්ධ රාජකාරි	
59	රු. 100,000/- ණය වැඩසටහන පසු විපරම් හා ඊට අදාළ රාජකාරි කටයුතු	
60	ණය අය කර ගැනීම, හිඟ ණය පිළිබඳ වාර්තා ගෙන්වා ගැනීම, විශ්ලේෂණය කිරීම සම්බන්ධ රාජකාරි හා ගොවිජන බැංකු මඟින් නිකුත් කර ඇති ණය වලට අදාළව විවිධ ආයතන හා පුද්ගලයන් විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනා ලිපි සම්බන්ධව ක්‍රියා කිරීම	
61	ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහනට අදාළ රාජකාරි කටයුතු	02
62	ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන යටතේ සිතමු කාන්තා ගොවි සංවිධාන සාමාජිකාවන් විසින් පවත්වාගෙන යන ගෙවතුවලට අදාළ කටයුතු	02
63	‘‘වැව් දහසක් ගම් දහසක්’’ වැඩසටහන යටතේ පවත්වාගෙන යන ගෙවතු වලට අදාළ කටයුතු	
64	කෘෂිකර්ම අමාත්‍යාංශයේ නව වැඩපිළිවෙල යටතේ හඳුන්වා දී ඇති ‘‘සරුපිරි ගෙවත්ත’’ ට අදාළ කටයුතු හා ගෙවතු වැඩසටහනට අදාළ සියලු කටයුතු	

10.5. ගොවි බැංකු ක්‍රියාත්මක සැලැස්ම සහ එහි ප්‍රගතිය - 2018

වැඩසටහන	ක්‍රියාකාරකම	අපේක්ෂිත ප්‍රතිඵලය ගණනය කරන දර්ශකය	ක්‍රියාකාරී සැලැස්ම අනුව වෙන් කළ ප්‍රතිපාදන	2018.12.31 දිනට ප්‍රගතිය	
				භෞතික ප්‍රගතිය	මූල්‍ය ප්‍රගතිය
ගොවි බැංකු ප්‍රවර්ධනය කිරීම	01. ගොවි බැංකු 10 ක් සඳහා ගොඩනැගිලි ඉදිකිරීම	ගොඩනැගිලි සංඛ්‍යාව	රු.මි. 36.2	-	-
	02. ගොවි බැංකු 25ක් සඳහා කාර්යාල උපකරණ සැපයීම	උපකරණ සංඛ්‍යාව	රු.මි.4.85	මන්නාරම දිස්ත්‍රික්කයේ ගොවි බැංකු 12 ක් සඳහා කාර්යාල උපකරණ සහ අම්පාර, මාතර, අනුරාධපුරය යන දිස්ත්‍රික්ක සඳහා පරිගණක සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වැලිකන්ද ගොවි බැංකුව සඳහා කවුන්ටරයක් ලබා දීම	රු.මි. 2.05
	03. ගොවි බැංකු නිලධාරීන්ට ගිණුම්කරණ ප්‍රමිති පොත් 1102 ක් ලබා දීම	පොත් සංඛ්‍යාව	රු.මි.0.3	ගිණුම්කරණ ප්‍රමිති පොත් 795	රු. මි.0.16
	04. ගොවි බැංකු නිලධාරීන්ට පුහුණු පහසුකම් ලබා දීම	දිස්ත්‍රික්ක සංඛ්‍යාව	රු.මි.3	දිස්ත්‍රික්ක 11	රු.මි.1.2
	05. ගොවි බැංකු සඳහා ආරක්ෂිත සේප්පු 50ක් ලබා දීම	සේප්පු සංඛ්‍යාව	රු.මි. 3	ආරක්ෂිත සේප්පු 50	රු.මි.2.94
	06. ගොවි බැංකු සඳහා අමතර ප්‍රාග්ධනය ලබා දීම	ගොවිබැංකු සංඛ්‍යාව	රු.මි. 50	ගොවි බැංකු 72	රු.මි.107
	07. ගොවි බැංකු සඳහා නාමපුවරු 50ක් ඉදිකිරීම	නාමපුවරු සංඛ්‍යාව	රු.මි. 10	–	ප්‍රතිපාදන වෙන් වී නොමැත

10.6. **2018.12.31** දිනට දිස්ත්‍රික් මට්ටමින් පිහිටුවා ඇති ගොවිජන බැංකු (නියමු) ව්‍යාපෘති සංඛ්‍යාව

අනු අංකය	දිස්ත්‍රික්කය	ගොවිජන සේවා මධ්‍යස්ථාන ගණන	පිහිටුවා ඇති ගොවිජන බැංකු ගණන
01	කොළඹ	9	9
02	ගම්පහ	26	26
03	කළුතර	20	20
04	මහනුවර	45	45
05	මාතලේ	23	23
06	නුවරඑළිය	22	22
07	ගාල්ල	33	33
08	මාතර	22	22
09	හම්බන්තොට	17	17
10	කුරුණෑගල	56	56
11	පුත්තලම	18	18
12	අනුරාධපුරය	43	42
13	පොළොන්නරුව	13	12
14	බදුල්ල	31	31
15	මොණරාගල	18	18
16	රත්නපුර	30	30
17	කෑගල්ල	14	14
18	අම්පාර	29	29
19	ත්‍රිකුණාමලය	22	18
20	මඩකළපුව	17	16
21	වවුනියාව	8	8
22	යාපනය	15	15
23	මන්නාරම	12	12
24	මුලතිව්	10	10
25	කිළිනොච්චිය	8	7
එකතුව		**561**	**553**

පහත දැක්වෙන ගොවි බැංකු 2018 වර්ෂයේදී ආරම්භ කර ඇත.

1. කළුතර - පැලවත්ත
2. කිළිනොච්චිය - රාමනාදන්පුරම්

2018.12.31 දිනට ගොවිජන බැංකු (නියමු) ව්‍යාපෘතිය සමඟ සම්බන්ධ වී සිටින ගොවීන් පිළිබඳ විස්තර හා 2017 වර්ෂයට සාපේක්ෂව වර්ධනය පහත දැක්වේ.

	2018/12/31 දිනට	2017/12/31 දිනට	වර්ධන ප්‍රතිශතය %
කොටස්කරුවන් සංඛ්‍යාව	907,097	859,394	5.55%
තැන්පත්කරුවන් සංඛ්‍යාව	802,454	725,007	10.68%
කණ්ඩායම් ගිණුම් සංඛ්‍යාව	62,232	55,877	11.37%

2018.12.31 දිනට ගොවිජන බැංකු (නියමු) ව්‍යාපෘතියේ මූල්‍ය තොරතුරුවලින් කොටසක් පහත පරිදි වේ.

විස්තරය	2017.12.31 දිනට (රු.මි.)	2018.12.31 දිනට (රු.මි.)
ඉතිරි කිරීම් ගිණුම් හා ස්ථාවර තැන්පත් ගිණුමේ ශේෂය	756.42	691.39
ජංගම ගිණුමේ ශේෂය	58.72	92.98
ණයගැතියෝ	1,428.46	2,159.10
ගොවීන්ගේ කොටස් මුදල් පාලන ගිණුම	450.58	528.11
ප්‍රාග්ධන ගිණුම	194.79	235.77
ගොවීන්ගේ ඉතිරි කිරීම් පාලන ගිණුම	706.29	826.98
ගොවීන්ගේ කණ්ඩායම් පාලන ගිණුම	157.16	184.86

10.7. ගොවිජන බැංකුව වෙත ප්‍රාග්ධන මුදල් නිකුත් කිරීම

2018 වර්ෂය තුළ ගොවීන්ගේ භාරකාර අරමුදල වෙතින් ගොවිජන බැංකු වෙත ප්‍රාග්ධනය ලබා දීම සඳහා රු.මි.30 ක මුදලක් ණය ලබා ගෙන ඇති අතර, රු.මි. 107 ක මුදලක් ගොවිජන බැංකු වෙත ප්‍රාග්ධන ලෙස නිකුත් කර ඇත.

10.8. ගොවිජන බැංකු මඟින් ණය නිකුත් කිරීම් හා අයවීම්

ගොවිජන බැංකු මඟින් ආරම්භයේ සිට 2018.12.31 දින දක්වා නිකුත් කර ඇති මුළු ණය වල වටිනාකම රු.මි.12,024.03 ක් වන අතර, මුළු ණය අය කර ගැනීම්වල වටිනාකම රු.මි.9,870.66 කි. ඒ අනුව අය විය යුතු මුදල රු.මි. 2,153.37ක් වේ.

මෙයින් රු.මි. 1,876.93 ක් කල් පසු නොවූ ණය මුදල් වන අතර රු.මි. 276.44 ක් කල් පසු වූ ණය වේ. මේ අනුව සමස්ත ණය වටිනාකමින් කල් පසු වූ ණය ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස 2.3% ක් පමණි. 2018 වර්ෂයේදී ගොවිජන බැංකු මඟින් කෘෂිකාර්මික ණය රු.මි.7,469.26 ක් ද, ව්‍යාපෘති ණය රු.මි.3,295.38 ක් ද, අනෙකුත් ණය රු.මි.1,259.39ක් ද, ලෙස රු.මි.12,024.03 ණය මුදලක් ගොවීන් වෙත නිකුත් කර ඇත.

<u>ගොවීන්ගේ භාරකාර අරමුදල මඟින් ප්‍රධාන කාර්යාලය හරහා 2018 වර්ෂය තුළදී ගොවිජන බැංකු වෙත ලබා දෙන ලද ප්‍රාග්ධන මුදල් හා ගොවිජන බැංකු ආරම්භයේ සිට 2018.12.31 දක්වා ගොවිජන බැංකු මඟින් ණය නිකුත් කිරීම් හා අයවීම් ප්‍රගතිය</u>

දිස්ත්‍රික්කය	ප්‍රධාන කාර්යාලය හරහා ලබාදුන් ප්‍රාග්ධනය (රු.මි.)	ණය නිකුත්කිරීම් (රු.මි.)	ණය අය කිරීම් (රු.මි.)
කොළඹ	1.00	70.13	55.97
ගම්පහ	5.80	564.49	461.53
කළුතර	0.50	129.74	102.56
මහනුවර	3.00	1,181.98	961.91
මාතලේ	1.00	713.04	567.86
නුවරඑළිය	3.00	601.98	486.85
ගාල්ල	9.50	469.65	355.53
මාතර	7.00	348.98	277.57
හම්බන්තොට	-	357.86	327.39
කුරුණෑගල	25.20	975.41	813.98
පුත්තලම	-	532.82	431.00
අනුරාධපුරය	9.00	1,395.35	1,149.28
පොළොන්නරුව	2.00	1,600.93	1,530.04
බදුල්ල	13.50	704.40	557.19
මොණරාගල	2.50	349.82	262.67
රත්නපුර	4.50	320.51	247.11
කෑගල්ල	10.50	583.28	334.97
අම්පාර	-	455.89	437.52
ත්‍රිකුණාමලය	1.50	97.62	77.40
මඩකළපුව	5.00	279.78	217.35
වව්නියාව	1.50	90.00	71.08
යාපනය	-	112.17	93.43
මන්නාරම	-	21.17	14.97
මුලතිව්	-	43.48	33.29
කිළිනොච්චිය	1.00	23.45	2.08
එකතුව	**107.00**	**12,024.03**	**9,870.66**

10. 9. ගොවිජන බැංකුව මඟින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන ණය යෝජනා ක්‍රම :

- වගා ණය (කෘෂි ණය)
- අස්වනු නෙලීමේ ණය
- අස්වනු සුරැකීමේ ණය
- කෘෂි යන්ත්‍රෝපකරණ ණය
- ව්‍යාපෘති ණය
- සාර ලංකා ණය
- වැසි ආවරණ ණය
- විශේෂ බඩඉරිඟු ව්‍යාපෘති ණය

10.10. සිදුමු ව්‍යාපෘතිය

10.10.1. ව්‍යාපෘතියේ පරමාර්ථ

කෘෂිකාර්මික කටයුතුවල නියැලෙන ගොවි කාන්තාවන්ගේ හා ඔවුන්ගේ පවුලේ ආදායම් තත්ත්වය, සමාජයීය තත්ත්වය, පෝෂණය, සෞඛ්‍යය, අධ්‍යාපනය, අධ්‍යාත්මික පසුබිම වර්ධනය කරගැනීම සඳහා,

- කෘෂිකාර්මික කටයුතුවලට අවශ්‍ය යෙදවුම් ණය පහසුකම් ඇතිකර ගැනීම
- සකසුරුවම්කම හා ඉතිරි කිරීම් සඳහා පෙළඹවීම
- අන්‍යෝන්‍ය සහයෝගය සහ කැපවීමෙන්, සාමාජිකයන්ගේ ආර්ථික තත්ත්වය දියුණුකර ගැනීමට කණ්ඩායම් වශයෙන් සංවිධානය වීම
- ගෙවත්ත උද්‍යානයක් ලෙස සංවර්ධනය කිරීම හා කෘෂිකර්මාන්තයට තරුණ කාන්තා පරපුර නැඹුරු කිරීම
- ගෙවත්ත කාබනික ගොවිතැනට භාවිතා කිරීම, ආහාර පරිභෝජන රටාව වෙනස්කොට පවුලේ පෝෂණ තත්ත්වය වැඩිදියුණු කිරීම
- දැනුම, ආකල්ප, කුසලතා වර්ධනය, නායකත්වය හා කළමනාකරණ ගුණාංග වර්ධනය වැඩිදියුණු කිරීමෙන් සමාජ ආර්ථික සංවර්ධනය සඳහා කාන්තාව සවිබල ගැන්වීම

10.10.2. සිදුමු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

10.10.2.1. සිදුමු කාන්තා සංවිධාන පිහිටුවීම හා ලියාපදිංචිය





ඇමුණුම 18 බලන්න.

10.10.3. ගෙවතු වගා ප්‍රවර්ධන වැඩසටහන



ඇමුණුම 19 බලන්න.

10.10.4. ව්‍යවසායක ණය වැඩසටහන් හඳුන්වා දීම



ඇමුණුම 20 බලන්න.

10.10.5. සිදුමු ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහනෙහි අනිවාර්ය ඉතිරිකිරීම් ප්‍රගතිය



ඇමුණුම 21 බලන්න.

10.10.6. සිදුමු ගොවිජන බොජුන්හල් පිහිටුවීමේ ප්‍රගතිය





කළුතර



පොළොන්නරුව

ඇමුණුම 22 බලන්න.

10.10.7. එක් මසකට එක් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම





සිතුමු ගොවි සංවිධාන සවිබල ගැන්වීම යටතේ 2017 වසරේ සිට මේ දක්වා එක් මසකට එක් වැඩසටහන බැගින් කාන්තා වැඩසටහන් ඉටු කිරීමට කටයුතු කරන ලදී.
මෙම වසර තුළ ද එසේ විශේෂ දිනයන් හේතු කොට ගෙන සිතුමු කාන්තා ගොවි සංවිධාන සාමාජිකාවන්ගේ සහභාගිත්වයෙන් සෑම ගොවිජන සේවා මධ්‍යස්ථානයක් ආශ්‍රිතවම සෑම මසකම මෙම විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක විය.

- සිතුමු කාන්තා සාමාජිකාවන්ගේ සහභාගිත්වයෙන් ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහනක් පැවැත්වීම
- සිංහල හින්දු අලුත් අවුරුද්ද නිමිත්තකොටගෙන අලුත් අවුරුදු උත්සව පැවැත්වීම
- බුදු තෙමඟුල සැමරුම් දිනයට සමගාමීව ශීල ව්‍යාපාරයක් පැවැත්වීම
- පරිසර දිනයට සමගාමීව පරිසර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- මලාලා යූසුප් සැමරුම් දිනයට සමගාමීව ළමා චිත්‍ර තරගයක් පැවැත්වීම
- ජාත්‍යන්තර තරුණ දිනයට සමගාමීව එක් දින ගිණුම් පුහුණු වැඩසටහනක් සංවිධානය කිරීම
- ජාත්‍යන්තර පුණ්‍ය කටයුතු දිනය නිමිත්තකොටගෙන භාවනා වැඩසටහනක් සංවිධානය කිරීම
- ලෝක ළමා දිනය හා ලෝක වැඩිහිටි දිනයට සමගාමීව ශ්‍රමදාන වැඩසටහනක් සංවිධානය කිරීම
- කාන්තා හිංසන පිටු දැකීමේ දිනයට සමගාමීව සංස්කෘතික උළෙලක් සංවිධානය කිරීම
- දෙසැම්බර් මස නත්තල් උත්සවය නිමිත්තකොටගෙන සෑම ගොවිජන සේවා මධ්‍යස්ථානයක් ආශ්‍රිතවම සතිපොළවල් පවත්වාගෙන යාමට කටයුතු කිරීම



කෑගල්ල-අරනායක(දන්සැල් පැවැත්වීම)

- **ගොවිජන සේවා මධ්‍යස්ථානවල කාන්තාවන්ගේ නිෂ්පාදන ඇතුළත් සතිපොළවල් පැවැත්වීම**



අනුරාධපුරය



ගාල්ල - බද්දේගම



මාතලේ



කෑගල්ල- පරගම්මන

10.10.8. සිදුමු රූපවාහිනී වැඩසටහන ක්‍රියාත්මක කිරීම

දිස්ත්‍රික් 15ක් තුළ වැඩසටහන් අවසන්ව ඇත.

''ගොවිජන අභිමන්'' (ස්වාධීන රූපවාහිනී නාලිකාවේ විකාශිත)	**"ගොවිජන ප්‍රතිභා" (ජාතික රූපවාහිනී නාලිකාවේ විකාශිත)**
කෑගල්ල	මහනුවර
බදුල්ල	ගම්පහ
පුත්තලම	හම්බන්තොට
අම්පාර	බදුල්ල
කළුතර	අනුරාධපුරය
කුරුණෑගල	රත්නපුරය
	නුවරඑළිය
	මාතර
	නව වසරේ ආරම්භක වැඩසටහන - ඉදිරි සැලසුම් පිළිබඳ විශේෂ වැඩසටහන (ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේහි දී)

10.10.9. සිදුමු ගුවන් විදුලි වැඩසටහන ක්‍රියාත්මක කිරීම

දිස්ත්‍රික් 20ක් තුළ පටිගත කරන ලද වැඩසටහන් මේ වන විට විකාශය කර අවසන්ව ඇත.

කොළඹ	මාතලේ	හම්බන්තොට	පොළොන්නරුව	කෑගල්ල
ගම්පහ	නුවරඑළිය	කුරුණෑගල	බදුල්ල	අම්පාර
කළුතර	ගාල්ල	පුත්තලම	මොණරාගල	ත්‍රිකුණාමලය
මහනුවර	මාතර	අනුරාධපුරය	රත්නපුරය	වව්නියාව

දමිළ මාධ්‍යයෙන් දිස්ත්‍රික්ක 05ක් තුළ මේ වනවිට වැඩසටහන් පටිගත කරමින් පවතී.

කිළිනොච්චිය	මන්නාරම	යාපනය	මුලතිව්	මඩකළපුව

10.10.10. ‘‘ගොවිමිණ’’ සඟරාව එළිදැක්වීම

- ‘’ගොවිමිණ’’ සඟරාවෙහි මංගල කලාපය 2019.01.11 වන දින දොරට වඩිනු ලැබීය.
- සඟරා 10,000ක් මුද්‍රණය කර ඇත.
- සියලුම දිස්ත්‍රික්ක වෙත බෙදාහරිමින් පවතී.
- සඟරාවෙහි මීළඟ කලාපය සඳහා වැඩකටයුතු ආරම්භ කර ඇත.









11. ජල කළමනාකරණ අංශය

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ජල කළමනාකරණ අංශය 1981 වර්ෂයේ ආරම්භ කරන ලද අතර, වර්තමානයේ එය ජල කළමනාකරණය පිළිබඳ ප්‍රධාන ඉංජිනේරුවරයකුගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වේ.

දැනට තිබෙන මානව සම්පත්	ජල කළමනාකරණ අංශය	දුරස්ථ ගෝවර අංශය
• සිවිල් ඉංජිනේරු	01	-
• ඉංජිනේරු සහකාර	01	01
• කාර්මික නිලධාරී	-	04
• සංවර්ධන නිලධාරී	03	01
• රාජ්‍ය කළමනාකරණ සහකාර	02	01
• කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර	-	01
• කාර්යාල කාර්ය සහායක	02	
• සංවර්ධන නිලධාරී (පුහුණු)	02	

11.1. ජල කළමනාකරණය

2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ VII වන කොටසේ දැක්වෙන ‘‘වාරි කර්මාන්ත හා වාරිමාර්ග ජලය කළමනාකරණය කිරීම’’ යන මාතෘකාව යටතේ වන 81 සිට 80 දක්වා වන වගන්ති වලට අදාළ විධිවිධාන ක්‍රියාවට නැංවීම මෙන්ම මෙම මාතෘකාව යටතේ වන විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ තොරතුරු මේ යටතේ සඳහන් වේ.

දේශගුණික විචලනයට අමතරව පවතින දේශගුණික විපර්යාසය නිසා කෘෂිකර්ම ක්ෂේත්‍රයේ මෙරටට අත්විඳීමට සිදුවී ඇති අයහපත් ප්‍රතිඵල අවම කර ගැනීමට පෙර ක්‍රියාකාරී ලෙස දායක වීම අරමුණු කරගත් උපාය මාර්ගික ප්‍රවේශ රාශියක් 2018 වසරේ ආරම්භ කිරීමට හා හඳුන්වා දීමට සමත් වී තිබේ.

11.2. චන්ද්‍රිකා ඡායාරූප ඇසුරින් කුඹුරු ඉඩම් සඳහා පරිගණකගත දත්ත පාදමක් සැකසීම.

නවීන චන්ද්‍රිකා ඡායාරූප අනුසාරයෙන් ගම්පහ, ගාල්ල, මාතලේ හා වව්නියාව යන දිස්ත්‍රික්කවල ඉහත කටයුතු බොහෝමයක් අවසන් කර ඇති අතර, ගම්පහ දිස්ත්‍රික්කයේ කුඹුරු ඉඩම් පිළිබඳ තොරතුරු අවසන් කර දෙපාර්තමේන්තු වෙබ් අඩවියට ඇතුළු කර ඇත. (www.agrariandept.gov.lk). අනාගතයේදී ශ්‍රී ලංකාවේ සියලු කුඹුරු ඉඩම් පිළිබඳ පරිගණකගත දත්ත පාදමක් බිහිකිරීමට අවශ්‍ය ව්‍යාපෘති යෝජනාවක් මේ වනවිට පිළියෙළ කරමින් පවතී. මේ මඟින් ශ්‍රී ලංකාවේ කුඹුරු ඉඩම් පිළිබඳ නිවැරදි දත්තපාදමක් බිහිවන අතර, සෑම කුඹුරකම නිවැරදි බිම් ප්‍රමාණය දැනගැනීමට ලැබීමෙන්, පොහොර, ජලය ආදි සැපයුම් භාවිතය සීමා කිරීමටත්, නිවැරදි අස්වනු අපේක්ෂා කිරීමටත් හැකිවනු ඇත. එසේම කුඹුරු ඉඩම් අනවසර ලෙස වෙනත් භාවිත සඳහා යොදාගැනීමට ඇති ඉඩකඩද මේ නිසා ඇහිරී යනු ඇත.

11.3. කෘෂිකාර්මික (කුඹුරු) ඉඩම් ලේඛන පරිගණකගත කිරීම

මේ වන විට ශ්‍රී ලංකාවේ සියලුම කුඹුරු ඉඩම් සංගණනය කොට තොරතුරු එක්රැස්කර ඇති අතර, එම තොරතුරු ගොවිජන සේවා මධ්‍යස්ථාන මට්ටමෙන් පරිගණකගත කිරීම ආරම්භ කොට ඇත. මෙසේ පරිගණකගත කරන තොරතුරු කඩිනමින් දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ (www.agrariandept.gov.lk) ප්‍රදර්ශනය කිරීමට ක්‍රියා කරනු ඇත. ඉදිරියේ දී කුඹුරු ඉඩම් පිළිබඳ තොරතුරු දැනගැනීමට අපේක්ෂා කරන පුද්ගලයින්ට ඒ සඳහා ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත නොගොස්, දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙන් ඊට අදාළ උදෘත ලබා ගැනීමට ඉඩකඩ සැලසෙනු ඇත.

11.4. ශ්‍රී ලංකාවේ ජල උල්පත්, ජල මාවත්, කෘෂි මාර්ග හා ක්ෂුද්‍ර වැව් සඳහා දත්ත පාදමක් සැකසීම

ශ්‍රී ලංකාවේ සියලුම ජල උල්පත් හා බුබුළු, ප්‍රාථමික ජල මාර්ග, කෘෂි මාවත් හා වගා බිම් ප්‍රමාණය හා ගොවි පවුල් සංඛ්‍යාව 10 ට අඩු ක්ෂුද්‍ර වැව් පිළිබඳ ලේඛනගත දත්තපාදමක් ගොවිජන සේවා මධ්‍යස්ථාන මට්ටමින් පිළියෙළ කිරීමට කටයුතු කර ඇත. මේ සඳහා අවශ්‍ය තොරතුරු ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් එක්රැස් කිරීම මේ වන විට අවසන්කර ඇති අතර, ඉදිරියේ දී එම තොරතුරු පරිගණකගත කොට දෙපාර්තමේන්තු වෙබ් අඩවියට ඇතුළත් කිරීමට ක්‍රියා කරනු ඇත.

11.5. වාරි ජලයේ ප්‍රමිතිය පරීක්ෂා කිරීම

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය වැව් 14421 ක් පවතින අතර, එවායේ ජලය අවට ගම්වල ජීවත්වන ජනතාව විසින් සිය දෛනික පරිභෝජනය සඳහා යොදාගනු ලැබේ. මෙම කුඩා වැව්වල ජල ප්‍රමි ය පහළ යෑම, මෙරට වියළි කලාපයේ ජීවත්වන ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වයට බලපාන ප්‍රබල හේතුවක් බවට පත්වෙමින් පවතී. මෙම තත්ත්වය පිළිබඳ අධ්‍යයනය කර ඊට විසඳුම් සොයා ගැනීම සඳහා මෙරටේ ග්‍රාමීය වැව් ව්‍යාපාර පවතින ගොවිජන සේවා මධ්‍යස්ථාන 320 ට අවශ්‍ය ජල ප්‍රමි ය පරීක්ෂා කරන උපකරණ හා එම නිලධාරීන්ට අවශ්‍ය පුහුණුව ලබා දීමට සැලසුම් කර ඇත. මේ යටතේ 2018 වර්ෂයේ මධ්‍යස්ථාන 80 කට අවශ්‍ය උපකරණ හා පුහුණුව ලබාදෙන ලදී.

11.6 ගොවිජන සේවා මධ්‍යස්ථාන මට්ටමින් දෛනික වර්ෂාපතනය මැනීම

මේ වන විට දිවයිනේ සියලුම ගොවිජන සේවා මධ්‍යස්ථානවල දෛනික වර්ෂාපතනය මැනීම ආරම්භ කොට ඇති අතර, එම තොරතුරු වාර්තාගත කිරීම සිදුකරනු ලැබේ. එම තොරතුරු SMS පණිවිඩ හා පරිගණකය මඟින් ප්‍රධාන කාර්යාලය වෙත දැනුම් දීමට අවශ්‍ය පහසුකම ද මේ වනවිට සැලසුම්කර ඇති අතර, අදාළ ගොවිජන සේවා බලප්‍රදේශයේ කෘෂිකාර්මික සැලසුම්කරණය සඳහා මෙන්ම ඉදිරියේ දී ඇතිවන නියං තත්ත්වයක් කල්ඇතිව හඳුනාගෙන දැනුම් දීමට මෙම තොරතුරු නුදුරු අනාගතයේ දී යොදා ගැනීමට නියමිතය.

11.7. ගොවිජන සේවා මධ්‍යස්ථාන මට්ටමින් කෘෂි කාලගුණික දත්ත මැනීම

මේ යටතේ මෙරටේ වියළි කලාපීය දිස්ත්‍රික්කවල හඳුනාගත් ගොවිජන සේවා මධ්‍යස්ථානවල කෘෂි කාලගුණික මධ්‍යස්ථාන 13ක් සවි කිරීමට අවශ්‍ය උපකරණ 2018 වර්ෂයේ මිල දී ගත් අතර එම උපකරණ 2019 වර්ෂයේ සවිකර පාඨාංක ලබාගැනීම සිදුකරනු ඇත. මේ මඟින් දෛනික වර්ෂාපතනය, වාෂ්පීකරණය, උපරිම හා අවම උෂ්ණත්වය, සාපේක්ෂ ආර්ද්‍රතාවය, සුළඟේ වේගය හා දිශාව මැනීම සිදුකරනු ලබන අතර, මෙම තොරතුරු යොදාගනිමින් ඉදිරියේ දී ඇතිවිය හැකි ජල හිඟය පිළිබඳ අනාවැකි

පල කිරීමට හා ඊට අදාළ තොරතුරු කල් ඇතිව එම ප්‍රදේශයේ ගොවීන් වෙත ලබාදීම සිදුකරනු ඇත. එසේම එම තොරතුරු යොදාගනිමින් කුඩා වැව් යටතේ ජලය බෙදා හැරීම පාලනය කිරීමට ද මේ මඟින් සැලසුම් සිදුකර ඇත.




11.8. ග්‍රාමීය වැව්වල ජල උස මාපක සවිකිරීම හා වැව්වල උස මැනීම

ශ්‍රී ලංකාවේ සියලුම ග්‍රාමීය වැව්වල ජල උස මාපක සවිකිරීම (14421) හා එම තොරතුරු වාර්තාගත කිරීම හා ගොවිජන සංවර්ධන ප්‍රධාන කාර්යාලය වෙත ලබාගැනීම සඳහා SMS ක්‍රමවේදයක් හඳුන්වා දී ඇති අතර, අදාළ වැව්වල පවතින ජල පරිමාව පිළිබඳ තොරතුරු පිළිබඳව ගොවි ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනක් ආරම්භ කර ඇත. මේ යටතේ 2018 වර්ෂය වන විට වැව් 4000 ක එම ජල උස මාපක සවිකිරීම සිදුකර ඇති අතර, ඉදිරි වර්ෂ තුන තුළ දිවයිනේ සියලුම වැව්වල ජල උස මාපක සවිකිරීම සිදුකරනු ඇත. මේ මඟින් වැවේ පවතින ජල ප්‍රමාණය හා වගාබිම් සඳහා අවශ්‍ය ජල ප්‍රමාණය සැසඳීමට ගොවීනට අවස්ථාව සැලසෙනු ඇත. එසේම දීර්ඝකාලීනව රැස්කරනු ලබන මෙම දත්ත ඉදිරියේ දී එම වැව් යටතේ ජල කළමනාකරණ කටයුතු සඳහා මනා පිටුවහලක් වනු ඇත.




11.9. ග්‍රාමීය වැව්වලින් ජලය මැන නිකුත් කිරීම

ඉතිහාසයේ ප්‍රථම වතාවට ග්‍රාමීය වැව් විශාල ප්‍රමාණයකින් ජලය මැන වගාබිම් වලට නිකුත් කිරීමේ වැඩසටහනක් 2018 වර්ෂයේ ආරම්භ කරන ලද අතර, මේ සඳහා අවශ්‍ය Current Flow Meter 10ක් අදාළ දිස්ත්‍රික්ක වෙත ලබා දීමට හා ඊට අදාළ පුහුණුවක් තාක්ෂණ නිලධාරීන්ට ලබා දීමට ක්‍රියා කරනු ලැබීය. ඒ අනුව 2019 යල කන්නයේ ග්‍රාමීය වැව් 250 ක මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇති අතර, වව්නියාව දිස්ත්‍රික්කයේ වැව් 125ක් මේ සඳහා හඳුනාගෙන ඇත. මේ සඳහා ග්‍රාමීය වැව් යටතේ ඇති වාරි ඇළ මාර්ග ක්‍රමාන්තික කිරීම හා ජල මිනුම් කෝදු සවිකිරීමත්, විවිධ වගාබිම් ප්‍රමාණ සඳහා නිකුත් කළ යුතු ජල ප්‍රමාණ පිළිබඳව ගොවීන් දැනුවත් කිරීම සිදුකරනු ඇත. මේ සඳහා මෙම දෙපාර්තමේන්තුවේ තාක්ෂණ නිලධාරීන්ගේ සෘජු දායකත්වය ලබා ගැනීමට නියමිතය.

11.10. භූගත ජලය පිළිබඳ අධ්‍යයනය

2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 89 වගන්තිය යටතේ කෘෂිකාර්මික කටයුතු සඳහා වගා ළිං ඉදිකිරීමේ දී (භූගත ජලය යොදාගැනීම) ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතිය ලබාගත යුතු බව දැක්වේ. එහෙත් මේ සඳහා මෙතෙක් විද්‍යාත්මක ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. ඒ අනුව වැඩි වගා ළිං ප්‍රමාණයක් පිහිටි අනුරාධපුරය, යාපනය, පුත්තලම හා හම්බන්තොට දිස්ත්‍රික්කවල පිහිටි සියලු නොගැඹුරු ළිං අධ්‍යයනය කොට ඉදිරියේ දී එම ප්‍රදේශවල නොගැඹුරු භූගත ජලය භාවිතා කිරීම පිළිබඳ මහපෙන්වීම් සිදුකිරීමට අවශ්‍ය අධ්‍යයන කටයුතු 2018 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. එසේම මීට අදාළ නිර්දේශය 2019/2020 වර්ෂය තුළ ලබාදීමට නියමිතය.

11.11. එල්ලංහා වැඩිදියුණු කිරීම

මෙරටට ආවේණික වූ මෙන්ම කෘෂිකාර්මික ලෝක උරුමයක් ලෙස ප්‍රකාශයට පත්කරන ලද ශ්‍රී ලංකාවේ එල්ලංහා පද්ධති 1116 ක් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ජල කළමනාකරණ අංශය විසින් 2005 වර්ෂයේ ප්‍රකාශයට පත්කරන ලද "ශ්‍රී ලංකාවේ එල්ලංහා සිතියමෙන්" හඳුන්වා දී ඇති අතර, පවතින දේශගුණික විපර්යාසයේ අහිතකර බලපෑම් මහහරවා ගැනීම සඳහා එල්ලංහා වැඩිදියුණු කිරීම ඉතා හොඳ විසඳුමක් බවට ජාතික වශයෙන් මෙන්ම අන්තර්ජාතික වශයෙන් විශාල පිළිගැනීමකට භාජනය වී ඇත.

ඉහත අරමුණු පදනම් කර ගනිමින්, මෙරටේ එල්ලංහා වැඩිදියුණු කිරීම සඳහා පහත සඳහන් ප්‍රවේශයන් මෙම දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂය තුළ මේ වන විට ක්‍රියාත්මක කර ඇත.

I. ඉදිරි වසර 04 තුළ ක්‍රියාත්මක වන පරිදි එල්ලංහා වැඩිදියුණු කිරීමේ දේශීය ව්‍යාපෘතියක් සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීම හා මේ සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදුකිරීම. මේ යටතේ 2018 වර්ෂයේ රු. මිලියන 400 ක් වැය කරමින් ග්‍රාමීය වැව් එල්ලංහා 03 ක පිහිටා ඇති එල්ලංහා වැව් 27 ක අලුත්වැඩියා කටයුතු ආරම්භ කරන ලදී. මෙම එල්ලංහාවන් වව්නියාව, හම්බන්තොට හා මොණරාගල දිස්ත්‍රික්කවල පිහිටා ඇත.

II. Green Climate fund ආධාර වැඩසටහන යටතේ UNDP ආයතනය හා පරිසර අමාත්‍යාංශය විසින් මෙහෙයවනු ලබන Climate Resilient Integrated Agriculture Project (වැව්ගම් පුබුදුව) ව්‍යාපෘතියේ ප්‍රධාන පාර්ශවකරු ලෙස අනුරාධපුර හා කුරුණෑගල දිස්ත්‍රික්කවල එල්ලංහා පද්ධති 17 ක් හා වැව් 286 ක් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය අධ්‍යයන කටයුතු සිදුකිරීමට දායක විය. මෙම ව්‍යාපෘතිය මඟින්

ඉදිරි වසර 05 තුළ එල්ලංහා වැඩිදියුණු කිරීමේ වැඩසටහන මෙම දෙපාර්තමේන්තුවේ දායකත්වය ඇතිව ක්‍රියාත්මක වනු ඇත.

III. කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ලෝක බැංකු ආධාර ලබන Climate Smart Irrigated Agriculture Project යටතේ වැඩිදියුණු කළයුතු එල්ලංහා පද්ධති 120 ක් හා ග්‍රාමීය වැව් 1550ක් පරිපාලන දිස්ත්‍රික්ක 11 ක හඳුනා ගැනීමට දායක වෙමින් මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන පාර්ශවකරු ලෙස ක්‍රියාකිරීමට හැකිවිය. මෙම ව්‍යාපෘතියේ ඉදිරි වසර 05 තුළ (2018-2023) මෙරටේ එල්ලංහා වැඩිදියුණු කිරීමේ කටයුතුවල ක්‍රියාත්මක කිරීමට නියමිතය.

IV. ආසියානු සංවර්ධන අරමුදල (ADB) යටතේ වන එල්ලංහා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ඉදිරි වසර 07 තුළ වයඹ සහ ඌව පළාත් වල ක්‍රියාත්මක කිරීමට නියමිත අතර, එම ව්‍යාපෘතිය පිළිබඳ අදාළ මූල්‍ය ආයතන සමඟ මූලික එකඟතාවයකට එළඹීමට හැකිවිය.

V. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය වැව් එල්ලංහා ආශ්‍රිතව ‘‘එල්ලංහා බල මණ්ඩල’’ නමින් ගොවීන් සඳහා වූ නව ආයතනික ව්‍යුහයක් හඳුන්වා දීමට අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කරන ලද අතර, එම කටයුතු 2019 වර්ෂයේ ක්‍රියාවට නැංවීමට නියමිතය. මෙහිදී අදාළ එල්ලංහා ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන සියලුම ජල පරිභෝජන සමිතිවල නියෝජිතයින්ගෙන් සමන්විත ඒකාබද්ධ බල මණ්ඩලයක් බිහිවන අතර, අදාළ එල්ලංහාව තුළ සියලුම මතුපිට හා භූගත ජල භාවිතය පිළිබඳ සැලසුම් ක්‍රියාවට නැංවීම හා කළමනාකරණය පිළිබඳ වගකීම එම එල්ලංහා ඒකාබද්ධ බල මණ්ඩලවලට පැවරෙනු ඇත. මෙම නව ආයතනික ව්‍යුහය සඳහා අවශ්‍ය නෛතික රාමුකරණය ගොවිජන සංවර්ධන පනතේ රෙගුලාසි යටතේ ලබාදීමට සැලසුම් කර ඇත.

11.12. ක්ෂුද්‍ර වාරි තාක්ෂණය හඳුන්වාදීම

දේශගුණික විපර්යාසයේ ප්‍රතිඵලයක් ලෙස නිරන්තර නියහ තත්ත්වයන්ට මුහුණ දෙන ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ කෘෂිකාර්මික කටයුතු සාර්ථක කර ගැනීම සඳහා වාරි ජල කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම අත්‍යවශ්‍ය වන අතර, ඒ සඳහා බිංදු හා විසිරුම් වාරි තාක්ෂණය රටපුරා ව්‍යාප්ත කිරීම වඩාත් ප්‍රබල උපායමාර්ගික ප්‍රවේශයක් වනු ඇත. මේ සඳහා පවතින ප්‍රධාන බාධකය ලෙස ක්ෂුද්‍ර වාරි තාක්ෂණ නිර්මාණ කිරීමට මෙරට තාක්ෂණ නිලධාරීන් හට පවතින ගැටලුව හඳුනාගෙන ඇති අතර, ඊට විසඳුමක් ලෙස ක්ෂුද්‍ර වාරි තාක්ෂණ නිර්මාණ පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුවක් මෙම දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවරුන් හා තාක්ෂණ නිලධාරීන් 60 දෙනෙකු වෙත ලබා දීමට ක්‍රියා කරන ලදී. මෙම පුහුණුව සඳහා උතුරු මැද හා වයඹ පළාත් සභා නිලධාරීන් හට ද ආරාධනා කිරීම විශේෂත්වයකි. මෙසේ පුහුණුව ලද නිලධාරීන් 2019 වර්ෂයේ තමා සේවය කරනු ලබන දිස්ත්‍රික්කවල ඊට අදාළ නියමු ව්‍යාපාර අත්හදා බැලීමට ද නියමිතය.

11.13. බෝග විවිධාංගීකරණය සඳහා කුඹුරු ඉඩම් වර්ගීකරණය

ග්‍රාමීය වැව්වල ජලය හිඟ යල වගා කන්නවලදී අතුරු බෝග වගාකරලීම සඳහා සුදුසු බිම් හඳුනාගැනීම ප්‍රබල අවශ්‍යතාවයක්ව පවතින අතර, මේ නිසා මෙම දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවරුන් හා තාක්ෂණ නිලධාරීන් 60 දෙනෙකුට කෘෂිකාර්මික ඉඩම් වර්ගීකරණය සඳහා අවශ්‍ය ප්‍රායෝගික පුහුණුව ලබාදෙන ලදී. ඊට අමතරව 2019 වර්ෂයේ මෙම දෙපාර්තමේන්තුවේ සියලුම කෘෂිකර්ම සහතිකපත්‍රලාභීන් හා ඩිප්ලෝමාධාරීන් වෙත පුහුණුව ලබා දීමට මෙන්ම වියළි කලාපීය ප්‍රදේශවල පිහිටා ඇති ගොවිජන සේවා

මධ්‍යස්ථාන 320 සඳහා පස් සාම්පල ලබා ගැනීමට අවශ්‍ය Soil Auger කට්ටල ලබා දීමට ද සැලසුම් කර ඇත.

11.14. පාංශු සෞඛ්‍ය කාඩ්පත් හඳුන්වා දීම

කුඹුරු ඉඩම්වල පසේ සෞඛ්‍ය තත්ත්වය අයහපත් වීම නිසා කොපමණ පොහොර යෙදුව ද, ඒවා අවශෝෂණය කර ගැනීමට ශාඛාවලට නොහැකිවන අවස්ථා නිරන්තරයෙන් වාර්තා වන අතර, මෙම තත්ත්වය මහහැරවීම සඳහා සෑම කුඹුරු ඉඩමක් සඳහාම පාංශු සෞඛ්‍ය කාඩ්පත් ක්‍රමය හඳුන්වාදීමට සැලසුම් කර ඇත. මෙහි මූලික අදියරක් ලෙස 2018 වර්ෂයේ අනුරාධපුර, පුත්තලම හා යාපනය දිස්ත්‍රික්ක සඳහා පාංශු සෞඛ්‍ය කාඩ්පත් ක්‍රමය හඳුන්වා දීමට ක්‍රියාකළ අතර, 2019 හා 2020 වර්ෂයේ දී ලංකාවේ සියලුම කුඹුරු ඉඩම් සඳහා මෙම ක්‍රමය හඳුන්වා දීමට සැලසුම් කර ඇත. මේ සඳහා උපකාර වන පරිදි ඉහත දිස්ත්‍රික්ක තුනෙහි පිහිටා ඇති සියලුම ගොවිජන සේවා මධ්‍යස්ථාන සඳහා කුඩා පරිමාණ පාංශු පරීක්ෂණාගාර ස්ථාපිත කිරීමට හා ඒ සඳහා නිලධාරීන් පුහුණු කිරීමට ද 2018 වර්ෂය තුළ ක්‍රියා කරන ලදී.

11.15. සුළු වාරිමාර්ග පරීක්ෂණ ලේඛන

සුළු වාරිමාර්ග හදිසි නඩත්තු කටයුතු නිසි කළට සිදුනොවීම නිසා එම වාරි නිර්මිත බිඳවැටෙන අවස්ථා පිළිබඳව නිරන්තරයෙන් වාර්තාවන අතර, ඒ සඳහා පිළියමක් ලෙස සෑම වසරකම දෙවතාවක් අදාළ වාරි නිර්මිත පරීක්ෂා කොට ඊට අදාළ ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තාව ‘‘පරීක්ෂණ ලේඛනයක’’ (Check list) ආධාරයෙන් සම්පූර්ණ කොට අදාළ ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙත ලබාදීම හා ඉන් අනතුරුව මෙම දෙපාර්තමේන්තුවේ තාක්ෂණ නිලධාරීන් විසින් එම පරීක්ෂණ ලේඛන පරීක්ෂා කොට ඊට අදාළ සුදුසු ප්‍රතිකර්මීය ක්‍රියා සිදුකිරීමට නියමිතය. මේ සඳහා අවශ්‍ය සුළු වාරිමාර්ග පරීක්ෂණ ලේඛන වැව්, අමුණු හා ඇළ මාර්ග සඳහා සිංහල හා දෙමළ බසින් ඉදිරි වසර 05 ට අවශ්‍ය ප්‍රමාණයන් අදාළ දිස්ත්‍රික්කය වෙත ලබා දීමට ක්‍රියා කරන ලදී.

11.16. අලුත්වැඩියාව සඳහා සුළු වාරිමාර්ග ප්‍රමුඛතාගත කිරීම

මේ සඳහා දීප ව්‍යාප්ත සුළු වාරිමාර්ග සමීක්ෂණයක් 2018 වසරේ ක්‍රියාත්මක කරන ලද අතර, මෙහි දී සියලුම වැව්, මේ සඳහා දීප ව්‍යාප්ත අමුණු ඇළ මාර්ගවල අලුත්වැඩියා අවශ්‍යතා හඳුනාගෙන ඒ අනුව සුළු වාරිමාර්ග අලුත්වැඩියා ප්‍රමුඛතාගත කිරීමට අවශ්‍ය සැලසුම් සකසන ලදී. මේ අනුව ගොවිජන සේවා මධ්‍යස්ථාන මට්ටමින් පිළියෙළ වන මෙම නව ප්‍රමුඛතා ලේඛනය සුළු වාරිමාර්ග අලුත්වැඩියා කටයුතුවලදී ඉදිරි වසර 05 තුළ යොදා ගැනීමට නියමිතය.

11.17. ක්ෂණික නඩත්තු වැඩසටහන් (Kick Start) හඳුන්වාදීම.

දීර්ඝ කාලීන සමීක්ෂණ කටයුතුවලින් තොර, එහෙත් ක්ෂණිකවම ක්‍රියාත්මක කළයුතු හදිසි හා සුළු වාරි වාරිමාර්ග නඩත්තු සහ අලුත්වැඩියාවන් නියමිත වකවානුව තුළ ඉටු නොකිරීමෙන්, එම වාරි කර්මාන්තයට විශාල හානි සිදුවිය හැකි අතරම, එම හානි පියවාගැනීම සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවන බව දිගින් දිගටම වාර්තා වෙමින් පවතී.

මෙම තත්ත්වය මඟහරවා ගැනීම සඳහා Kick Start නමින් විශේෂ නඩත්තු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර 2018 වර්ෂයේ රු.මි 50 ක් යොදාගනිමින් හදිසි නඩත්තු හා අලුත්වැඩියා කටයුතු 1000 ක් සිදුකිරීමට කටයුතු කරන ලදී. මෙම වැඩසටහන ගොවීන් අතර ඉතා ජනප්‍රිය වූ අතර 2018 වර්ෂයේ ඉතා

සාර්ථක වැඩසටහනක් බවට පත්විය. මේ යටතේ දරන ලද පිරිවැය මෙන් කිහිප ගුණයක වැඩ කොටස් මෙන්ම ඉහළ ප්‍රමිතියකින් යුතුව අලුත්වැඩියා කටයුතු ඉටුකිරීමට ගොවි සංවිධාන සමත් විය.

11.18. ඉදිකිරිම් තත්ත්ව පාලනාගාර ආරම්භ කිරීම

මේ යටතේ මන්නාරම, පුත්තලම හා මඩකළපුව දිස්ත්‍රික්ක සඳහා නව තත්ත්ව පාලන උපකරණ හඳුන්වාදීමටත්, කොළඹ මාලඹේ පිහිටි මධ්‍යම තත්ත්ව පාලනාගාරය සඳහා නවින තත්ත්ව පාලන උපකරණ ලබාදීමටත් ක්‍රියා කරන ලදී. මේ යටතේ පුත්තලම හා මඩකළපුව දිස්ත්‍රික්කවල නව ඉදිකිරිම් තත්ත්ව පාලනාගාර ස්ථාපිත කිරීමට හැකිවිය. මේ මඟින් වැව් හා අමුණු ඉදිකිරීම්වල ප්‍රමිතිය ආයු කාලය වැඩි කිරිමට අපේක්ෂා කෙරේ.

11.19. ගංවතුර පිළිබඳ පූර්ව දැනුම්දීමේ ක්‍රමවේදයක් ආරම්භ කිරීම

වර්ෂාපතනය, වාෂ්පීකරණය, වැව්වල ජල උස මෙන්ම වගා බිම් පිළිබඳ තොරතුරු යොදා ගනිමින් එක් එක් ගොවිජන සේවා බල ප්‍රදේශවල ජල හිඟය පිළිබඳ පූර්ව දැනුම් දීමේ ක්‍රමවේදයක් සකස් කිරීමේ සැලසුම් 2018 වර්ෂයේ දී සිදු කරන ලදී. මෙම මෙහෙයුම් සාර්ථක කර ගැනීමට අවම වශයෙන් වසර 02 ක කාලයක් ගතවන අතර, මේ සඳහා දිවයිනේ සියලුම ගොවිජන සේවා මධ්‍යස්ථානවල පරිගණක ජාලගත කිරීමට ද අවශ්‍ය කටයුතු ආරම්භ කොට ඇත.

දේශගුණික විපර්යාස නිසා ඉදිරියේ දී ඇතිවිය හැකි ජල හිඟ තත්ත්වයන්ට සාර්ථකව මුහුණ දීම සඳහා මෙම ක්‍රමවේදය අතිශයින් ප්‍රයෝජනවත් වනු නියතය.

11.20. ජල කළමනාකරණ පුහුණු කටයුතු

මේ සඳහා 2018 වර්ෂයේ දෙපාර්තමේන්තු අරමුදල් යොදා ගැනීමෙන් දිස්ත්‍රික් මට්ටමේ ගොවීන් සහ ගොවි නායකයින් 4000 ක් පුහුණු කිරීම අවසන් කර ඇති අතර, පරිසර අනුගත වීමේ විශේෂ ව්‍යාපෘතිය යටතේ නුවරඑළිය සහ පොළොන්නරුව දිස්ත්‍රික්කවල හඳුනා ගත් ගොවිජන සේවා බල ප්‍රදේශවල ගොවි නායකයින් 100 ක් හා ගොවීන් 800 ක් දේශගුණික විපර්යාසවලට එරෙහිව ජල සංරක්ෂණ උපාය මාර්ග හා කෘෂිකාර්මික සැලසුම්කරණය පිළිබඳ පුහුණු කිරීමට හැකියාව ලැබුණි.

මෙම මාතෘකාව යටතේ සියලුම දිස්ත්‍රික්ක නියෝජනය කරමින් පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් මඟින් 2018 වර්ෂයේ පුහුණුකරුවන් 50 දෙනෙකු පුහුණු කිරීමට ද හැකිවිය.

11.21. දෙපාර්තමේන්තු සංයුක්ත සැලැස්ම

2018 - 2023 කාල වකවානුව සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ සංයුක්ත සැලැස්ම පිළියෙළ කිරීමට අවශ්‍ය සම්පත් දායකත්වය ලබා දීම 2018 වර්ෂයේ ජල කළමනාකරණ අංශයේ සිදු කරන ලදී. එම සැලැස්ම 2019 වර්ෂයේ දෙපාර්තමේන්තු ප්‍රකාශනයක් ලෙස එළිදැක්වීමට නියමිතය.

11.22. කුඹුරු ඉඩම් සංශෝධනයට අදාළ දෙපාර්තමේන්තු චක්‍රලේඛ

2018 වර්ෂයේ ශ්‍රී ලංකාවේ කුඹුරු ඉඩම් ආරක්ෂා කර ගැනීමට අදාළ පහත සඳහන් දෙපාර්තමේන්තු චක්‍රලේඛ පිළියෙළ කිරීමේදී අවශ්‍ය සම්පත් දායකත්වය ද මෙම අංශය විසින් ලබා දෙන ලදී.

අනු අංකය	චක්‍රලේඛ අංකය	විස්තරය
01	01/2018	කෘෂිකාර්මික ඉඩම් ලේඛන මහජන පරීක්ෂාව සඳහා විවෘතව තැබීම හා සංශෝධන සඳහා හිමිකම් විරෝධතා භාර ගැනීම.
02	05/2018	මෙතෙක් කිසිදු කෘෂිකාර්මික ඉඩම් ලේඛනයක ඇතුළත්ව නොමැති ගොඩ ඉඩමක් අයිතිකරුගේ ඉල්ලීම මත කෘෂිකාර්මික (ගොඩ) ඉඩම් ලේඛනයට ඇතුළත් කිරීම.
03	06/2018	2015/2017 කෘෂිකාර්මික ඉඩම් (කුඹුරු) ලේඛන ප්‍රතිශෝධන වැඩසටහන යටතේ හඳුනාගත් පුරන් කුඹුරුවලට අදාළ තොරතුරු ඇතුළත් ලේඛනයක් පිළියෙළ කිරීම
04	07/2018	කුඹුරු ඉඩමක් කෘෂිකාර්මික වගාවක් සඳහා හැර වෙනත් කාර්යයක් සඳහා යෙදවීමට හෝ වගා කිරීම හැර වෙනත් යම් කාර්යයක් සඳහා කුඹුරු ඉඩම් ගොඩ කිරීමට අවසර ලබා ගැනීමේ ක්‍රියාවලිය.
05	08/2018	ගොවිජන සංවර්ධන පනතේ 53 වගන්තිය ප්‍රකාරව සිදු කරනු ලබන කෘෂිකාර්මික ඉඩම් (කුඹුරු) ලේඛන ප්‍රතිශෝධන වැඩසටහන
06	10/2018	මෙතෙක් කෘෂිකාර්මික ඉඩම් ලේඛනයක ඇතුළත්ව නොමැති ගොඩ ඉඩමක් අයිතිකරුගේ ඉල්ලීම මත කෘෂිකාර්මික (ගොඩ) ඉඩම් ලේඛනයට ඇතුළත් කිරීම හා යම් ඉඩමක් කෘෂිකාර්මික ඉඩමක් නොවන බව ප්‍රකාශ කිරීම.
07	19/2018	පුරන් වී ඇති කුඹුරු ඉඩම්වල පරිසර හානියක් සිදු නොවන පරිදි වී හැර අර්ධ වාර්ෂික බෝග හෝ බහු වාර්ෂික බෝග හෝ කෘෂිකාර්මික වගාවක් නොවන වෙනත් කෘෂිකාර්මික කටයුතු සඳහා හා කෘෂිකර්මයට අදාළ වෙනත් කටයුතු සඳහා යොදා ගැනීමට අවසර ලබා දීම.
08	24/2018	කුඹුරු ඉඩම්වලින් ඛනිජ සම්පත්ලබා ගැනීම වෙනුවෙන් අවසර ලබා දීම.
09	26/2018	06/2018 චක්‍රලේඛයේ හඳුනාගත් “C” බාණ්ඩයේ පුරන් කුඹුරු පිළිබඳ තොරතුරු ප්‍රධාන කාර්යාලය වෙත වාර්තා කිරීම.

11.23. ජල කළමනාකරණ ප්‍රකාශන

පහත සඳහන් ජල කළමනාකරණ ප්‍රකාශන පිළියෙළ කරන ලද අතර, එම ප්‍රකාශන 2019 වර්ෂයේ එළි දැක්වීමට නියමිතය. වාරිමාර්ග සහ ජල කළමනාකරණ ක්ෂේත්‍රයේ මෙතෙක් පැවති ප්‍රබල දැනුම් හිඳැස (knowledge gap) පියවීමට පහත සඳහන් I, II සහ III ප්‍රකාශන ඉවහල් වනු නියතය.

I. ග්‍රාමීය වැව් එල්ලංහා වැඩිදියුණු කිරීම සහ ප්‍රමුඛතාගත කිරීමේ ක්‍රමවේදය

II. ක්ෂුද්‍ර වාරි තාක්ෂණ නිර්මාණ

III. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය වැව් බැමි ආරක්ෂණය සඳහා වන ක්‍රමවේදය

12. මෙහෙයුම් හා ඇගයුම් අංශය

12.1. අරමුණු සහ වගකීම්

1. දෙපාර්තමේන්තුවේ කෘෂිකාර්මික සංවර්ධනයට අදාළ සම්පත් කළමනාකරණ සැලසුම් සැකසීම.
2. දෙපාර්තමේන්තුවේ සංවර්ධන වැඩසටහන් මෙහෙයවීම හා ඇගැයීම් කටයුතු.
3. දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය.
4. කෘෂිකාර්මික දත්ත පසුබිම් කළමනාකරණය.

12.2. කාර්යයන්

1. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම හා අමාත්‍යාංශයට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීම.
2. දෙපාර්තමේන්තුවේ ආංශික කාර්ය භාරය සහ විෂය පථය සකස් කිරීම.
3. සියලුම ප්‍රගති වාර්තා සකස් කිරීම - සංවර්ධන වැඩසටහන්/ විශේෂ ව්‍යාපෘති/ විදේශාධාර ව්‍යාපෘති
4. කෘෂිකර්ම අමාත්‍යාංශය ඇතුළු අනෙකුත් ආයතන මඟින් කලින් කළට ඉල්ලා සිටින තොරතුරු සකස් කර යැවීම.
5. කාර්ය මණ්ඩල රැස්වීම් හා වාර්තා පිළියෙළ කිරීම.
6. නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන්ගේ මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් සංවිධානය හා මෙහෙයවීම.
7. සම්පත් පැතිකඩ දත්ත තොරතුරු ලේඛනය සකස් කිරීම හා යාවත්කාලීන කර පවත්වා ගැනීම.
8. විගණන විමසුම් සඳහා පිළිතුරු හා විගණනයට අවශ්‍ය තොරතුරු සැපයීම.
9. දෙපාර්තමේන්තු දුරකථන නාමාවලිය සකස් කිරීම හා යාවත්කාලීන කර පවත්වා ගැනීම.
10. අමාත්‍යාංශ කාර්ය සාධන වාර්තාව සඳහා තොරතුරු ලබා දීම.
11. ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්තුමා විසින් පවරනු ලබන අනෙකුත් කාර්යයන් සිදු කිරීම.

12.3. මෙහෙයුම් හා ඇගයුම් අංශයේ සේවය කරන නිලධාරීන් සංඛ්‍යාව

තනතුර	නිලධාරීන් සංඛ්‍යාව
සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)	01
උපාධිධාරී අභ්‍යාසලාභී සංවර්ධන නිලධාරී	01
රාජ්‍ය කළමනාකරණ සහකාර	06
කම්ටු ලිපිකරු	01
කාර්යාල කාර්ය සහයක	01

12.4. 2018 වර්ෂය තුළ මෙහෙයුම් හා ඇගයුම් අංශය මඟින් අත්පත් කරගැනීමට නියමිත ඉලක්ක

1. 2018 වර්ෂය සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාළ ක්‍රියාකාරී සැලැස්ම (Annual Action Plan) සකස් කිරීම.
2. 2018 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව සකස් කිරීම සඳහා අමාත්‍යාංශය වෙත තොරතුරු ලබා දීම.
3. ක්‍රියාකාරී සැලැස්මට අදාළව දිස්ත්‍රික් මට්ටමින් මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.
4. දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන සියලුම සංවර්ධන වැඩසටහන්වල කාර්තුමය/ මාසික ප්‍රගති වාර්තා සකස් කිරීම.
5. මාණ්ඩලික නිලධාරී රැස්වීම් වාර්තා සකස් කිරීම.
6. නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන්ගේ මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් සංවිධානය හා මෙහෙයවීම.
7. සම්පත් පැතිකඩක් සකස් කිරීම හා තොරතුරු යාවත්කාලීන කිරීම.
8. දුරකතන නාමාවලිය සකස් කිරීම හා යාවත්කාලීන කිරීම.
9. දෙපාර්තමේන්තුවේ ආංශික කාර්යභාරය හා විෂය පථය සකස් කිරීම.
10. විගණන විමසුම් සඳහා පිළිතුරු හා විගණනයට අවශ්‍ය තොරතුරු සැපයීම.

12.5. 2018 වර්ෂය අවසානයේ අත්පත් කරගත් ඉලක්ක

1. 2018 වර්ෂය සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාළ ක්‍රියාකාරී සැලැස්ම (Annual Action Plan) සකස් කර අමාත්‍යාංශ අනුමැතිය ලබා ගෙන ඇත.
2. 2018 වර්ෂයේ කාර්ය සාධන වාර්තාවට අවශ්‍ය තොරතුරු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.
3. දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන සියලුම සංවර්ධන වැඩසටහන්වල (දිස්ත්‍රික් මට්ටමින්) සෑම මසකම ප්‍රගති වාර්තා සකස් කර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම/ කාර්තු වශයෙන් ඉදිරිපත් කිරීමට නියමිත කාර්තු ප්‍රගති සියල්ලම අමාත්‍යාංශය වෙත යවා අවසන් කර ඇත.
4. නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන්ගේ මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් 8 ක් පවත්වා ප්‍රගති සමාලෝචන කටයුතු සිදු කර ඇත.
5. නියමිත කාලසටහනට අනුව මාණ්ඩලික නිලධාරී රැස්වීම් සියල්ල පැවැත්වීම හා ඒවායේ වාර්තා පිළියෙළ කර සියලුම මාණ්ඩලික නිලධාරීන් වෙත ලබාදී ඇත.
6. සම්පත් පැතිකඩක් සකස් කිරීම හා 2018.12.31 දිනට යාවත්කාලීන තොරතුරු සහිතව මුද්‍රණය කර ඇත.
7. දුරකථන නාමාවලිය සකස් කිරීම හා මුද්‍රණය කර ඇත.
8. දෙපාර්තමේන්තුවේ ආංශික කාර්යභාරය හා විෂය පථය සකස් කර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම සිදු කර ඇත.
9. විගණන අංශයෙන් කෙරෙන විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම හා විවිධ අවස්ථාවලදී ඉල්ලන පරිදි විගණනයට අවශ්‍ය තොරතුරු සියල්ල ලබා දී අවසන් කර ඇත.
10. දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන්වලට අදාළව වෙනත් ආයතන මඟින් කලින් කලට ඉල්ලනු ලබන තොරතුරු වාර්තා සකස් කර යවා ඇත.

13. තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ඉටුකළ කර්තව්‍යන්

ලොව රටවල් අතර පවතින දරිද්‍රතාවය , අසමාන සම්පත් බෙදී යෑම්, සෞඛ්‍යමය හා පාරිසරික ගැටලු මඟහරවා ගැනීම උදෙසාත් තිරසර සංවර්ධනයක් ඇති කිරීම උදෙසාත්, ළඟා වීමට අපේක්ෂා කරන පරිසාධිත තත්ත්වයන් තිරසර සංවර්ධන අරමුණු නමින් හැඳින්වේ. ඒවා පහත පරිදි වේ.

අරමුණ 01

- සියලු ආකාරයේ දිළිඳුකම බව, සියලු තැන්හිම දුරු කිරීම.

අරමුණ 02

- කුසගින්න දුරලීම, ආහාර සුරක්ෂිතතාව හා ඉහළ පෝෂණයක් අත්පත් කර ගැනීම සහ තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම.

අරමුණ 03

- නිරෝගී ජීවිතයක් තහවුරු කිරීම හා සියලු දෙනාට, සෑම වයසකදීම යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම.

අරමුණ 04

- සමාන හා අන්තර්ග්‍රහණීය (සියලු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) වූ අධ්‍යාපනයක් ලැබීම තහවුරු කිරීම හා සැමට ජීවිත කාලය පුරා අධ්‍යාපනය ලැබීමේ අවස්ථා ප්‍රවර්ධනය කිරීම.

අරමුණ 05

- ස්ත්‍රී පුරුෂ සමාජභාවය අත්කරගැනීම සහ කාන්තාවන් හා ගැහැණු ළමයින් බලගැන්වීම.

අරමුණ 06

- සැමට ජලය ලැබීම හා තිරසර ජල කළමනාකරණය හා සනීපාරක්ෂාව ලැබීමේ අයිතිය සුරක්ෂිත කිරීම.

අරමුණ 07

- දරාගත හැකි වූ, විශ්වාස වූ, තිරසර හා නූතන බලශක්තිය සඳහා ප්‍රවේශය සැමට තහවුරු කිරීම.

අරමුණ 08

- දරාගත හැකි, අන්තර්ග්‍රහණීය සහ තිරසර ආර්ථික වර්ධනයක් සම්පූර්ණ හා ඵලදායී රැකියාවක් හා සැමට ගෞරවාන්විත වෘත්තියක් ලැබීම ප්‍රවර්ධනය කිරීම.

අරමුණ 09

- ප්‍රත්‍යාස්ථ වූ යටිතල පහසුකම් තැනීම, අන්තර්ග්‍රහණය හා තිරසර කාර්මීකරණයක් ප්‍රවර්ධනය, නවෝත්පාදනය ධෛර්යමත් කිරීම.

අරමුණ 10

- රටවල් ඇතුළත හා රටවල් අතර ඇති අසමානතාව අඩු කිරීම.

අරමුණ 11

- නගර හා මානව ජනාවාස අන්තර්ග්‍රහණය, ආරක්ෂිත ප්‍රත්‍යාස්ථ හා තිරසර බවට පත්කිරීම.

අරමුණ 12

- තිරසර පරිභෝජන හා නිෂ්පාදන රටා තහවුරු කිරීම.

අරමුණ 13

- දේශගුණික වෙනස්වීම් හා එහි බලපෑම් වැළැක්වීම සඳහා කඩිනම් පියවර ගැනීම.

අරමුණ 14

- සාගර, මුහුදු හා සමුද්‍රීය සම්පත් සංරක්ෂණය කිරීම හා තිරසර සංවර්ධනය සඳහා යොදා ගැනීම.

අරමුණ 15

- භෞමික පරිසර පද්ධති ආරක්ෂා කරගැනීම, ප්‍රතිස්ථාපනය කිරීම හා තිරසර භාවිතය ප්‍රවර්ධනය කිරීම , වනාන්තර තිරසර ආකාරයෙන් කළමනාකරණය කිරීම හා ජෛව විවිධත්වය අහිමි වීම නැවැත්වීම.

අරමුණ 16

- තිරසර සංවර්ධනය සඳහා වූ සාමකාමී හා අන්තර්ග්‍රහණය වූ සමාජ ප්‍රවර්ධනය හා සැමට සාධාරණය සඳහා ප්‍රවේශය සැපයීම හා වගකීමක් සහිත හා අන්තර්ග්‍රහණය වූ ආයතන සෑම මට්ටමකම ස්ථාපිත කිරීම.

අරමුණ 17

- තිරසර සංවර්ධනය සඳහා වූ ගෝලීය සහයෝගීතාව ක්‍රියාත්මක කිරීමේ සහ නව ජීවයක් දීමේ මාර්ග ශක්තිමත් කිරීම.

රජයේ තීරණ හා ප්‍රතිපත්තිවලට අනුව යමින් 2018 වර්ෂය තුළ දී, තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ඉටු කළ කර්තව්‍යන් පහත පරිදි පෙළගැස්විය හැක.

අරමුණ 01 :

- ගොවි ජනතාවට අවශ්‍ය බීජ හා රෝපණ ද්‍රව්‍ය, පැළ වර්ග, කෘෂි උපකරණ හා වෙනත් අවශ්‍ය කෘෂිකාර්මික ද්‍රව්‍ය ගොවිජන සේවා මධ්‍යස්ථාන මඟින් සහන මිලට සපයා දීම.
- ගොවීන් හට නෛතික උපදේශන ලබා දීම.
- ගොවිජන සංවර්ධන අරමුදලින් මධ්‍යස්ථානවල සැපයුම වැඩි දියුණු කිරීම හා සංවර්ධනය කිරීම යටතේ අලෙවිසල් සංවර්ධනය කිරීම.
- ‘‘වැව් දහසයි ගම් දහසයි’’ වැඩසටහන මඟින් වාරි කර්මාන්තය සහ ග්‍රාමීය යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම මෙන්ම මහජන සුභ සිද්ධිය සඳහා කටයුතු කිරීම.
- පළතුරු ගම්මාන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සිතුමු ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම.
- ගොවිජන බැංකු මඟින් ගොවීන්ගේ කෘෂිකාර්මික කටයුතු සඳහා ණය පහසුකම් ලබා දීම.
- ගොවිජන බැංකු මඟින් ගොවීන්ගේ ඉතිරි කිරීම් වර්ධනය කිරීමට ක්‍රියා කිරීම.

අරමුණ 02 :

- පළතුරු ගම්මාන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ‘‘වැව් දහසයි ගම් දහසයි’’ වැඩසටහන මඟින් වාරි කර්මාන්තය සහ ග්‍රාමීය යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම මෙන්ම මහජන සුබසිද්ධිය සඳහා කටයුතු කිරීම.
- සිතුමු ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම.
- ගොවිජන සංවර්ධන අරමුදලින් මධ්‍යස්ථානවල සැපයුම වැඩි දියුණු කිරීම හා සංවර්ධනය කිරීම යටතේ අලෙවිසල් සංවර්ධනය කිරීම.
- ග්‍රාමීය මට්ටමේ බීජ වී ගොවිපලවල් ස්ථාපිත කිරීම.
- පුරන් කුඹුරු නැවත වගා කරවීම.
- කුඹුරු ඉඩම් පිළිබඳ පරිගණකගත දත්ත පාදමක් සැකසීම.
- බෝග විවිධාංගීකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ජාතික ආහාර නිෂ්පාදන සංග්‍රාමයට අයත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- ''අපි වවලයි අපි කන්නේ'' කඩිනම් කෘෂිකාර්මික සංවර්ධන වැඩ පිළිවෙළ යටතේ පළතුරු ගම්මාන ස්ථාපිත කිරීම.

අරමුණ 03 :

- සිදුමු ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම.
- යාපනය, අනුරාධපුර, පුත්තලම හා හම්බන්තොට යන දිස්ත්‍රික්කවල පවතින භූගත ජලය පිළිබඳ අධ්‍යයන කටයුතු සිදු කිරීම.
- කාබනික පොහොර ප්‍රචලිත කිරීමේ වැඩසටහන් දියත් කිරීම.
- වැව් දහසයි ගම් දහසයි වැඩසටහන මඟින් වාරි කර්මාන්තය සහ ග්‍රාමීය යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම මෙන්ම මහජන සුභ සිද්ධිය සඳහා කටයුතු කිරීම.
- ''අපි වවලයි අපි කන්නේ'' කඩිනම් කෘෂිකාර්මික සංවර්ධන වැඩ පිළිවෙළ යටතේ පළතුරු ගම්මාන ස්ථාපිත කිරීම.

අරමුණ 04 :

- දේශීය හා විදේශීය පුහුණු වැඩ සටහන් නිලධාරීන් වෙත ලබා දීම.
- සිදුමු ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම.

අරමුණ 05 :

- සිදුමු කාන්තා ගොවි සංවිධාන පිහිටුවීමට අදාළව අමාත්‍යාංශය හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කටයුතු කිරීම.
- ගෙවතු වගා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

අරමුණ 06 :

- SAARC අරමුදල් මඟින් ක්‍රියාත්මක වන WASH ව්‍යාපෘතියට අදාළ කාර්යයන් සිදු කිරීම.
- යාපනය, අනුරාධපුර, පුත්තලම හා හම්බන්තොට යන දිස්ත්‍රික්ක වල පවතින භූගත ජලය පිළිබඳ අධ්‍යයන කටයුතු සිදු කිරීම.
- වැව් දහසයි ගම් දහසයි වැඩසටහන මඟින් වාරි කර්මාන්තය සහ ග්‍රාමීය යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම මෙන්ම මහජන සුභ සිද්ධිය සඳහා කටයුතු කිරීම.
- ග්‍රාමීය වැව්වල ජල උස මාපක සවි කිරීම.
- ග්‍රාමීය වැව්වලින් ජලය මැන නිකුත් කිරීම.

අරමුණ 07 :

- ගොවිජන සංවර්ධන අරමුදලින් මධ්‍යස්ථානවල සැපයුම වැඩි දියුණු කිරීම හා සංවර්ධනය කිරීම යටතේ අලෙවිසල් සංවර්ධනය කිරීම.
- සුළු වාරිමාර්ග නඩත්තු හා අලුත්වැඩියාවන් සඳහා ක්ෂණික නඩත්තු වැඩ සටහන් (**Kick Start**) හඳුන්වා දීම.
- ඉදිකිරීම් තත්ත්ව පාලනාගාර ආරම්භ කිරීම මඟින් වැව් හා අමුණු ඉදිකිරීම්වල ප්‍රමිතිය, ආයු කාලය වැඩි කිරීමට කටයුතු කිරීම.

අරමුණ 08 :

- සිදුමු ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම.
- ''අපි වවලයි අපි කන්නේ'' කඩිනම් කෘෂිකාර්මික සංවර්ධන වැඩ පිළිවෙළ යටතේ පළතුරු ගම්මාන ස්ථාපිත කිරීම.
- 2018 යල කන්නයේ කීඩැ හා පුරුක් පණු හානි සිදු වූ කුඹුරු හිමි ගොවීන් සඳහා බිත්තර වී සහනාධාර ලබාදීම.

අරමුණ 09 :

- කෘෂි මාර්ග ඉදිකිරීම හා අබලන් මාර්ග අලුත්වැඩියා කිරීම.
- ''වැව් දහසයි ගම් දහසයි'' වැඩසටහන මඟින් වාරි කර්මාන්තය සහ ග්‍රාමීය යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම මෙන්ම මහජන සුභ සිද්ධිය සඳහා කටයුතු කිරීම.
- ගොවිජන සංවර්ධන අරමුදලින් මධ්‍යස්ථානවල සැපයුම වැඩි දියුණු කිරීම හා සංවර්ධනය කිරීම යටතේ අලෙවිසල් සංවර්ධනය කිරීම.
- 4/2009 චක්‍රලේඛය පදනම් කරගනිමින් කාර්යක්ෂම කුඹුරු ඉඩම් වගාවට කුඹුරු ඉඩම් හා කෘෂිමාර්ග සකස්කර ගැනීම.
- පොහොර ගබඩා අලුතින් ඉදිකිරීම හා පැරණි ගබඩාවන්හි ධාරිතා පුළුල් කිරීම.
- දෛනික වර්ෂාපතන දත්ත හා වාරි කර්මාන්ත ස්වභාවික ආපදා කෙටි පණිවුඩ (SMS) මඟින් ප්‍රධාන කාර්යාලය වෙත දැනුම්දීමේ ක්‍රමවේදය හඳුන්වා දීම
- ග්‍රාමීය වැව් වල ජල උස SMS මඟින් ප්‍රධාන කාර්යාලය වෙත එවීමට ක්‍රමවේදයක් හඳුන්වා දීම.
- කෙතට අරුණ පොහොර වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- වගා ළිං ප්‍රතිසංස්කරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
  ගොවිජන සංවර්ධන අරමුදලින් ගොඩනැගිලි, වාහන හා උපකරණ නඩත්තු කිරීම හා අලුත්වැඩියා කිරීම.
- චන්ද්‍රිකා ඡායාරූප ඇසුරින් කුඹුරු ඉඩම් සඳහා පරිගණක දත්ත පාදමක් සැකසීම.
- වාරි ජලයේ ගුණාත්මය මැනීම සඳහා සිදු කරනු ලබන පරීක්ෂණ වැඩිදියුණු කිරීම.
- කෘෂිකාර්මික (කුඹුරු) ඉඩම් ලේඛන පරිගණකගත කිරීම.

අරමුණ 12 :

- සිදුමු ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම.
- ''අපි වවලයි අපි කන්නේ'' කඩිනම් කෘෂිකාර්මික සංවර්ධන වැඩ පිළිවෙළ යටතේ පළතුරු ගම්මාන ස්ථාපිත කිරීම.

අරමුණ 13 :

- පාරිසරික අනුගතවීම් හා සම්බන්ධ වාරිගත කෘෂිකර්ම ව්‍යාපෘතිය විසින් එල්ලංහා වැඩිදියුණු කිරීම.
- වගා ළිං ප්‍රතිසංස්කරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති දීපව්‍යාප්තව සිදු කිරීම.
- ''අපි වවලයි අපි කන්නේ'' කඩිනම් කෘෂිකාර්මික සංවර්ධන වැඩ පිළිවෙළ යටතේ පළතුරු ගම්මාන ස්ථාපිත කිරීම.
- වාරි ජලයේ ප්‍රමිතිය පරීක්ෂා කිරීම.

- ගොවිජන සේවා මධ්‍යස්ථාන මට්ටමින් දෛනික වර්ෂාපතනය මැනීම.
- ගොවිජන සේවා මධ්‍යස්ථාන මට්ටමින් කෘෂි කාලගුණික දත්ත මැනීම.
- ක්ෂුද්‍ර වාරි තාක්ෂණය හඳුන්වා දීම.
- බෝග විවිධාංගීකරණය සඳහා කුඹුරු ඉඩම් වර්ගීකරණය සිදුකිරීම.
- ගංවතුර පිළිබඳ පූර්ව දැනුම්දීමේ ක්‍රමවේදයක් ආරම්භ කිරීම.

අරමුණ 15 :

- කාබනික පොහොර ප්‍රචලිත කිරීමේ වැඩසටහන් දියත් කිරීම.
- ශ්‍රී ලංකාවේ ජල උල්පත්, ජල මාවත්, කෘෂි මාර්ග හා කුෂුද්‍ර වැව් සඳහා දත්ත පාදමක් සැකසීම.
- භූගත ජලය පිළිබඳව අධ්‍යනය කිරීම.
- සහභාගීත්ව ගැමි විමසුම මඟින් වැව ආශ්‍රිත සංවේදී පරිසර පද්ධති තුළ ගස් සිටුවීම.
- 15/2012 චක්‍රලේඛය ප්‍රකාරව පුරන් වූ කුඹුරු ඉඩම් තුළ කෙටි කාලීන බෝග වගාව සහ මිරිදිය මත්ස්‍ය වගාව වැඩි වශයෙන් ප්‍රචලිත කිරීම.

අරමුණ 16 :

- "වැව් දහසයි ගම් දහසයි" වැඩසටහන මඟින් වාරි කර්මාන්තය සහ ග්‍රාමීය යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම මෙන්ම මහජන සුභ සිද්ධිය සඳහා කටයුතු කිරීම.
- "නිසල ගොවිදනට බුහුමන්" වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- මහජන දුක්ගැනවිලි යාන්ත්‍රණය මඟින් ජනාධිපති කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය හා කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් යොමුවන පැමිණිලි හා ඉල්ලීම්වලට විසඳුම් යොමු කිරීම.
- පාංශු සෞඛ්‍ය කාඩ්පත් හඳුන්වා දීම.

අරමුණ 17 :

- ජල උල්පත්, ජල මාර්ග හා කෘෂි පාර පිළිබඳ තොරතුරු ඇතුළත් ගොවිජන සේවා බල ප්‍රදේශ මට්ටමේ මුද්‍රිත ලේඛන පිළියෙළ කිරීම.
- දිවයිනේ දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි කුඹුරු ඉඩම් නාම ලේඛනය සකස් කිරීමේ කාර්යයන් සිදු කිරීම.
- එල්ලංඟා වැඩි දියුණු කිරීම.

ඇමුණුම 01 වැඩ සටහන : සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය හා පුරන් කුඹුරු සංවර්ධනය

වැය ශීර්ෂය : 281-2-2-12-2506 වෙන්කර ඇති ප්‍රතිපාදනය රු.මිලි. 15

දිස්ත්‍රික්කය	ව්‍යාපෘති ගණන		ඇස්තමේන්තු මුදල (රු.)	වෙන්කළ මුදල රු.		මූල්‍ය ප්‍රගතිය				භෞතික ප්‍රගතිය									
	එකතුව	වෙන්කළ		වෙන්කළ මුදල (සිවිල්) රු.	වෙන්කළ මුදල (පරිපාලන) රු.	එකඟ වූ මුදල(රු.)	මුළු වියදම (රු.)	අතැති බිල්පත් වටිනාකම(රු.)	මූල්‍ය ප්‍රගතිය	%	ඇස්තමේන්තු නොකළ	A	B	C	D	E	F	G	H
කොළඹ	63	63	41,455,700.00	39,185,391.91	1,482,002.87	38,262,602.98	11,859,729.76	22,197,132.69	34,056,862.45	83.74	0	0	0	0	0	3	3	4	53
ගම්පහ	74	74	44,686,076.12	44,960,046.89	1,581,478.31	41,838,738.02	11,150,989.86	19,955,476.51	31,106,466.37	66.84	0	0	0	0	0	3	8	3	60
කළුතර	44	44	42,368,100.00	39,115,213.16	2,474,821.67	34,317,991.25	14,677,704.90	22,017,120.56	36,694,825.46	88.23	0	0	0	0	0	0	0	0	44
මහනුවර	47	47	60,477,697.08	54,116,787.94	2,884,345.00	57,598,589.76	20,914,578.12	31,579,804.69	52,494,382.81	92.09	0	0	0	0	0	0	0	0	47
මාතලේ	59	59	73,066,000.00	67,815,736.40	0.00	62,022,711.50	5,980,345.79	37,457,205.68	43,437,551.47	64.05	0	0	0	0	0	3	0	0	56
නුවර එළිය	63	63	134,213,910.22	58,195,177.63	1,747,055.35	0.00	20,560,595.93	36,880,939.77	57,441,535.70	95.83	0	0	0	0	0	0	0	0	63
ගාල්ල	20	20	18,312,000.00	17,888,495.92	552,781.10	16,295,518.34	4,366,318.95	9,522,388.35	13,888,707.30	75.31	0	0	0	0	0	0	0	0	20
මාතර	43	43	35,218,000.00	34,157,668.30	1,138,256.69	32,864,697.78	6,277,444.98	20,915,139.19	27,192,584.17	77.04	0	0	0	0	0	1	0	1	41
හම්බන්තොට	58	58	194,187,217.10	186,212,917.91	3,235,207.17	84,221,522.92	38,381,052.23	135,901,652.35	174,282,704.58	91.99	0	0	0	0	0	0	0	0	58
යාපනය	15	15	30,638,000.00	26,205,909.73	0.00	26,205,909.73	10,295,228.49	15,202,661.09	25,497,889.58	97.30	0	0	0	0	0	0	0	0	15
වව්නියාව	4	4	11,068,000.01	10,070,000.00	0.00	8,446,469.49	4,757,821.05	4,626,651.62	9,384,472.67	93.19	0	0	0	0	0	0	0	0	4
මුලතිව්	12	12	41,990,000.00	38,379,676.39	1,575,220.30	33,443,964.51	13,060,093.75	13,855,717.45	26,915,811.20	67.37	0	0	0	0	0	1	2	1	8
මන්නාරම	12	12	44,532,995.00	40,512,151.95	1,161,120.66	43,329,731.33	15,381,448.06	27,528,294.09	42,909,742.15	102.97	0	0	0	0	0	0	0	0	12
කිලිනොච්චිය	20	20	61,655,000.01	47,637,080.81	1,779,767.38	45,644,721.93	16,422,500.08	12,408,280.92	28,830,781.00	58.34	0	0	0	0	2	3	3	1	11
මඩකලපුව	9	9	36,415,908.46	33,698,944.78	0.00	31,126,911.25	16,952,891.83	12,123,679.95	29,076,571.78	86.28	0	0	0	1	0	0	0	0	8
අම්පාර	16	16	40,227,543.49	38,321,205.01	1,622,411.13	38,321,204.61	23,593,171.99	8,071,284.43	31,664,456.42	79.27	0	0	0	0	0	0	1	2	13
ත්‍රි'මලය	20	20	46,392,111.11	40,994,789.92	1,198,127.12	40,490,249.92	34,342,441.98	5,791,893.51	40,134,335.49	95.12	0	0	0	0	0	1	0	1	18

දිස්ත්‍රික්කය	ව්‍යාපෘති ගණන		ඇස්තමේන්තු මුදල (රු.)	වෙන්කළ මුදල රු.		මූල්‍ය ප්‍රගතිය				භෞතික ප්‍රගතිය									
	එකතු	වෙන්කළ		වෙන්කළ මුදල (සිවිල්) රු.	වෙන්කළ මුදල (පරිපාලන) රු.	එකඟ වූ මුදල(රු.)	මුළු වියදම (රු.)	අතැති බිල්පත් වටිනාකම(රු.)	මූල්‍ය ප්‍රගතිය	%	ඇස්තමේන්තු මෙහෙයුම්	A	B	C	D	E	F	G	H
පුත්තලම	46	46	46,851,000.00	53,914,743.75	2,006,524.10	53,914,725.75	13,738,900.17	26,357,420.66	40,096,320.83	71.70	0	0	0	0	1	7	8	5	25
අ'පුරය	3	3	5,561,000.00	5,509,678.16	0.00	5,059,678.16	0.00	2,788,269.44	2,788,269.44	50.61	0	0	0	0	0	0	1	0	2
පොළොන්නරුව	17	17	28,859,000.00	24,180,000.09	0.00	28,626,058.84	11,591,796.87	10,815,914.07	22,407,710.94	92.67	0	0	0	2	0	0	0	0	15
බදුල්ල	29	29	46,079,300.00	42,968,233.28	0.00	44,685,703.06	9,389,477.74	39,931,446.50	49,320,924.24	114.78	0	0	0	0	0	0	0	0	29
මොණරාගල	10	10	13,180,000.00	11,863,899.70	1,000,000.00	12,441,453.27	3,604,451.70	7,901,455.50	11,505,907.20	89.44	0	0	0	0	0	0	0	1	9
රත්නපුරය	52	52	54,992,445.50	52,008,743.71	626,521.80	50,363,617.79	17,048,738.07	31,144,880.53	48,193,618.60	91.56	0	0	0	0	0	0	0	0	52
කෑගල්ල	66	66	48,471,500.00	50,407,437.17	0.00	46,212,069.06	25,377,406.36	18,362,707.55	43,740,113.91	86.77	0	0	0	1	0	0	0	0	65
එකතුව	**863**	**863**	**1,283,617,618.39**	**1,134,778,422.87**	**26,065,640.65**	**937,769,206.24**	**352,444,682.30**	**633,821,494.71**	**986,266,177.01**	**83.81**	**1**	**0**	**0**	**4**	**7**	**25**	**29**	**21**	**776**
ගංවතුර ආපදා			**820,000.00**	**6,000,000.00**	**0.00**	**3,455,520.22**	**1,420,970.07**	**1,765,808.41**	**3,186,778.48**	**0.00**									
ජල කළමනාකරණ ක්‍රියාකාරකම්	**Dis**			**116,950,000.00**	**0.00**		**26,396,046.30**	**8,115,435.00**	**34,511,481.30**										
	HO			**83,815,135.50**	**0.00**		**69,257,884.78**	**15,090,928.57**	**84,348,813.35**										
වෙනත්	**අභ්‍යන්තර**			**10,787,768.04**			**5,871,255.27**	**769,649.50**	**6,640,904.77**										
	බාහිර			**25,620,800.00**			**14,251,519.97**	**0.00**	**14,251,519.97**										
2017 බැඳීම්			**72,818,277.20**	**95,912,981.01**	**0.00**	**61,960,253.80**	**93,932,744.88**	**10,986,328.23**	**104,919,073.11**										
එකතුව			**1,357,255,895.59**	**1,473,865,107.42**	**26,065,640.65**	**1,003,184,980.26**	**563,575,103.57**	**670,549,644.42**	**1,234,124,747.99**	**82.27**									

*භෞතික ප්‍රගතිය = (776/863)*100 = 89.92%

ඇමුණුම 02 වැඩ සටහන : සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය හා පුරන් කුඹුරු සංවර්ධනය

වැය ශීර්ෂය : 118-2-3-40-2506 වෙන්කර ඇති ප්‍රතිපාදනය රු.මිලි. 1000

දිස්ත්‍රික්කය	ව්‍යාපෘති ගණන		ඇස්තමේන්තු මුදල (රු.)	වෙන්කළ මුදල රු.				මූල්‍ය ප්‍රගතිය			භෞතික ප්‍රගතිය								
	එකතුව	වෙන්කළ		වෙන්කළ මුදල (සිවිල්) රු.	වෙන්කළ මුදල (පරිපාලන) රු.	එකඟ වූ මුදල(රු.)	මුළු වියදම (රු.)	අතැති බිල්පත් වටිනාකම(රු.)	මූල්‍ය ප්‍රගතිය	%	ඇස්තමේන්තු නොකළ	A	B	C	D	E	F	G	H
කොළඹ	0	0	0.00	0.00	0.00	0.00	0.00	0.00	0.00	0.00	0	0	0	0	0	0	0	0	0
ගම්පහ	5	5	3,958,000.00	10,509,493.13	283,831.65	9,436,005.56	1,667,191.55	5,030,399.63	6,697,591.18	62.05	0	0	0	0	0	0	1	4	0
කළුතර	0	0	0.00	0.00	0.00	0.00	0.00	0.00	0.00	0.00	0	0	0	0	0	0	0	0	0
මහනුවර	13	13	18,520,578.39	15,763,647.34	872,474.41	17,771,067.76	5,349,702.57	10,446,494.08	15,796,196.65	94.95	0	0	0	0	0	0	0	0	13
මාතලේ	3	3	1,950,000.00	5,553,173.24	0.00	1,874,228.50	0.00	3,227,649.50	3,227,649.50	58.12	0	0	0	0	0	0	0	0	3
නුවර එළිය	21	21	20,585,441.82	19,985,866.74	599,575.97	0.00	4,887,309.49	13,844,030.83	18,731,340.32	90.99	0	0	0	0	1	0	0	1	19
ගාල්ල	0	0	0.00	0.00	0.00	0.00	0.00	0.00	0.00	0.00	0	0	0	0	0	0	0	0	0
මාතර	14	14	11,524,000.00	10,742,285.09	375,979.98	9,933,439.19	2,369,558.50	5,592,265.73	7,961,824.23	71.61	0	0	0	0	0	0	1	1	12
හම්බන්තොට	52	52	197,384,446.60	173,170,552.46	479,332.50	48,835,917.60	40,070,921.15	132,555,589.02	172,626,510.17	99.41	0	0	0	0	0	1	0	0	51
යාපනය	6	6	9,880,000.00	9,377,746.95	0.00	9,377,746.95	3,117,893.61	5,818,568.31	8,936,461.92	95.29	0	0	0	0	0	0	0	0	6
වව්නියාව	24	24	69,743,000.01	61,531,499.43	828,120.65	47,801,463.56	23,288,991.10	35,917,962.15	59,206,953.25	94.94	0	0	0	0	0	1	0	0	23
මුලතිව්	10	10	35,990,000.00	33,000,000.00	1,290,102.70	28,718,615.04	3,209,720.77	10,138,706.09	13,348,426.86	38.93	0	0	0	0	0	4	0	1	5
මන්නාරම	11	11	36,658,311.30	33,817,245.76	772,085.20	34,589,330.96	5,134,860.13	27,223,611.85	32,358,471.98	93.55	0	0	0	0	0	0	0	0	11
කිලිනොච්චිය	4	4	13,290,000.01	12,724,732.99	476,370.26	9,527,405.24	4,127,607.76	5,973,245.80	10,100,853.56	76.52	0	0	0	0	0	0	2	0	2
මඩකලපුව	12	12	42,899,003.39	39,469,138.05	0.00	34,421,992.00	15,188,799.94	23,212,489.34	38,401,289.28	97.29	0	0	0	1	0	0	0	0	11
අම්පාර	13	13	40,058,281.80	39,300,316.20	0.00	38,403,147.54	13,355,698.19	15,684,501.90	29,040,200.09	73.89	0	0	0	0	0	1	2	0	10

දිස්ත්‍රික්කය	ව්‍යාපෘති ගණන		ඇස්තමේන්තු මුදල (රු.)	වෙන්කළ මුදල රු.		මූල්‍ය ප්‍රගතිය				භෞතික ප්‍රගතිය									
	එකතුව	වෙන්කළ		වෙන්කළ මුදල (සිවිල්) රු.	වෙන්කළ මුදල (පරිපාලන) රු.	එකඟ වූ මුදල(රු.)	මුළු වියදම (රු.)	අතැති බිල්පත් වටිනාකම(රු.)	මූල්‍ය ප්‍රගතිය	%	ඇස්තමේන්තු නොකළ	A	B	C	D	E	F	G	H
කුරුණෑගල	104	103	149,984,500.10	124,417,841.46	838,130.12	107,945,037.70	10,560,575.95	112,276,757.08	122,837,333.03	98.07	0	0	1	2	5	6	3	13	73
පුත්තලම	38	38	68,655,000.00	65,124,118.47	3,152,000.93	65,124,118.47	17,842,993.95	23,330,420.52	41,173,414.47	60.30	0	0	0	0	5	4	5	1	23
අ'පුරය	65	65	235,564,000.52	181,448,422.81	6,000,000.00	127,756,771.65	59,511,229.98	93,584,711.23	153,095,941.21	81.67	0	1	0	0	2	4	12	1	45
පොළොන්නරුව	0	0	0.00	0.00	0.00	0.00	0.00	0.00	0.00	0.00	0	0	0	0	0	0	0	0	0
බදුල්ල	7	7	12,558,000.00	14,204,796.39	0.00	5,705,454.99	903,378.75	10,400,165.28	11,303,544.03	79.58	0	0	0	0	0	0	0	0	7
මොණරාගල	13	13	35,190,769.16	31,353,059.31	1,661,000.00	31,356,059.31	5,096,446.56	23,673,441.95	28,769,888.51	87.14	0	0	0	0	1	0	0	0	12
රත්නපුරය	10	10	17,173,000.00	15,506,777.39	335,730.88	14,427,719.82	3,929,687.77	11,417,083.00	15,346,770.77	96.87	0	0	0	0	0	0	0	0	10
කෑගල්ල	0	0	0.00	0.00	0.00	0.00	0.00	0.00	0.00	0.00	0	0	0	0	0	0	0	0	0
එකතුව	**441**	**440**	**1,068,959,027.94**	**936,109,830.69**	**18,815,117.81**	**682,114,639.32**	**248,494,304.85**	**577,735,674.48**	**826,229,979.33**	**82.22**	**0**	**1**	**1**	**3**	**14**	**24**	**26**	**24**	**347**
ගංවතුර ආපදා																			
ජල කළමනාකරණ ක්‍රියාකාරකම්			**Dis**																
			HO																
වෙනත්			**අභ්‍යන්තර**	**4,000,000.00**															
			බාහිර																
2017 බැඳීම්				**46,066,942.41**			**17,503,658.97**	**2,112,269.06**	**19,615,928.03**										
එකතුව			**1,068,959,027.94**	**986,176,773.10**	**18,815,117.81**	**682,114,639.32**	**265,997,963.82**	**579,847,943.54**	**845,845,907.36**	**84.5846**									

*භෞතික ප්‍රගතිය = (347/440)*100 = 78.9%

ඇමුණුම 03

කෘෂිකර්ම අමාත්‍යාංශය - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

2018.12.30 දිනට ප්‍රගතිය

වැය ශීර්ෂය : 118-2-3-37-2506 (2017 බැඳීම්)

අනු අංකය	දිස්ත්‍රික්කය	ව්‍යාපෘති ගණන	වෙන්කළ ප්‍රතිපාදන රු. මි.		මූල්‍ය තත්ත්වය					භෞතික තත්ත්වය							
					බැඳීම් සඳහා නිදහස් කළ ප්‍රතිපාදන රු.	බැඳීම් වටිනාකම රු.	බැඳීම් වියදම රු.	අකැකි බිල් වටිනාකම රු.		A	B	C	D	E	F	G	H
1	මහනුවර	3	5.00		4,828,531.52	4,828,531.52	3,460,745.06	-		0	0	0	0	0	0	0	3
2	මාතලේ	9	6.00		5,865,501.71	7,683,551.76	5,865,501.71	-		0	0	0	0	0	0	0	9
3	ගාල්ල	6	1.65		1,636,060.94	1,638,492.52	1,638,492.52	-		0	0	0	0	0	0	0	6
4	මාතර	15	13.50		13,432,633.65	13,345,661.72	10,277,977.91	2,137,669.03		0	0	0	0	0	0	0	15
5	හම්බන්තොට	12	8.50		8,465,872.57	32,897,648.17	19,109,729.29	-		0	0	0	0	0	0	0	12
6	අනුරාධපුරය	64	170.00		169,368,164.04	137,933,528.67	33,853,994.08	60,537,364.45		0	0	0	0	0	0	0	64
7	පොළොන්නරුව	22	16.00		15,666,900.97	15,666,900.97	15,666,900.97	-		0	0	0	0	0	0	0	22
9	අම්පාර	10	7.20		7,121,645.57	7,121,645.57	4,960,843.72	-		0	0	0	0	0	0	0	10
10	ත්‍රිකුණාමලය	7	5.70		5,607,250.19	7,999,850.06	5,607,250.19	-		0	0	0	0	0	0	0	7
11	වව්නියාව	4	10.70		10,618,694.04	10,618,694.04	1,520,373.26	5,275,090.64		0	0	1	0	0	0	0	3
12	මඩකලපුව	13	81.00		81,000,000.00	95,910,427.28	8,238,516.19	-		0	0	0	0	0	0	0	13
	එකතුව	**165**	**325.25**		**323,611,255.20**	**335,644,932.28**	**110,200,324.90**	**67,950,124.12**		**0**	**0**	**1**	**0**	**0**	**0**	**0**	**164**

*හම්බන්තොට දිස්ත්‍රික්කයට 2018.10.31 දින වැය ශීර්ෂ 118-2-3-40-2506 යටතේ රු.22, 026,777.92 ක මුදල නිදහස් කර ඇත.

* මඩකලපුව දිස්ත්‍රික්කයට 2018.05.09 දින වැය ශීර්ෂ 118-2-3-40-2506 යටතේ රු.මි.15 ක මුදලක් නිදහස් කර ඇත.

කෘෂිකර්ම අමාත්‍යාංශය - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

2018.12.30 දිනට ප්‍රගතිය

වැය ශීර්ෂය : 118-2-3-37-2506 (2018 නව ව්‍යාපෘති)

අනු අංකය	දිස්ත්‍රික්කය	ව්‍යාපෘති ගණන	වෙන්කළ ප්‍රතිපාදන රු. මි.	මූල්‍ය තත්ත්වය						භෞතික තත්ත්වය							
				නිදහස් කළ ප්‍රතිපාදන රු.	ඇස්තමේන්තු මුදල රු.	ගිවිසුම් මුදල රු.	වියදම රු.	අතැති බිල් වටිනාකම රු.		A	B	C	D	E	F	G	H
1	බදුල්ල	5	13.60	13,515,000.00	12,997,000.00	12,661,432.80	7,051,857.38	5,208,540.30		0	0	0	0	0	0	0	5
2	හම්බන්තොට	37	113.50	113,336,281.93	120,301,540.33	108,069,879.64	3,000,000.00	106,299,027.90		0	0	0	0	0	0	0	37
3	ගම්පහ	11	4.00	3,960,000.00	3,305,000.00	3,202,894.00	-	2,985,022.50		0	0	0	0	0	0	0	11
	එකතුව	**53**	**131.1**	**130,811,281.93**	**136,603,540.33**	**123,934,206.44**	**10,051,857.38**	**114,492,590.70**	-	**0**	**0**	**0**	**0**	**0**	**0**	**0**	**53**

ඇමුණුම 04 "වැව් දහසයි ගම් දහසයි" වැඩ සටහන - 2018 තෝරාගත් ව්‍යාපෘති සාරාංශය

දිස්ත්‍රික්කය	දැනට ක්‍රියාත්මක කර්මාන්ත ගණන	ප්‍රතිපාදන නිදහස් කර ඇති කර්මාන්ත ගණන	ප්‍රතිපාදන නිදහස් කළ යුතු කර්මාන්ත ගණන
කොළඹ	7	7	0
ගම්පහ	20	20	0
කළුතර	5	2	3
මහනුවර	12	12	0
මාතලේ	22	19	3
නුවරඑළිය	4	4	0
ගාල්ල	15	15	0
මාතර	20	18	2
හම්බන්තොට	67	63	4
යාපනය	5	5	0
වව්නියාව	5	5	0
මුලතිව්	4	4	0
මන්නාරම	6	6	0
කිලිනොච්චිය	10	10	0
මඩකලපුව	11	10	1
අම්පාර	5	5	0
ත්‍රිකුණාමලය	5	5	0
කුරුණෑගල	24	14	10
පුත්තලම	9	9	0
අනුරාධපුරය	37	32	5
පොළොන්නරුව	4	4	0
බදුල්ල	31	31	0
මොණරාගල	7	7	0
රත්නපුරය	16	16	0
කෑගල්ල	10	6	4
එකතුව	**361**	**329**	**32**

මේ දක්වා වෙන් කර ඇති මුළු ප්‍රතිපාදන ප්‍රමාණය = රු.මි. 755,671,529.13

ඇමුණුම 05 රොන්මඩ ඉවත් කර වැව් ගැඹුරු කිරීමේ වැඩසටහන- 2018
පුත්තලම දිස්ත්‍රික්කය

අනු අංකය	වාරි කර්මාන්තයේ නම	ගො.සේ.ම.	ඇස්තමේන්තු මුදල රු.	නිමි වැඩ වටිනාකම රු.	භෞතික ප්‍රගතිය
01	වඩත්ත මහ වැව	ආනමඩුව	1,000,000.00	939,279.60	100%
02	මහවිකිරියාව වැව	ආනමඩුව	1,600,000.00	1,539,279.60	100%
03	අලුත්ගම වැව	ආනමඩුව	1,200,000.00	1,139,279.60	100%
04	සංඝට්ටිකුලම වැව	ආනමඩුව	1,685,000.00	1,624,268.60	100%
05	සන්නස්සාගාර වැව	කුඩාවැව	1,530,000.00	1,225,000.00	100%

ඇමුණුම 06 වැඩ සටහන : ගොවිජන සේවා මධ්‍යස්ථාන අලුත්වැඩියාව

වැය ශීර්ෂය : 281-2-2-0-2001

අනු අංකය	දිස්ත්‍රික්කය		ව්‍යාපෘතියේ නම	ගොවිජන සේවා මධ්‍යස්ථානයේ නම	ඇස්තමේන්තු මුදල (රු.)	වෙන්කළ මුදල (රු.)	මූල්‍ය ප්‍රගතිය				භෞතික ප්‍රගතිය								
							මුළු වියදම (රු.)	අතැති බිල්පත් වටිනාකම(රු.)	එකතුව	%	ඇස්තමේන්තු ගොඩකළ	A	B	C	D	E	F	G	H
1	කොළඹ	2	කොලොන්නාව ගො.සේ.ම අලුත්වැඩියාව	කොලොන්නාව	1,716,500.00	1,658,276.30	586,535.33	1,067,131.98	1,653,667.31	99.72206	0	0	0	0	0	0	0	0	1
2		2	පාදුක්ක ගො.සේ.ම අලුත්වැඩියාව	පාදුක්ක	1,196,000.00	1,155,005.50	200,000.00	951,699.24	1,151,699.24	99.71375	0	0	0	0	0	0	0	0	1
3		2	කහතුඩුව ගො.සේ.ම අලුත්වැඩියාව	කහතුඩුව	322,500.00	311,583.49	62,300.00	267,812.33	330,112.33	105.9467	0	0	0	0	0	0	0	0	1
4		2	කැස්බෑව ගො.සේ.ම අලුත්වැඩියාව	කැස්බෑව	800,000.00	772,870.60	154,500.00	585,706.68	740,206.68	95.77369	0	0	0	0	0	0	0	0	1
					4,035,000.00	3,897,735.89	1,003,335.33	2,872,350.23	3,875,685.56	99.43428	0	0	0	0	0	0	0	0	4
5	ගම්පහ	2	වල්පිට ගො.සේ.ම අලුත්වැඩියාව	වල්පිට	2,000,000.00	1,934,275.61	386,855.12	1,547,420.49	1,934,275.61	100	0	0	0	0	0	0	0	0	1
6		2	මීරිගම ගො.සේ.ම අලුත්වැඩියාව	මීරිගම	2,000,000.00	1,941,330.99	388,266.20	1,525,325.00	1,913,591.20	98.57109	0	0	0	0	0	0	0	0	1
7		2	දි.කාර්යාලයේ අලුත්වැඩියාවන් සිදු කිරීම		-	3,195,428.40	296,587.00	2,890,891.40	3,187,478.40	99.75121	0	0	0	0	0	0	0	0	1
8		2	පස්යාල ගො.සේ.ම අලුත්වැඩියාව	පස්යාල	770,000.00	747,104.13	-	747,104.13	747,104.13	100	0	0	0	0	0	0	0	0	1
					4,770,000.00	7,818,139.13	1,071,708.32	6,710,741.02	7,782,449.34	99.5435	0	0	0	0	0	0	0	0	4
9	කළුතර	2	පාදාගොඩ ගො.සේ.ම අලුත්වැඩියාව	පාදාගොඩ	4,716,000.00	4,100,593.86	-	4,273,970.51	4,273,970.51	104.2281	0	0	0	0	0	0	0	1	0
10		2	නාගොඩ ගො.සේ.ම අලුත්වැඩියාව	නාගොඩ	3,429,000.00	2,982,539.08	-	2,982,539.08	2,982,539.08	100	0	0	0	0	0	0	0	1	0
					8,145,000.00	7,083,132.94	-	7,256,509.59	7,256,509.59	102.4477	0	0	0	0	0	0	0	2	0
11	මහනුවර	2	2017 වර්ෂයේ වැලිවිට, බෝවල, ගලහ මධ්‍යස්ථාන අලුත් වැඩියාවට අදාළ බැඳීම්	වැලිවිට, බෝවල, ගලහ	6,998,523.92	3,233,263.14	5,627,696.73	-	5,627,696.73	174.0563	0	0	0	0	0	0	0	1	

අනු අංකය	දිස්ත්‍රික්කය		ව්‍යාපෘතියේ නම	ග්‍රාමීය සේවා මධ්‍යස්ථානයේ නම	ඇස්තමේන්තු මුදල (රු.)	වෙන්කළ මුදල (රු.)	මූල්‍ය ප්‍රගතිය				භෞතික ප්‍රගතිය								
							මුළු වියදම (රු.)	අතැති බිල්පත් වටිනාකම(රු.)	එකතුව	%	ඇස්තමේන්තු කොන්ත්‍රාත්	A	B	C	D	E	F	G	H
					7,798,090.85	4,032,830.07	6,427,263.66	-	6,427,263.66	159.3735	0	0	0	0	0	0	0	1	1
13	මාතලේ	2	පලාපත්වල ගො.සේ.ම අලුත්වැඩියාව	පලාපත්වල	1,100,000.00	1,048,388.71	200,000.00	812,322.52	1,012,322.52	96.55985	0	0	0	0	0	0	0	0	1
14		2	වාලෙවෙල ගො.සේ.ම අලුත්වැඩියාව	වාලෙවෙල	1,100,000.00	1,045,647.01	-	1,040,175.93	1,040,175.93	99.47678	0	0	0	0	0	0	0	0	1
15		2	හෙට්ටිපොළ ගො.සේ.ම අලුත්වැඩියාව වෙනුවට අලුගොල්ල ගො.සේ.ම	අලුගොල්ල	1,180,000.00	1,141,958.43	200,000.00	836,873.96	1,036,873.96	90.79787	0	0	0	0	0	0	0	0	1
					3,380,000.00	3,235,994.15	400,000.00	2,689,372.41	3,089,372.41	95.46904	0	0	0	0	0	0	0	0	3
16	නුවර එළිය	2	මුංවත්ත ගො.සේ.ම අලුත්වැඩියාව	මුංවත්ත	781,960.06	759,184.52	246,072.71	513,111.81	759,184.52	100	0	0	0	0	0	0	0	0	1
17		2	නුවරඑළිය ගො.සේ.ම අලුත්වැඩියාව	නුවරඑළිය	700,304.63	679,907.41	679,907.41	-	679,907.41	100	0	0	0	0	0	0	0	0	1
18		2	බුළුගහපිටිය ගො.සේ.ම අලුත්වැඩියාව	බුළුගහපිටිය	517,269.88	502,203.77	100,000.00	402,203.77	502,203.77	100	0	0	0	0	0	0	0	0	1
					1,999,534.57	1,941,295.70	1,025,980.12	915,315.58	1,941,295.70	100	0	0	0	0	0	0	0	0	3
19	ගාල්ල	2	අලුත්වල ගො.සේ.ම අලුත්වැඩියාව	අලුත්වල	4,497,038.74	4,161,650.70	-	2,016,376.13	2,016,376.13	48.45135	0	0	0	0	0	0	1	0	0
20		2	පිටිගල ගො.සේ.ම අලුත්වැඩියාව	පිටිගල	3,402,398.80	3,001,126.27	-	1,367,637.72	1,367,637.72	45.57082	0	0	0	0	0	0	1	0	0
					7,899,437.54	7,162,776.97	-	3,384,013.85	3,384,013.85	47.24444	0	0	0	0	0	0	2	0	0
21	මාතර	2	දන්දෙනිය ගො.සේ.ම අලුත්වැඩියාව	දන්දෙනිය	1,759,000.00	1,483,300.00	506,789.75	951,361.49	1,458,151.24	98.30454	0	0	0	0	0	0	0	0	1
22		2	දෙයියන්දර ගො.සේ.ම අලුත්වැඩියා (බැඳීම්)	දෙයියන්දර	3,000,000.00	2,284,974.90	2,206,932.68	-	2,206,932.68	96.58455	0	0	0	0	0	0	0	0	1
23		2	කැකණදුර ගො.සේ.ම අලුත්වැඩියා (බැඳීම්)	කැකණදුර	1,380,000.00	1,200,886.00	1,139,450.00	-	1,139,450.00	94.88411	0	0	0	0	0	0	0	0	1
